# ඉතිහාසය
# මූලික පිරිවෙණ

# ගුරු මාර්ගෝපදේශය

# 3 ශ්‍රේණිය

(2019 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ.)


පිරිවෙන් අධ්‍යාපන ශාඛාව
අධ්‍යාපන අමාත්‍යාංශය
ශ්‍රී ලංකාව

පිරිවෙන් අධ්‍යාපන ඒකකය
සිංහල භාෂා දෙපාර්තමේන්තුව
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය: www.nie.lk
විද්‍යුත් ලිපිනය: info@nie.lk

වෙබ් අඩවිය : www.pirivena.sch.lk
විද්‍යුත් ලිපිනය: Pirivena@moegov.lk

මුද්‍රණය හා බෙදා හැරීම - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

**ඉතිහාසය**

මූලික පිරිවෙණ

ගුරු මාර්ගෝපදේශය

3 ශ්‍රේණිය

ප්‍රථම මුද්‍රණය : 2019

ISBN 978-955-25-0571-3

පිරිවෙන් ශාඛාව

අධ්‍යාපන අමාත්‍යාංශය

ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය: www.pirivena.lk

විද්‍යුත් ලිපිනය: Pirivena@moegov.lk

පිරිවෙන් අධ්‍යාපන ඒකකය
සිංහල භාෂා දෙපාර්තමේන්තුව
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය: www.nie.lk

විද්‍යුත් ලිපිනය: info@nie.lk

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින්
හෝමාගම, කටුවාන පාර, කාර්මික ජනපදය, 145 දරන ස්ථානයෙහි පිහිටි
සවින්ද ග්‍රැෆික් සිස්ටම්ස් (පුද්ගලික) සමාගමෙහි
මුද්‍රණය කරවා ප්‍රකාශයට පත් කරන ලදී.

## අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ පණිවිඩය

ශ්‍රී ලාංකීය බෞද්ධ ජාතික අනන්‍යතාවයේ සංකේතය භික්ෂූන් වහන්සේය. භික්ෂූන් වහන්සේගේ අධ්‍යාපනය කේන්ද්‍ර කර ගනිමින් සමස්ත ජාතියටම අධ්‍යාපනික මංපෙත විවර කර දුන් ජාතික පිරිවෙන් අධ්‍යාපනයට දුරාතීතයක් ඇත. අනුරාධපුර යුගයේ සිටම භික්ෂූන් වහන්සේගේ නායකත්වය යටතේ පිරිවෙන් අධ්‍යාපනය කෙතරම් සුහුඹුල්ව වැඩී ගියාද කිවහොත් විදේශිකයන් පවා මෙරටට පැමිණ අධ්‍යාපනය හදාළ බව පුරාවෘත්තවලින් පැහැදිලි වේ.

වර්තමානය වනවිට පාසැල් අධ්‍යාපනය හා සමාන පහසුකම් ලබමින් විහාරස්ථාන කේන්ද්‍ර කොටගත් පිරිවෙන් ආයතන අධ්‍යාපන අමාත්‍යාංශයේ නිගමනය යටතේ සිය අතීත උරුමයන් එලෙසින් ම ආරක්ෂා කරගනිමින් පවත්වා ගැනීමට ලැබීම අපගේ සතුටට කරුණකි.

පිරිවෙන් අධ්‍යාපනයට අවශ්‍ය පහසුකම් ලබා දෙමින් කාලීන අවශ්‍යතා සපුරා ගැනීමට සුදුසු වියත් යතිවර පරපුරක් හා උගත් විනයවත් ගිහි සමාජයක් බිහිකරලීම අපගේ පරම අභිලාෂය විය යුතුය. එයට ශක්තියක් වෙමින් 2018 නව විෂයමාලා සංස්කරණය යටතේ ඔබ අතට පත් කෙරෙන මෙම ගුරුමාර්ගෝපදේශය නව ඉගෙනුම් ක්‍රම ඔස්සේ ශිෂ්‍යයාට අවශ්‍ය දැනුම ලබාදීම සඳහා පරිවෙණාචාර්යවරයාට ආධාරකයක් වනු ඇතැයි අපගේ විශ්වාසයයි. මෙය මැනවින් පරිශීලනය කර නිවැරදි අවබෝධයක් ශිෂ්‍ය ප්‍රජාවට ලබාදීම පරිවෙණාචාර්යවරුන් වන ඔබගේ වගකීමක් සේ දකිමි.

මෙම භාරදූර කාර්ය සම්පූර්ණ කිරීම සඳහා ඇපකැපවූ පිරිවෙන් අධ්‍යාපන ශාඛාවට, ජාතික අධ්‍යාපන ආයතනයට හා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවට මාගේ හෘදයාංගම ස්තුතිය පළකරමි.

එන්.එච්.එම්. චිත්‍රානන්ද
අධ්‍යාපන ලේකම්

# අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය

අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් ශාඛාව මගින් සම්පාදනය කර තිබූ විෂය නිර්දේශයේ අන්තර්ගතය සංශෝධනය කිරීමෙන් පසු අදාළ නිපුණතා සාක්ෂාත් වන පරිදි පාඩම් සැලසුම් කිරීම සඳහා ජාතික අධ්‍යාපන ආයතනයේ අභිනවයෙන් පිහිටුවන ලද පිරිවෙන් අධ්‍යාපන ඒකකය මගින් මෙම ගුරු මාර්ගෝපදේශය සම්පාදනය කර ඇත.

පාසල් පද්ධතියේ ක්‍රියාත්මක වන පරිදි ගුරු මාර්ගෝපදේශ, පිරිවෙන් ගුරුවරුන්ට ද ලබා දී ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය උසස් මට්ටමකට ගෙන ඒම සඳහා සැලසුම් කිරීම අධ්‍යාපන අමාත්‍යාංශය ගත් යහපත් තීරණයකි. ඒ වෙනුවෙන් අපගේ ස්තුතිය හිමි වන අතර ගුරු මාර්ගෝපදේශ සම්පාදනය කිරීම ජාතික අධ්‍යාපන ආයතනයට පැවරීමෙන් එම තීරණය යථාර්ථයක් බවට පත් විය.

සාම්ප්‍රදායික ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට පමණක් සීමා නො වී නව ඉගෙනුම් ඉගැන්වීම් ප්‍රවේශ පිළිබඳව යොමු වීමට මෙම ගුරු මාර්ගෝපදේශයේ අන්තර්ගත උපදෙස් පිරිවෙන් ගුරුවරුන්ට උපකාර වනු ඇත. ඒ අනුව නව ප්‍රවේශ හා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද පිළිබඳව ගවේෂණය කර තම පාඩම් සැලසුම් කර ගැනීමෙන් ඉහළ ගුණාත්මක ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියක නිරත වීමට හැකියාව ලැබේ.

මෙහි අන්තර්ගතය ප්‍රධාන වශයෙන් කොටස් දෙකකින් සමන්විත වේ. එනම් විෂය නිර්දේශය සහ එහි නිපුණතා හා නිපුණතා මට්ටම් සාක්ෂාත් කර ගැනීමට උපකාර වන ක්‍රියාකාරකම් සංග්‍රහය යි. එක් එක් නිපුණතාවට අදාළ නිපුණතා මට්ටම් ආවරණය වන ආකාරයට ඉගෙනුම් පල සාක්ෂාත් වන පරිදි ඒ සඳහා වෙන් කර ඇති කාලය ද සැලකිල්ලට ගෙන ක්‍රියාකාරකම් සමූහය නිර්මාණය කර ඇත. ක්‍රියාකාරකම් පදනම් කර ගෙන නව ක්‍රියාකාරකම් නිර්මාණය කර ගැනීමට ද මෙමගින් අවකාශය ලැබෙනු ඇත.

ඉතා කෙටි කාලයකින් මූලික පිරිවෙන් විෂයමාලාවෙහි සියලු විෂයයන් සඳහා ගුරු මාර්ගෝපදේශ සකස් කිරීමට ශාස්ත්‍රීය නායකත්වය දුන් ජාතික අධ්‍යාපන ආයතනයේ පිරිවෙන් අධ්‍යාපන ඒකකයටත් ජාතික අධ්‍යාපන ආයතනයේ විෂය විශේෂඥයන්ට මෙන් ම බාහිර සම්පත් දායකයන්ටත් මාගේ ස්තුතිය පිරිනැමේ.

ආචාර්ය සුනිල් ජයන්ත නවරත්න
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය.

## අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්ගේ පණිවිඩය

පිරිවෙන් ශ්‍රී ලාංකීය අධ්‍යාපනයේ කේන්ද්‍රස්ථානයකි. මිහිඳු මහ රහතන් වහන්සේ ශ්‍රී ලංකා ධරණීතලය තුළ ස්ථාපිත කළ උතුම් සම්බුද්ධ ශාසනය යුග යුග පසුකර නොයෙක් බාධා හමුවේ ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාව වෙත අවිච්ඡින්න ව දායාද කරමින් ධර්මඥානයෙන් පිරිපුන් යතිවර පරපුරක් හා දැ හිතකාමී ජන සමාජයක් පිරිවෙන මගින් නිර්මාණය කිරීමට භික්ෂූන් වහන්සේලා සමත් වූහ.

අතීතයේ පටන් ම කාලීන අවශ්‍යතා සපුරාලමින් හා සාම්ප්‍රදායික අනන්‍යතාව ආරක්ෂාකර ගනිමින් ගිහි පැවිදි සමාජයේ අභිවෘද්ධිය වෙනුවෙන් පිරිවෙන මගින් සිදු වූ මෙහෙය අනුපමේය ය. සම්භාව්‍ය අධ්‍යාපනය ආරක්ෂාකර ගනිමින් පාරම්පරික ශාසනික ක්‍රමවේද හා නූතන අධ්‍යාපන රටා මනාව සම්මිශ්‍රණය කර වර්තමානයේ පිරිවෙන් අධ්‍යාපනය ලබන ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාගේ සහ ගිහි සිසුන්ගේ අවශ්‍යතා සැලකිල්ලට ගෙන අද වන විට නිපුණතා පාදකව නව විෂයමාලාවක් ඔස්සේ අවශ්‍ය දැනුම ලබා දීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් අධ්‍යාපන ශාඛාව දරන ප්‍රයත්නය අතිශයින් අගය කරමු. එයට ශක්තියක් වෙමින් සියලු ම විෂය සඳහා නව විෂය නිර්දේශ මුද්‍රණය කරවීම හා මූලික පිරිවෙන සඳහා පෙළපොත් 54ක් වාර්ෂික ව මුද්‍රණය කර ලබා දීම මගින් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව ද අවශ්‍ය පහසුකම් සලසා ඇත.

නිපුණතා පාදකව නව විෂය මාලාව සඳහා ගුරු මාර්ගෝපදේශ සැකසීම පිරිවෙන් අධ්‍යාපනය වෙනුවෙන් පළමු වරට සිදුවන උසස් ක්‍රියාදාමයකි. ජාතික අධ්‍යාපන ආයතනය හා පිරිවෙන් අධ්‍යාපන ශාඛාව එක්ව සම්පාදනය කළ මෙම ගුරු මාර්ගෝපදේශ, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව මගින් මුද්‍රණය කර ඔබ අතට පත් කිරීමට ලැබීම සතුටට කරුණකි. මෙම කාර්යය සඳහා දායකත්වය සැපයූ උපදේශක, සංස්කාරක, ලේඛක මණ්ඩල සාමාජික සියලු දෙනාට ද අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට ද මගේ ස්තුතිය පිරිනමමි. පිරිවෙන් අධ්‍යාපනයේ ඉදිරි දියුණුව ද පතමි.

**ඩබ්ලිව්. එම්. ජයන්ත වික්‍රමනායක**
අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
ඉසුරුපාය
බත්තරමුල්ල

2019.04.10

# නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය

නූතන ලාංකේය පිරිවෙන් ක්ෂේත්‍රයෙහි මෙම ගුරු මාර්ගෝපදේශ බිහිවීම ඓතිහාසික අවස්ථාවක් බව මම පළමු ව සඳහන් කරමි. ජාතික අධ්‍යාපන ආයතනයත්, අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් අංශයත් සුසංයෝග වී මෙම ගුරු මාර්ගෝපදේශ සම්පාදනය වීම ඊට හේතුව යි.

ශ්‍රී ලංකාවේ සාමාන්‍ය පාසල් අධ්‍යාපනය සඳහා විෂය නිර්දේශ, ගුරු මාර්ගෝපදේශ, ගුරු පුහුණු, අධ්‍යාපන කළමනාකරුවන් පුහුණු කිරීම සහ අධ්‍යාපන පර්යේෂණ සිදු කිරීමේ ව්‍යවස්ථාපිත බලය ඇති එක ම ආයතනය 1985 අංක 28 දරන පනතින් ස්ථාපිත වූ ජාතික අධ්‍යාපන ආයතනය යි. එහෙත් මේ වන විට වසර 2325ක ඉතිහාසයක් ඇති මහා විහාරයීය අධ්‍යාපන සම්ප්‍රදායේ කේන්ද්‍රස්ථානය වූ 'පිරිවෙණ'ට ව්‍යවහාර වර්ෂ 2017 තෙක් ජාතික අධ්‍යාපන ආයතනයේ ඍජු දායකත්වයක් නො තිබිණ.

පිරිවෙන් අංශයක් හෝ දෙපාර්තමේන්තුවක් නොමැති ජාතික අධ්‍යාපන ආයතනයක් තිබිය හැකි දැයි නිතර අපට පෙළන ලද කරුණකි. මෙයට විසඳුමක් ලබා ගැනීම සඳහා අපට දායක වීමට හැකි වූයේ වර්තමාන අතිගරු ජනාධිපතිතුමන්, ගරු අධ්‍යාපන ඇමතිතුමන්, 2018 වර්ෂයේ කටයුතු කළ අධ්‍යාපන ලේකම්තුමන්, එවකට පිරිවෙන් අධ්‍යක්ෂ ස්වාමීන්ද්‍රයාණන්, ජාතික අධ්‍යාපන ආයතනයේ වර්තමාන අධ්‍යක්ෂ ජනරාල්තුමිය සහ ජාතික අධ්‍යාපන ආයතනයේ ආයතන සභාවේ පූර්ණ අනුග්‍රහය හා ආශිර්වාදය ලැබීමෙනි.

ඒ අනුව අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2017 ජනවාරි මස 31 දින රැස් වූ ජාතික බෞද්ධ බුද්ධි බල මණ්ඩලයේ තීරණය පරිදි සහ ජාතික අධ්‍යාපන ආයතනයේ ආයතන සභාවේ 2017.03.16 දිනැති 412.5.12 IM No.5157 තීරණය පරිදි ජාතික අධ්‍යාපන ආයතනයේ භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයේ සිංහල භාෂා දෙපාර්තමේන්තුවට අයත් ව පිරිවෙන් අධ්‍යාපන ඒකකය ස්ථාපිත විය.

එහි ප්‍රතිඵලයක් ලෙස පිරිවෙන් ගුරු මාර්ගෝපදේශ, පිරිවෙන් ගුරු පුහුණුව සිදු කිරීමේ කාර්යයන්ට දායක වීමට ජාතික අධ්‍යාපන ආයතනයට ඍජුව හැකි විය. ජාතික අධ්‍යාපන ආයතනය සතු ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද පිළිබඳ පළපුරුද්ද, පර්යේෂණ, අත්දැකීම්, තාක්ෂණික ප්‍රාගුණ්‍යය සුසංයෝග කර ගනිමින් පිරිවෙන් පන්ති කාමරයෙහි විධිමත් බවක් ඇති කිරීමට ලද මෙම අවස්ථාව මහාර්ඝ භාග්‍යයකි. අප්‍රමාණ සතුටකි.

පිරිවෙන්හි ගුරු භවතුන් මෙම ගුරු මාර්ගෝපදේශ පරිශීලනයෙන් පිරිවෙන් පන්ති කාමරය ශිෂ්‍ය මිත්‍රභාවයෙන් ප්‍රබෝධාත්මක ව ඉහළ සාධනයකට පිරිවෙන් අධ්‍යාපනය නංවාලීමට කටයුතු කරන ලෙස ගෞරවයෙන් ආයාචනා කරමි. මෙම ගුරු මාර්ගෝපදේශ සම්පාදනයට දායක වූ ජාතික අධ්‍යාපන ආයතනයේ සිංහල භාෂා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ, පිරිවෙන් අධ්‍යාපන ඒකක ප්‍රධාන සහ සියලු විද්වතුනට ගෞරවය පිරිනමමි.

ආචාර්ය පූජ්‍ය මාඹුල්ගොඩ සුමනරතන හිමි
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය.

## පිරිවෙන් අධ්‍යක්ෂගේ පණිවිඩය

පෙරදිග ලෝකයේ පැවති ඉතා ප්‍රශස්ත අධ්‍යාපන ආයතන අතර පිරිවෙනට හිමිවන්නේ සුවිශේෂ ස්ථානයකි. මෙම අධ්‍යාපන ආයතන ක්‍රමයෙන් වැඩී ගොස් ජාත්‍යන්තර විශ්වවිද්‍යාල මට්ටමට සංවර්ධනය වූ බව නොරහසකි. ශ්‍රී ලාංකීය භික්ෂු අනන්‍යතාව හා දේශීය ජන විඥානය පුබුදුවාලීමට එදා සිට අද දක්වාම පිරිවෙන් අධ්‍යාපනය සමත් වී ඇත. අෂ්ට මූලායතන කේන්ද්‍ර කරගත් අතීත පිරිවෙන් අධ්‍යාපනය ආධ්‍යාත්මික ගුණයෙන් මෙන්ම ධර්මඥානයෙන්ද හෙබි පරපුරක් මෙරටට දායාද කළේ ය.

නූතන පිරිවෙන් අධ්‍යාපනය ජාතික අධ්‍යාපන ප්‍රවාහයේ තවත් එක් සුවිශේෂී පැතිකඩකි. පර්යාප්ති, ප්‍රතිපත්ති, ප්‍රතිවේධ යන ත්‍රිවිධශාසනෝන්නතිය උදෙසා අවශ්‍ය භික්ෂූන් වහන්සේ ජාතියට දායාද කිරීම හා උගත් වියත් බුද්ධිමත් පිරිසක් බිහිකිරීම පිරිවෙන් අධ්‍යාපනයේ ප්‍රමුඛ අභිලාෂය යි.

සෞභාග්‍යමත් දේශයක් කරා යන මේ ගමනේදී ආකල්ප සම්පත්තියෙන් යුතු ප්‍රජාවක් නිර්මාණය කිරීමට මග පෙන්වීම භික්ෂූන් වහන්සේගේ ප්‍රබල වගකීමකි. ඒ සඳහා උන්වහන්සේලා අවශ්‍ය දැනුම් සම්භාරයක් පෝෂිත කරවීමට පිරිවෙන පෙරටත් වඩා ශක්තිමත්ව ක්‍රියාත්මක විය යුතුය.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය යාවත්කාලීන කරමින් නව විෂය නිර්දේශයන් යටතේ ඉදිරි පියවර රාශියක් තැබීමට අපට හැකිවීම සතුටට හේතුවකි.  විවිධ උපාය මාර්ගයන් ඔස්සේ ඉදිරි අනාගත පිරිවෙන් අධ්‍යාපනය ශක්තිමත් කිරීමට අප ගන්නා උත්සාහයේදී ඔබ අතට පත් කෙරෙන නව ගුරු මාර්ගෝපදේශය ශිෂ්‍ය සාධනය ඉහළ මට්ටමකට ඔසවා තැබීමට ප්‍රබල ගුණාත්මක යෙදවුමක් වනු ඇතැයි මාගේ විශ්වාසයයි. සාම්ප්‍රදායික ඉගෙනුම් ක්‍රම මෙන් ම නූතන ඉගෙනුම් ක්‍රමවේද පිළිබඳව ද පරිවේණාචාර්යවරුන්ගේ දැනුම යාවත්කාලීන කරගනිමින් ක්‍රියාකිරීම ඔබ සතු වගකීමක් බව ද අවධාරණය කරමි. ගුරු මාර්ගෝපදේශය මැනවින් අධ්‍යයනය කර ඔබගේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට මෙය මැනවින් භාවිත කර ගන්නා ලෙසද සිහිපත් කරමි.

මෙවන් ගුරුමාර්ගෝපදේශයක් සකස්කර ඔබ අතට පත්කිරීම ඉතා භාරධූර ක්‍රියාවලියකි. මේ සඳහා මූලිකව ක්‍රියාකළ පිරිවෙන් අධ්‍යාපන ශාඛාවේ විෂය සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්ටත්, ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්තුමියටත්, නියෝජ්‍ය අධ්‍යක්‍ෂ හිමියන්ගේ, පිරිවෙන් ශාඛා ප්‍රධානී හිමියන් හා අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්තුමන් ප්‍රධාන කාර්ය මණ්ඩලයට ද පිරිවෙන් අධ්‍යාපන ශාඛාව වෙනුවෙන් ගෞරවනීය ප්‍රසංසාව පිරිනමමින් ආශිර්වාදය මෙසේ පළකරමි.

පූජ්‍ය වටිනාපහ සෝමානන්ද හිමි<br>
පිරිවෙන් අධ්‍යාපන අධ්‍යක්ෂ<br>
පිරිවෙන් අධ්‍යාපන ශාඛාව<br>
අධ්‍යාපන අමාත්‍යාංශය

## ගුරු මාර්ගෝපදේශ සම්පාදක මණ්ඩලය

| | | |
|---|---|---|
| **උපදේශකත්වය හා අනුමැතිය** | : | ජාතික අධ්‍යාපන ආයතනය සහ පිරිවෙන් අධ්‍යාපන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය |
| | | අධ්‍යක්ෂ පූජ්‍ය වටිනාපහ සෝමානන්ද හිමි<br>පිරිවෙන් අධ්‍යාපන ශාඛාව<br>අධ්‍යාපන අමාත්‍යාංශය |
| **මෙහෙයවීම** | : | ආචාර්ය සුනිල් ජයන්ත නවරත්න<br>අධ්‍යක්ෂ ජනරාල්<br>ජාතික අධ්‍යාපන ආයතනය |
| **අධීක්ෂණය** | : | ආචාර්ය පූජ්‍ය මාඹුල්ගොඩ සුමනරතන හිමි<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්<br>භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය<br>ජාතික අධ්‍යාපන ආයතනය |
| | | එම්. ආර්. ඩබ්ලිව්. මද්දුම<br>අධ්‍යක්ෂ<br>සිංහල භාෂා දෙපාර්තමේන්තුව<br>ජාතික අධ්‍යාපන ආයතනය |
| **සම්බන්ධීකරණය** | : | පූජ්‍ය කුකුරම්පොල ඤාණවිමල හිමි<br>ජ්‍යෝෂ්ඨ කථිකාචාර්ය<br>ඒකක ප්‍රධාන<br>පිරිවෙන් අධ්‍යාපන ඒකකය<br>ජාතික අධ්‍යාපන ආයතනය |
| | | පූජ්‍ය කෙහෙල්වල විපස්සි හිමි<br>සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ<br>පිරිවෙන් අධ්‍යාපන ශාඛාව<br>අධ්‍යාපන අමාත්‍යාංශය |
| **විෂය නියාමනය** | : | ගමගේ වික්‍රම් සම්පත්<br>සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (වෛකල්පික)<br>පිරිවෙන් අධ්‍යාපන ශාඛාව<br>අධ්‍යාපන අමාත්‍යාංශය |
| **විෂය විශේෂඥ උපදේශනය** | : | ඇස්.බී.හෙට්ටිආරච්චි<br>සම්මානිත මහාචාර්ය<br>ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය |

**ලේඛක මණ්ඩලය :** ඩී. එච්. චන්දිමා නිෂානි ධර්මපාල
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය

ඩබ්ලිව්. සමන්ති ශිරෝමාලා ගුණවර්ධන
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය

ගමගේ විකුම් සම්පත්
සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (වෛකල්පික)
පිරිවෙන් අධ්‍යාපන ශාඛාව
අධ්‍යාපන අමාත්‍යාංශය

එම්. එම්. එස්. කේ. හේරත්
පරිවේණාචාර්ය
විද්‍යාවංශ මහ පිරිවෙණ, බණ්ඩාරවත්ත,
ගම්පහ

පූජ්‍ය ගම්මුල්ලේ සුමංගල හිමි
පරිවේණාචාර්ය
මා/ශ්‍රී ධර්මරාජ මහ පිරිවෙණ
විහාර පාර, මාතලේ

ඒ. ඩී. එස්. අමරසිංහ
ගුරු සේවය
බප/මීග ශාන්ත මරියා මහා විද්‍යාලය
උස් වැටකෙයියාව, ජා ඇල

දිනේෂ් පුෂ්පකුමාර එදිරිමාන්න
පරිවේණාචාර්ය
මාර/ ශ්‍රී මේධංකර පිරිවෙණ, ඌරු බොක්ක.

**සිතියම් නිර්මාණය :** රෙස්ටා ප්‍රනාන්දු
පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය

**භාෂා සංස්කරණය :** ජේ. මදාරා උත්පලා ජයරත්න
සහකාර කථිකාචාර්ය
සිංහල භාෂා දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය

**සෝදුපත් කියවීම :** ඩී. එච්. චන්දිමා නිෂානි ධර්මපාල
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය

ඩබ්. සමන්ති ශිරෝමාලා ගුණවර්ධන
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
ජාතික අධ්‍යාපන ආයතනය

ගමගේ වික්‍රම් සම්පත්
සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (වෛකල්පික)
පිරිවෙන් අධ්‍යාපන ශාඛාව
අධ්‍යාපන අමාත්‍යාංශය

**පරිගණක වදන් :** ඩබ්ලිව්. ඉසුරි මධුෂානි පෙරේරා
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

# පටුන


- අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ පණිවිඩය iii
- අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය iv
- අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්ගේ පණිවිඩය v
- නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය vi
- පිරිවෙන් අධ්‍යක්ෂගේ පණිවිඩය vii
- ගුරු මාර්ගෝපදේශ සම්පාදක මණ්ඩලය viii - x
- පටුන xi
- විෂය නිර්දේශය හැඳින්වීම xii
- පිරිවෙන් අධ්‍යාපනයේ පරමාර්ථ හා අරමුණු xiii
- ජාතික පොදු අරමුණු xiv
- මූලික නිපුණතා xv - xvi
- ඉතිහාස විෂය අධ්‍යයනයේ අරමුණ xvii
- විෂය නිර්දේශය xviii - xxix
- ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස් xxx
- ඉතිහාසය හැඳින්වීම 01 - 06

2. ශ්‍රී ලංකාවේ භූගෝලීය පිහිටීම 07 - 10

3. ශ්‍රී ලංකාවේ ජනාවාස ආරම්භය හා ව්‍යාප්තිය 11- 24

4. අපේ කීර්තිමත් රජවරු 25 - 46

5. ශ්‍රී ලංකාවේ පිරිවෙන් ඉතිහාසය 47 - 60

6. ශ්‍රී ලංකාවේ පිරිවෙන් අධ්‍යාපනයේ නව ප්‍රවණතා 61 - 71

7. ශ්‍රී ලංකාවේ අනන්‍යතාව අගයමු 72 - 88

8. ලෝකයේ පැරණි ශිෂ්ටාචාර 89 - 140

# ඉතිහාසය

## විෂය නිර්දේශය

## 3 ශ්‍රේණිය

(2019 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ)

## පිරිවෙන් අධ්‍යාපනයේ පරමාර්ථ හා අරමුණු

2. (අ) භික්ෂූන් වහන්සේලාට, සහ

(ආ) පිරිවෙනක පවත්වනු ලබන අධ්‍යයන පාඨමාලාවක් හැදෑරීමට කැමැත්තෙන් සිටින්නා වූ ද බෞද්ධ පරිසරයක ස්වකීය අධ්‍යාපනය ලැබීමට අපේක්ෂා කරන්නා වූ ද වයස අවුරුදු දහහතර ඉක්ම වූ ගිහි පිරිමි ශිෂ්‍යයන්ට අධ්‍යාපන පහසුකම් සැලසීම පිරිවෙන් අධ්‍යාපනයේ අරමුණු වන්නේ ය.

3. (අ) පරියත්ති, පටිපත්ති, පටිවේධ යන ත්‍රිවිධ ශාසනයේ ආරක්ෂාව හා අභිවෘද්ධිය කෙරෙහි භික්ෂූන් වහන්සේලා අතර උනන්දුවක් ඇති කිරීම.

(ආ) සැරියුත් මහ මුගලන් තෙර පරපුරෙන් පැවත එන සඟ පරපුර අවිච්ඡින්න ව පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය විනය, ත්‍රිපිටක ඥානය, ධර්ම ගරුක බව භික්ෂූන් වහන්සේලා අතර ඇති කිරීම.

(ඇ) දේශීය සහ විදේශීය ධර්මදූත මෙහෙයෙහි මෙන් ම භික්ෂූන් වහන්සේලාට යෝග්‍ය වෙනත් සේවාවන්හි නිරත වීම සඳහා අවශ්‍ය ප්‍රායෝගික දැනුම සඳහා ශික්ෂණයක් දීම, සහ

(ඈ) බෞද්ධ දර්ශනය, බෞද්ධ සංස්කෘතිය, බෞද්ධ ඉතිහාසය, සිංහල, පාලි, සංස්කෘත ඇතුළු භාෂාන්තර හා විෂයාන්තර පිළිබඳ ගැඹුරු දැනීමක් ලබා ගැනීම සඳහා භික්ෂූන් වහන්සේලාට පහසුකම් සලසා දීම, පිරිවෙන් අධ්‍යාපනයේ පරමාර්ථ වන්නේ ය.

**(1979 අංක 64 දරන පිරිවෙන් අධ්‍යාපන පනත)**

## ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපනය සඳහා වූ ජාතික පොදු අරමුණු

(I) සෑම (ළමයෙකුටම) දෙනාටම පාසල් අධ්‍යාපනයට ඇති සර්ව සහ සමාන අයිතිවාසිකම් තහවුරු කිරීම.

(II) සංස්කෘතික විවිධත්වය හඳුනා ගනිමින් ජාතික සහජීවනය පෝෂණය කිරීම, ජාතික අඛණ්ඩතාව සහ ජාතික සමගිය වර්ධනය කිරීම තුළින් මව්බිමට ආදරය, ගෞරවය හා කැපවීමෙන් යුතු ශ්‍රී ලාංකික පුරවැසියෙකු නිර්මාණය කිරීම.

(III) දේශීය හා ගෝලීය අභියෝගයන්ට ප්‍රතිචාර දක්වමින් ජාතියේ සංස්කෘතික හා පාරිසරික උරුමයන් හඳුනාගැනීම සහ සංරක්ෂණය කිරීම.

(IV) නිර්මාණශීලිත්වය, නවෝත්පාදනය සහ විචක්ෂණශීලී චින්තනය සහිත ඵලදායී පුද්ගලයින් නිර්මාණය කිරීම.

(V) තෘප්තිමත් ජීවන රටාවකට අවශ්‍ය ශාරීරික, මානසික සහ ආධ්‍යාත්මික යහපැවැත්ම පුද්ගලයන් තුළ ප්‍රචලිත කිරීම.

(VI) ගෝලීය ප්‍රවණතාවන්ට සරිලන පරිදි සමාජ, ආර්ථික හා සංස්කෘතික උන්නතිය සඳහා දැනුම, කුසලතා, ආකල්ප සහ මානව ගුණාංග සංවර්ධනය කිරීම.

(VII) මානව හිමිකම්, රටේ නීතිය හා යුතුකම් සහ වගකීම්වලට ගරු කරන, සමාජ සාධාරණත්වය හා ප්‍රජාතන්ත්‍රවාදී ජීවන රටාවකට අවශ්‍ය සාධක නිර්මාණය කිරීම හා ඒ සඳහා අනුබල දීම.

(VIII) සංකීර්ණ හා අනපේක්ෂිත තත්වයන්ට මුහුණ දීම සඳහා වෙනස්වීම් කළමනාකරණය සහ ඉගෙනුමට ඉගෙනීමේ පුද්ගල හැකියාවන් සංවර්ධනය කිරීම.

**(ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව - 2019)**

# මූලික නිපුණතා

අධ්‍යාපනය මඟින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු කර ගැනීමට දායක වනු ඇත.

## (I) සන්නිවේදන නිපුණතා

සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය සහ තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය යන අනුකාණ්ඩ 4ක් මත සන්නිවේදන නිපුණතා පදනම් වේ.

සාක්ෂරතාව : සාවධාන ව ඇහුම්කන් දීම, පැහැදිලිව කථා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරැදි ව සහ නිරවුල් ව ලිවීම, ඵලදායි අයුරින් අදහස් හුවමාරු කර ගැනීම

සංඛ්‍යා පිළිබඳ දැනුම : භාණ්ඩ අවකාශය හා කාලය ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය

රූපක භාවිතය : රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති සහ වර්ණ ගළපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම

තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය : පරිගණක දැනුම සහ ඉගෙනීමේදී ද සේවා පරිශ්‍රයක් තුළ දී ද පෞද්ගලික ජීවිතයේ දී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගී කර ගැනීම

## (II) පෞරුෂ වර්ධනයට අදාළ නිපුණතා

- නිර්මාණශීලීබව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තීන්, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලී හා විග්‍රහාත්මක චින්තනය,
- කණ්ඩායම් හැගීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයාගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුසලතා
- ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම, වැනි අගයයන්
- චිත්තවේගී බුද්ධිය.

## (III) පරිසරයට අදාළ නිපුණතා

මෙම නිපුණතා සාමාජික, ජෛව සහ භෞතික පරිසරයට අදාළ වේ.

සමාජ පරිසරයට : ජාතික උරුමයන් පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සාමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුසලතා, සාධාරණ යුක්තිය පිළිබඳ හැගීම, සමාජ සම්බන්ධතා, පෞද්ගලික චර්යාව, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදායයන්, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම්

ජෛව පරිසරය : සජීවී ලෝකයක, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස් වැල්, වනාන්තර, මුහුද, ජලය, වාතය සහ ජීවය ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදීබව හා කුසලතා

භෞතික පරිසරය: අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට ඒවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍ය, සුව පහසුව, ශ්වසනය, නින්ද, නිකලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මලපහ කිරීම යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදිතාව හා කුසලතාවන් ඉගෙනීම, වැඩ කිරීම සහ ජීවත් වීම සඳහා මෙවලම් සහ තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුසලතා මෙහි අඩංගු වේ.

(IV) වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා

ආර්ථික සංවර්ධනයට දායක වීම,
තම වෘත්තීය ලැදියා සහ අභියෝග හඳුනා ගැනීම
හැකියාවන්ට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම, සහ
වාසිදායක හා තිරසර ජීවනෝපායක නිරත වීම යන හැකියාවන් උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා

(V) ආගම සහ සදාචාර ධර්මයන්ට අදාළ නිපුණතා

පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයයන් උකහා ගැනීම හා ස්වීයකරණය

(VI) ක්‍රීඩාව සහ විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා

සෞන්දර්යය, සාහිත්‍යය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටාවන් මඟින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්

(VII) "ඉගෙනීමට ඉගෙනුම" පිළිබඳ නිපුණතා

ශීඝ්‍රයෙන් වෙනස් වන සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස්වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදීව හා සාර්ථකව ප්‍රතිචාර දැක්වීමත් ස්වාධීනව ඉගෙන ගැනීමත් සඳහා පුද්ගලයින්හට ශක්තිය ලබා දීම. ( උපුටා ගැනීම 2003 අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව)

**ඉතිහාස විෂයය අධ්‍යයනයේ අරමුණු**

1. මානව ශිෂ්ටාචාරයේ ඓතිහාසික විකාශනය හා ප්‍රවණතා පිළිබඳ විවිධාකාර වූ ස්වභාවය බුද්ධිමත් ව, නිවහල් ව, නිර්මාණශීලී ව හා විවේචනාත්මක ව වටහා ගැනීම.
2. අතීතය මත පදනම් ව වර්තමානය ගොඩනැගෙන බැවින් වර්තමානය මත පදනම් ව ගොඩනැගෙන අනාගතය වඩා ඵලදායී කරලීම වර්ධනය කර ගැනීම
3. ජාතික අනන්‍යතාව හඳුනාගෙන දේශීය උරුමයන් සුරකිමින් දැ හිතකාමී පුරවැසියෙකු බවට පත්වීම.
4. ඓතිහාසිකව වැදගත් භූමිකා ඉටු කළ පුද්ගලයන්ගේ චරිතාපදාන චරිතායනය කර ගැනීම.
5. ශ්‍රී ලංකාවේ ඓතිහාසික වටිනාකම් හා හර පද්ධතීන් පිළිබඳව අභිමානවත් හැඟුමෙන් කටයුතු කිරීම.
6. ජාතික ප්‍රශ්න දෙස තුලනාත්මක ව බැලීම.
7. ඓතිහාසික ගෝලීය ප්‍රවණතා මෙරට ඉතිහාසය කෙරෙහි බලපා ඇති ආකාරය වටහා ගෙන ලෝක ප්‍රවණතාවලට මුහුණ දීමේ ශක්තිය ඇති කර ගැනීම.
8. අන්‍ය සංස්කෘතීන්ට ගරු කිරීම.
9. කාලය හා අවකාශය පිළිබඳ දැනුම වර්ධනය කර ගැනීම.
10. ඓතිහාසික තොරතුරු ඇසුරෙන් ස්ථාන හඳුනා ගැනීමේ හැකියාව දියුණු කර ගැනීම

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලපරිච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| **1.0 මූලාශ්‍රය විවේචනයෙන් ගොඩනැගෙන විචාරාත්මක ශික්ෂණය ප්‍රායෝගික ජීවිතයට භාවිත කරයි.** | 1.1 ඉතිහාසය යනු කුමක්දැයි විමසා බලයි. | 1. ඉතිහාසය හැඳින්වීම<br>1.1 ඉතිහාසය පිළිබඳව නිර්වචන අධ්‍යයනය කිරීම | ● ඉතිහාසය යන්න පැහැදිලි කරයි.<br>● ඉතිහාසය පිළිබඳව ඇති නිර්වචන අධ්‍යයනය කරයි.<br>● ඉතිහාසය පිළිබඳ සරල නිර්වචනයක් ගොඩනගයි. | 02 |
| | 1.2 ඉතිහාසය ඉගෙනීමේ වැදගත්කම පැහැදිලි කරයි. | 1.2 ඉතිහාසය ඉගෙනීමේ වැදගත්කම | ● ඉතිහාසය ඉගෙනීමෙන් දැහිතකාමී පුරවැසියන් බිහි කර ගත හැකි බව ප්‍රකාශ කරයි.<br>● ඉතිහාසය ඉගෙන ගැනීමේ ප්‍රයෝජන විස්තර කරයි.<br>● ඉතිහාසය ඉගෙනීමේ ප්‍රයෝජන ඇසුරින් ලිපියක් සකසයි. | 02 |
| **2.0 රටක ඉතිහාසය ගොඩනැගීමේ දී භූගෝලීය සාධක බලපාන ආකාරය පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි.** | 2.1 ශ්‍රී ලංකාවේ බාහිර පිහිටීම පිළිබඳ තොරතුරු විමර්ශනය කරයි. | 2. ශ්‍රී ලංකාවේ භූගෝලීය පිහිටීම<br>2.1 ශ්‍රී ලංකාවේ බාහිර පිහිටීම | ● ශ්‍රී ලංකාවේ බාහිර පිහිටීම විස්තර කරයි.<br>● ශ්‍රී ලංකාවේ බාහිර පිහිටීම ඉතිහාසය ගොඩනැගීම සඳහා බලපා ඇති ආකාරය පැහැදිලි කරයි.<br>● ශ්‍රී ලංකාවේ බාහිර පිහිටීම සිතියමක් ඇසුරින් පෙන්වා දෙයි. | 04 |
| **3.0 ශ්‍රී ලාංකික ඉතිහාසයේ ඓතිහාසික විකාශනය හා ප්‍රවණතා පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි.** | 3.1 ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික යුගය පිළිබඳ අධ්‍යයනය කරයි. | **3. ශ්‍රී ලංකාවේ ජනාවාස ආරම්භය හා ව්‍යාප්තිය**<br>3.1 ප්‍රාග් ඓතිහාසික යුගය | ● ප්‍රාග් ඓතිහාසික යුගය පිළිබඳ තොරතුරු විස්තර කරයි.<br>● ප්‍රාග් ඓතිහාසික ස්ථාන නම් කරයි.<br>● ප්‍රාග් ඓතිහාසික යුගයේ මිනිසා ස්වභාවික පරිසරයට අනුගත ව ජීවත් වූ ආකාරය අගය කරයි. | 02 |

| | | | | |
|---|---|---|---|---|
| | 3.2 පූර්ව ඓතිහාසික යුගය පිළිබඳව අධ්‍යයනය කරයි. | 3.2 පූර්ව ඓතිහාසික යුගය | • පූර්ව ඓතිහාසික යුගය යන්න පැහැදිලි කරයි.<br>• පූර්ව ඓතිහාසික යුගයේ මූලික ලක්ෂණ විස්තර කරයි.<br>• පූර්ව ඓතිහාසික ජනාවාස බිහි වූ ප්‍රදේශය නම් කරයි. | 02 |
| | 3.3 ඓතිහාසික යුගයේ ජනාවාස ආරම්භය හා ව්‍යාප්තිය අධ්‍යයනය කරයි. | 3.3 ඓතිහාසික යුගය | • ඓතිහාසික යුගය යන්න පැහැදිලි කරයි.<br>• ශ්‍රී ලංකාවේ ඓතිහාසික යුගයේ ජනාවාස ව්‍යාප්තිය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.<br>• ජනාවාස ව්‍යාප්ත වූ ප්‍රදේශ ශ්‍රී ලංකා සිතියමක් මගින් පෙන්වා දෙයි. | 02 |
| **4.0 ශ්‍රී ලාංකික ඉතිහාසයේ ඓතිහාසික විකාශනය හා ප්‍රවණතා පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි.** | 4.1 පණ්ඩුකාභය කුමරු අභියෝග ජය ගනිමින් රාජ්‍යත්වයට පත් වූ ආකාරය විමසා බලයි. | 4. අපේ කීර්තිමත් රජවරු (අනුරාධපුර යුගය)<br>4.1 පණ්ඩුකාභය රජතුමා | • පණ්ඩුකාභය රජුගේ ළමා කාලය පිළිබඳව තොරතුරු විස්තර කරයි.<br>• පණ්ඩුකාභය කුමරු මුහුණදුන් අභියෝග පෙන්වා දෙයි.<br>• අභියෝග ජය ගැනීම සඳහා පණ්ඩුකාභය චරිතයෙන් ගත හැකි ආදර්ශ විස්තර කරයි. | 02 |
| | 4.2 ශ්‍රී ලංකාවට බුදු දහම ගෙන ඒම හා ස්ථාපිත කිරීමෙහිලා දේවානම්පිය තිස්ස රජුගේ සේවය මතු කර දක්වයි. | 4.2 දේවානම්පිය තිස්ස රජතුමා | • ඉන්දියාව හා ලංකාව අතර සබඳතා විස්තර කරයි.<br>• ලංකාවට බුදු දහම ලැබුණු අයුරු විස්තර කරයි.<br>• දේවානම්පිය තිස්ස රජුගේ ඓතිහාසික සේවාව පැහැදිලි කරයි.<br>• බුදු දහම ආභාසයෙන් ශ්‍රී ලාංකික සමාජය පෝෂණය වූ අයුරු පෙන්වා දෙයි. | 02 |

| | | | | |
|---|---|---|---|---|
| | 4.3 දුටුගැමුණු රජතුමාගේ ශ්‍රේෂ්ඨත්වය පෙන්වා දෙයි. | 4.3 දුටුගැමුණු රජතුමා | • කාවන්තිස්ස රජුගේ දූරදර්ශී ක්‍රියාකලාපය විස්තර කරයි.<br>• දුටුගැමුණු රජතුමාගේ ශ්‍රේෂ්ඨත්වය පැහැදිලි කරයි.<br>• යහපත් නායකත්වයේ ලක්ෂණ පෙන්වා දෙයි. | 02 |
| | 4.4 වළගම්බා රජුගේ ශ්‍රේෂ්ඨත්වය අගයයි. | 4.4 වළගම්බා රජතුමා | • වළගම්බා රජතුමා රාජ්‍යයත්වයට පත් වූ ආකාරය පැහැදිලි කරයි.<br>• වළගම්බා රජතුමාගේ සාසනික සේවා ව විස්තර කරයි<br>• වළගම්බා රජතුමාගේ චරිතයෙන් ගත හැකි ආදර්ශ පෙන්වා දෙයි. | 02 |
| | 4.5 වසභ රජුගේ කාර්ය සාඵල්‍යය විස්තර කරයි. | 4.5 වසභ රජතුමා | • වසභ රජු රාජ්‍යයත්වයට පත් වූ අයුරු පෙන්වා දෙයි.<br>• වසභ රජුගේ පාලන සමයේ සුවිශේෂත්වය විස්තර කරයි.<br>• වසභ රජු රටේ ආර්ථිකය ගොඩනැංවීම සඳහා කළ සේවා ව අගය කරයි. | 02 |
| | 4.6 ධාතුසේන රජතුමා ඉටු කළ මෙහෙවර මතු කර දක්වයි. | 4.6 ධාතුසේන රජතුමා | • ධාතුසේන රජු රාජ්‍යයත්වයට පත් වූ ආකාරය විස්තර කරයි.<br>• ධාතුසේන රජුගේ ආර්ථික කටයුතු පෙළගස්වයි.<br>• ධාතුසේන රජු ගෙන් සිදු වූ ආගමික සේවය අගය කරයි. | 02 |

| | | | | |
|---|---|---|---|---|
| **5.0 ශ්‍රී ලංකාවේ පිරිවෙන් අධ්‍යාපන ඉතිහාසයේ ආරම්භය හා විකාශනය පිළිබඳව අවබෝධයෙන් කටයුතු කරයි.** | 5.1 පිරිවෙන් ඉතිහාසයේ ආරම්භය හා විකාශනය විස්තර කරයි. | **5. ශ්‍රී ලංකාවේ පිරිවෙන් ඉතිහාසය**<br>5.1 පිරිවෙන් ආරම්භය හා විකාශය | ● පිරිවෙන් අධ්‍යාපන සංකල්පයේ අර්ථය පැහැදිලි කරයි<br>● පිරිවෙන් ඓතිහාසික විකාශනය විස්තර කරයි | 02 |
| | 5.2 අනුරාධපුර පොලොන්නරු යුගවල පිරිවෙන් ඉතිහාසය අධ්‍යයනය කරයි. | 5.2 අනුරාධපුර හා පොලොන්නරු යුගවල පැවති අධ්‍යාපන ක්‍රමයේ ලක්ෂණ<br><br>අනුරාධපුර හා පොලොන්නරුව යුගවල පිරිවෙන් ඉතිහාසය අධ්‍යයනය කරයි. | ● පිරිවෙන් අධ්‍යාපනයේ සුවිශේෂතා පෙන්වා දෙයි<br>● පිරිවෙන් අධ්‍යාපන ක්‍රමය ලෝක අධ්‍යාපනය වෙනස් මගකට යොමු කළ බව අගයමින් කථා කරයි.<br>● ලංකාවේ පිරිවෙන් අධ්‍යාපනය අනුරාධපුර -යෙන් ආරම්භ වූ බවට කරුණු දක්වයි.<br>● අනුරාධපුරයේ හා පොලොන්නරු යුගයේ සුප්‍රකට පිරිවෙන් නම් කරයි. රජරට ශිෂ්ටාචාර සමයේ සදාචාර සම්පන්න සමාජයක් බිහිවීම සඳහා පිරිවෙන් අධ්‍යාප නය දායක වූ බව අගයමින් කථා කරයි. | 03 |
| | 5.3 දඹදෙණි යුගයේ පිරිවෙන් ඉතිහාසය විස්තර කරයි. | 5.3 දඹදෙණිය යුගයේ පිරිවෙන් ඉතිහාසය | ● දඹදෙණි යුගයේ බිහි වූ පිරිවෙන් අධ්‍යාපන ආයතන නම් කරයි.<br>● දඹදෙණි කතිකාවත මගින් දඹදෙණි රාජධානි සමයේ පැවති අධ්‍යාපන ක්‍රමය පහදයි.<br>● ලාංකික අධ්‍යාපන ක්‍රමයට දඹදෙණි රාජධානි සමයේ එක් වූ නවාංග පෙන්වා දෙයි. | 02 |

| | | | | |
|---|---|---|---|---|
| | 5.4 කුරුණෑගල යුගයේ පිරිවෙන් ඉතිහාසය විස්තර කරයි. | 5.4 කුරුණෑගල යුගයේ පිරිවෙන් ඉතිහාසය | • කුරුණෑගල යුගයේ පිරිවෙන් අධ්‍යාපනය විස්තර කරයි.<br>• කුරුණෑගල පිරිවෙන් අධ්‍යාපනයට එල්ල වූ අභියෝග පහදා දෙයි.<br>• හතරවන පරාක්‍රමබාහු රාජ්‍ය සමයේ පිරිවෙන් අධ්‍යාපනය වර්ධනය පැහැදිලි කරයි. | 02 |
| | 5.5 කෝට්ටේ යුගයේ පිරිවෙන් ඉතිහාසයේ ආරම්භය හා විකාශනය විස්තර කරයි. | 5.5 කෝට්ටේ යුගයේ පිරිවෙන් අධ්‍යාපනය | • කෝට්ටේ යුගයේ බිහි වූ පිරිවෙන් ආයතන නම් කරයි.<br>• ක්‍රමවත් පිරිවෙන් අධ්‍යාපනයක් නිර්මාණය වීම කෙරෙහි පැවති දේශපාලන එක්සත් භාවයේ වැදගත්කම පෙන්වා දෙයි.<br>• කෝට්ටේ යුගයේ පැවති අධ්‍යාපනය පිළිබඳව සන්දේශ කාව්‍ය තුළින් විස්තර කරයි. | 03 |
| | 5.6 කෝට්ටේ යුගයේ පිරිවෙන් අධ්‍යාපනයේ විෂය මාලාව විස්තර කරයි. | 5.6 කෝට්ටේ යුගයේ පිරිවෙන් විෂය මාලාව | • කෝට්ටේ යුගයේ ආරාමික අධ්‍යාපනයේ විෂයයන් නම් කරයි.<br>• කෝට්ටේ යුගයේ දී පිරිවෙන් අධ්‍යාපනයේ නව්‍යතාවන් පිළිබඳ විස්තර කරයි.<br>• කෝට්ටේ යුගයේ පැවති අධ්‍යාපන ක්‍රියාවලිය හේතුවෙන් ශ්‍රී ලංකාව ජාත්‍යන්තර කීර්තියට පත් ව සිටි බව අගයමින් කතා කරයි. | 02 |

| | | | | |
|---|---|---|---|---|
| **6.0 ශ්‍රී ලංකාවේ පිරිවෙන්වල නව ප්‍රවණතා පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි.** | 6.1 පිරිවෙන් ඉතිහාසයේ නව පිබිදීම පිළිබඳ තොරතුරු විමර්ශනය කරයි. | **6. පිරිවෙන් අධ්‍යාපනයේ නව ප්‍රවණතා.**<br>6.1 පිරිවෙන් අධ්‍යාපනයේ වර්තමාන තත්ත්වය | • මුල් කාලයේ පිරිවෙන් අධ්‍යාපනය දියුණු තත්ත්වයක තිබූ බව පෙන්වා දෙයි.<br>• පිරිවෙන් අධ්‍යාපනය පිරිහීමට හේතු පැහැදිලි කරයි.<br>• පිරිවෙන් අධ්‍යාපනයේ පැවති දියුණුව අගය කරයි.<br>• පිරිවෙන් අධ්‍යාපනය රැක ගැනීම අවශ්‍ය බවට සාධක දක්වයි. | 02 |
| | 6.2 පිරිවෙන් ඉතිහාසයේ නව පිබිදීම ඇති කළ සඟරජ හිමි පිළිබඳ තොරතුරු විමර්ශනය කරයි. | **6.2 වැලිවිට ශ්‍රී සංඝරාජ හිමි** | • වැලිවිට ශ්‍රී සරණංකර සංඝරාජ හිමි පිළිබඳ තොරතුරු විස්තර කරයි.<br>• වැලිවිට ශ්‍රී සරණංකර සංඝරාජ හිමි උගත් පඬිවරයෙකු බව පෙන්වා දෙයි.<br>• වැලිවිට ශ්‍රී සරණංකර හිමියන්ගේ ශ්‍රේෂ්ඨත්වය අගය කරයි. | 02 |
| | 6.3 පිරිවෙන් අධ්‍යාපනය සඳහා සඟරාජ හිමිගේ දායකත්වය පෙන්වා දෙයි. | 6.3 පිරිවෙන් අධ්‍යාපනය සඳහා සඟරජ හිමිගේ දායකත්වය | • වැලිවිට ශ්‍රී සරණංකර සංඝරාජ හිමි පිරිවෙන් අධ්‍යාපනය සඳහා කළ සේවය විස්තර කරයි.<br>• බිඳ වැටෙමින් පැවති පිරිවෙන් අධ්‍යාපනය ස්ථාපිත කිරීම සඳහා සංඝරාජ හිමි දැක් වූ දායකත්වය පෙන්වා දෙයි.<br>• පිරිවෙන් අධ්‍යාපනය රැක ගැනීමට උරදුන් නායකයින් අගය කරයි. | 02 |

| | | | | |
|---|---|---|---|---|
| | 6.4 පිරිවෙන් අධ්‍යාපනයේ නව පිබිදීම ඇති කිරීමට දායක වූවන් පිළිබඳ තොරතුරු විමර්ශනය කරයි. | 6.4 නව පිරිවෙන් හා ඊට දායක වූවන් | • පසුකාලීනව ආරම්භ වූ පිරිවෙන් නම් කරයි.<br>• පිරිවෙන් මගින් සිදු වූ සේවාව අගය කරයි.<br>• පිරිවෙන් අධ්‍යාපනයේ වර්ධනය පෙන්වා දෙයි. | 02 |
| | 6.5 පිරිවෙන් පාලනය, සාමාජිකයන් හා එහි සංයුතිය පාලන සංවිධාන විමසා බලයි. | 6.5 පිරිවෙන් පාලනය හා පාලන සංවිධානය | • පිරිවෙන් පාලන සංවිධාන පැහැදිලි කරයි.<br>• පිරිවෙන් පාලනයට බලපාන ව්‍යවස්ථා හා පනත් පැහැදිලි කරයි<br>• පිරිවෙන් ආයතනවල කාර්යක්ෂමතාවට එහි පරමාර්ථ හේතුවන ආකාරය පෙන්වා දෙයි.<br>• පිරිවෙන් පාලන අනපනත් මගින් විධිමත් ව පිරිවෙන් පවත්වාගෙන යාමට ඇති හැකියාව අගය යි. | 03 |
| **7.0 ශ්‍රී ලාංකික අනන්‍යතාව හඳුනාගෙන ඊට අනුගත වේ.** | 7.1 ශ්‍රී ලාංකික අනන්‍යතාව හඳුනාගනිමින් ඊට ගෞරව කරයි. | **7. ශ්‍රී ලංකාවේ අනන්‍යතාව අගයමු**<br>7.1 ශ්‍රී ලංකාවේ ජාතික අනන්‍යතාව | • ශ්‍රී ලාංකික අනන්‍යතාව පැහැදිලි කරයි<br>• විවිධ ජන වර්ග පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි | 02 |
| | 7.2 ශ්‍රී ලංකාවේ රාජ්‍ය ලාංඡනය පිළිබඳ විස්තර කරයි. | 7.2 ජාතික ලාංඡනය | • විවිධත්වය තුළින් ඒකීයත්වය ගොඩනැගෙන ආකාරය පෙන්වා දෙයි.<br>• රාජ්‍ය ලාංඡනය නිර්මාණය වූ ආකාරය පෙන්වා දෙයි.<br>• රාජ්‍ය ලාංඡනයේ සංකේත හා ඉන් නිරූපිත අංග පැහැදිලි කරයි.<br>• රාජ්‍ය ලාංඡනය භාවිත කරන අවස්ථා විස්තර කරයි. | 01 |

| | | | | |
|---|---|---|---|---|
| | 7.3 ශ්‍රී ලංකාවේ ජාතික කොඩියේ සංකේත පැහැදිලි කරයි. | 7.3 ජාතික කොඩිය | • ජාතික කොඩියේ සංකේත හා ඉන් නිරූපිත අංග පැහැදිලි කරයි.<br>• ජාතික කොඩිය ඔසවන හා අඩකුඹු කෙරෙන අවස්ථා විස්තර කරයි.<br>• ජාතික කොඩියට ගරු කිරීමට හුරු වෙයි.<br>• ජාතික කොඩිය අවභාවිත වන අවස්ථා පෙන්වා දෙයි. | 02 |
| | 7.4 ජාතික අනන්‍යතාව පෙන්නුම් කෙරෙන සංකේත පැහැදිලි කරයි. | 7.4 ශ්‍රී ලාංකිකත්වය පිළිබිඹු කරන වෙනත් සංකේත<br>– ජාතික ගීය<br>– ජාතික වෘක්ෂය<br>– ජාතික පක්ෂියා<br>– ජාතික පුෂ්පය<br>– ජාතික ක්‍රීඩාව | • ශ්‍රී ලාංකික අනන්‍යතාවේ සංකේත විස්තර කරයි.<br>• ශ්‍රී ලාංකික අනන්‍යතාවට අනුගතව ක්‍රියා කළ යුතු බව පෙන්වා දෙයි.<br>• විවිධත්වය තුළින් ඒකීයත්වය මතුවන අයුරු පෙන්වා දෙයි. | 03 |
| | 7.5 පිරිවෙන් ලාංඡනය හඳුනාගෙන පැහැදිලි කරයි. | 7.5 පිරිවෙන් ලාංඡනය | • පිරිවෙන් ධජය නිර්මාණය වූ ආකාරය හඳුන්වා දෙයි.<br>• පිරිවෙන් ධජයෙන් නිරූපණය වන සංකේත පැහැදිලි කරයි.<br>• පිරිවෙන් ධජයේ වටිනාකම පිළිබඳ ප්‍රකාශ කරයි. | 02 |
| **8.0 ලෝක ඉතිහාසයේ ඓතිහාසික විකාශනය හා ප්‍රවණතා පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි.** | 8.1 ශිෂ්ටාචාර ආරම්භ වීමට පෙර ඓතිහාසික තත්ත්වය පිළිබඳ තොරතුරු විස්තර කරයි. | 8. **ලෝකයේ පැරණි ශිෂ්ටාචාර**<br>8.1 ශිෂ්ටාචාර බිහි වීමට පෙර අවදිය<br>– පූර්ව ශිලා යුගය<br>– මධ්‍ය ශිලා යුගය<br>– නව ශිලා යුගය | • ශිෂ්ටාචාර ආරම්භවීමට පෙර ආදි මානවයා පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.<br>• ආදි මානවයන් මුහුණදුන් අභියෝග හා ඒවා ජය ගත් ආකාරය පැහැදිලි කරයි.<br>• ආදි මානවයා ලබා ගත් ජයග්‍රහණ යුගවලට අනුව වගු ගත කරයි. | 02 |

| | | | | |
|---|---|---|---|---|
| | 8.2 ලෝකයේ පැරණි ගංගා නිම්න ශිෂ්ටාචාර පිළිබඳ තොරතුරු විමසා බලයි. | 8.2.1 ශිෂ්ටාචාරය හැඳින්වීම.<br>8.2 ලෝකයේ පැරණි ගංගා නිම්න ශිෂ්ටාචාර | • ශිෂ්ටාචාරයක් යන්න පැහැදිලි කරයි.<br>• පැරණි ශිෂ්ටාචාරවල පොදු ලක්ෂණ පැහැදිලි කරයි.<br>• ශිෂ්ටාචාර ගොඩනැගීම ක්‍රමික විකාශනයක ප්‍රතිඵලයක් බව පෙන්වා දෙයි.<br>• ශිෂ්ටාචාරවල භූගෝලීය ව්‍යාප්තිය සිතියමක<br>• ලකුණු කොට දක්වයි. | 02 |
| | 8.3 මෙසපොතේමියානු ශිෂ්ටාචාරයේ තොරතුරු විග්‍රහ කරයි. | 8.3 මෙසපොතේමියානු ශිෂ්ටාචාරය<br>8.3.1 ආරම්භය හා ව්‍යාප්තිය<br>– උබයිඩ් අවදිය<br>– සුමේරියානු අවදිය<br>– බැබිලෝනියානු අවදිය<br>• පාලන කටයුතු<br>• සමාජ තත්වය<br>• ආර්ථික තත්ත්වය<br>• කලාව සාහිත්‍ය හා ගෘහ නිර්මාණ<br>8.3.2 සංස්කෘතිකාංග<br>• කලාව හා ගෘහ නිර්මාණය<br>• අධ්‍යාපනය හා සාහිත්‍යය<br>• මෙසපොතේමියානු ශිෂ්ටාචාරයෙන් ලෝකයට උරුම වූ දායාද | • ශිෂ්ටාචාරයේ ආරම්භය විස්තර කරයි<br>• වර්ධනීය අවස්ථාවන් පෙන්වා දෙයි<br>• මෙසපොතේමියානු ශිෂ්ටාචාරයෙන් ලෝකයට උරුම වූ දායාද අගයමින් කරුණු දක්වයි.<br>• මෙසපොතේමියානු ශිෂ්ටාචාරය සිතියමක ලකුණු කොට නම් කරයි. | 04 |

| | | | | |
|---|---|---|---|---|
| | 8.4 ඊජිප්තු ශිෂ්ටාචාරයේ තොරතුරු විග්‍රහ කරයි. | 8.4.1 ආරම්භය හා ව්‍යාප්තිය<br>- පිරමීඩ යුගය<br>- වැඩවසම් යුගය<br>- අධිරාජ්‍ය යුගය<br>8.4.2 පරිහානිය<br>8.4.3 පාලන තන්ත්‍රය<br>8.4.4 ආර්ථික තත්ත්වය<br>- කෘෂිකර්මාන්තය<br>- සත්ත්ව පාලනය<br>- වෙළෙඳාම<br>- බදු ක්‍රම | • ඊජිප්තු ශිෂ්ටාචාරයේ ආරම්භය විස්තර කරයි<br>• ඊජිප්තු ශිෂ්ටාචාරයේ වර්ධනීය අවස්ථා පෙන්වා දෙයි<br>• ඊජිප්තු ශිෂ්ටාචාරයෙන් ලෝකයට උරුම වූ දායාද හා වටිනාකම් අගයයි<br>• ඊජිප්තු ශිෂ්ටාචාරය සිතියමක ලකුණු කොට නම් කරයි | 03 |
| | 8.5 හොවැංහෝ ශිෂ්ටාචාරයේ තොරතුරු විග්‍රහ කරයි. | **8.5 හොවැංහෝ ශිෂ්ටාචාරය**<br>8.5.1 හොවැංහෝ ශිෂ්ටාචාරයේ ආරම්භය හා ව්‍යාප්තිය<br>8.5.2 හොවැංහෝ ශිෂ්ටාචාරයේ පාලනය<br>- ෂං පෙළපත<br>- චෞ පෙළපත<br>- චිං පෙළපත<br>- හැන් පෙළපත<br>8.5.3 ආර්ථික වැදගත්කම<br>- කෘෂිකර්මාන්තය<br>- වෙළෙඳාම හා භාණ්ඩ ප්‍රවාහනය<br>- සත්ත්ව පාලනය<br>- විවිධ කර්මාන්ත | • හොවැංහෝ ශිෂ්ටාචාරයේ ආරම්භය විස්තර කරයි<br>• හොවැංහෝ ශිෂ්ටාචාරයේ වර්ධනීය අවස්ථා පෙන්වා දෙයි.<br>• හොවැංහෝ ශිෂ්ටාචාරයෙන් ලෝකයට උරුම වූ දායාද හා වටිනාකම් අගයමින් තොරතුරු දක්වයි.<br>• හොවැංහෝ ශිෂ්ටාචාරයේ පිහිටීම සිතියමක ලකුණු කොට නම් කරයි. | 03 |

| | | | | |
|---|---|---|---|---|
| | 8.6 ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ ආරම්භය හා විකාශනය විස්තර කරන්න. | 8.5.4 ආගමික ඇදහිලි හා විශ්වාස<br>– ස්වභාවික වස්තූන් දේවත්වයෙන් සැලකීම<br>– මළවුන් ඇදහීම<br>– පේන බැලීම<br>– ආගමික දාර්ශනික තත්ත්වය<br><br>8.5.5 විද්‍යාව හා තාක්ෂණය<br>– හොවැංහෝ ශිෂ්ටාචාරයෙන් ලෝකයට උරුම වූ දායාද<br><br>**8.6 ඉන්දු නිම්න ශිෂ්ටාචාරය**<br>8.6.1 ආරම්භය හා ව්‍යාප්තිය<br>• මේ පිළිබඳ ඇති තොරතුරු පැහැදිලි කරයි.<br>• දේශීය විදේශීය මතවාද<br>• ව්‍යාප්ත ව පැවති ප්‍රදේශ<br><br>8.6.2 නගර නිර්මාණය හා වාස්තු විද්‍යාත්මක ලක්ෂණ<br><br>• නිවාස<br>• ධාන්‍යාගාර<br>• ඇතුළු නුවර<br>• මහා නාන තටාක<br>• ආලෝක කුලුනු<br>• සනීපාරක්ෂක කටයුතු | • ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ ආරම්භය පිළිබඳ විස්තර කරයි.<br>• වර්ධනීය අවස්ථාවන් හඳුනා ගනී.<br>• ඉන්දු නිම්න ශිෂ්ටාචාරයෙන් ලෝකයට උරුම වූ දායාද හා වටිනාකම් අගයයි.<br>• ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ පිහිටීම සිතියමක ලකුණු කොට නම් කරයි. | 03 |

| | | | | |
|---|---|---|---|---|
| | | 8.6.4 ආර්ථික තත්ත්වය<br><br>● කෘෂිකර්මාන්තය<br>● සත්ත්ව පාලනය<br>● වෙළෙඳාම<br>● කර්මාන්ත<br><br>8.6.5 පාලන කටයුතු<br>8.6.6 ආගමික ඇදහිලි හා විශ්වාස<br>● ජගත් මාතා වන්දනය<br>● වෘක්ෂ වන්දනය<br>● ජලය පිදීම<br>8.6.7. කලාව | | |

# ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්

# ඉතිහාසය හැඳින්වීම

ඉතිහාසය යනු මිනිසාගේ කතන්දරය යනුවෙන් සරලව හැඳින්විය හැකි ය. ඉතිහාසය දීර්ඝ කාලීන සිදුවීම් මාලාවක හා ක්‍රියාවලියක එකතුවකි. ඕනෑම ක්‍රියාවලියකට හා සිදුවීමකට ළඟ හෝ දුර ඉතිහාසයක් ඇත.

මෙම අරමුණු සහිත ව මෙම ඒකකය මගින් ඉතිහාසය යන්න හඳුනා ගැනීම, නිර්වචනය කිරීම, ඉතිහාසය හැදෑරීමෙන් ලැබෙන ප්‍රයෝජන සහ ශ්‍රී ලංකාවේ ඉතිහාසය කෙරෙහි බලපෑ භූගෝලීය පිහිටීම, ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික යුගයේ සිට අනුරාධපුර රාජධානිය දක්වා ජනාවාස හා එහි ව්‍යාප්තිය පිළිබඳ අවධානය යොමු කර ඇත.

**නිපුණතාව** : 0.1 මූලාශ්‍රය විවේචනයෙන් ගොඩනැගෙන විචාරාත්මක ශික්ෂණය ප්‍රායෝගික ජීවිතයට භාවිත කරයි.

**නිපුණතා මට්ටම** : 1.1 ඉතිහාසය යනු කුමක් දැයි විමසා බලයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 01

**ඉගෙනුම් පල** :

- ඉතිහාසය යන්න පැහැදිලි කරයි.
- ඉතිහාසය පිළිබඳව ඇති නිර්වචන අධ්‍යයනය කරයි.
- ඉතිහාසය පිළිබඳ සරල නිර්වචනයක් ගොඩනගයි.

**ආකල්ප හා හර පද්ධති** :

- ඕනෑම සිදුවීමකට ළඟ හෝ දුර ඉතිහාසයක් ඇති බව තේරුම් ගනියි.

**ගුණාත්මක යෙදවුම්** :

- ඉතිහාසය පිළිබඳ නිර්වචන
  https:/www.definitions.net/definition/history.dictonary.cambridge.org/dict

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

**පහත විෂය කරුණු ඇසුරින් පාඩම සැලසුම් කර ගන්න.**

**1.1 ඉතිහාසය හැඳින්වීම**

- (History) මෙම වචනය ග්‍රීක භාෂාවෙන් බිඳී ආවකි. එහි තේරුම වන්නේ විමර්ශනය යි.
- ඉතිහාසය යනු මිනිසාගේ කතන්දරය ලෙස සරල ව හැඳින්විය හැකි ය. ඒ අනුව මිනිසාගේ පහළ වීමේ සිට වර්තමානය දක්වා ම මිනිසා කළ කී දෑ පිළිබඳ විමර්ශනය කිරීම ඉතිහාසය මගින් සිදු වේ. ඒ අනුව මිනිසාගේ දේශපාලන, ආර්ථික, සමාජ හා සංස්කෘතික තොරතුරු විමර්ශනය කිරීම මීට ඇතුළත් වේ. ඒ අනුව ඉතිහාසයේ නිර්මාණකරුවා මිනිසා වේ.

**උදාහරණ :** මුල් කාලයේ ස්වාභාවික පරිසරයට අනුගතව ජීවත් වූ මිනිසා තම අවශ්‍යතාව අනුව නිවාස තනා ගැනීමට පෙලඹීම සහ ඉන් පසු එම නිවාස ක්‍රමයෙන් විවිධ පහසුකම් එකතු කරමින් වර්ධනය කර ගැනීම පහත රූප පෙළින් දැක්වේ.



I




II



III



IV



V



VI




VII



VIII

මේ අනුව ඉතිහාසය කාලානුරූපී ව ගොඩනැගෙන්නක් බව පැහැදිලි වේ.

මිනිසා විසින් ගොඩනංවන ලද ඉතිහාසය කාලානුරූපී ව අධ්‍යයනය කිරීමේ පහසුව සඳහා යුග වශයෙන් වෙන් කර ඇත.




ඉතිහාසය යනු විෂයයන් ගණනාවක එකතුවක් බව ජී.එම්. ට්‍රැව්ලියන් නම් ඉතිහාසඥයා පෙන්වා දෙයි. එනම් ආගම, භූගෝල විද්‍යාව, දේශපාලන විද්‍යාව, තාක්ෂණය, කලාව, කෘෂිකර්මය වැනි සියලු විෂයයන් ඊට අයත් ය.

උදාහරණ

**දේශපාලන විද්‍යාව** - වර්තමාන දේශපාලනය අනාගතයේ ඉතිහාසය යි.
**භූගෝල විද්‍යාව** - ඓතිහාසික සිදුවීම් කෙරෙහි බලපෑ භූගෝලීය සාධක විස්තර කිරීම
**විද්‍යාව හා තාක්ෂණය** - විවිධ කාල වකවානුවල භාවිත වූ විද්‍යාව හා තාක්ෂණය පැහැදිලි කිරීම

යනාදී වශයෙන් විවිධ විෂයයන්ට අනන්‍ය වූ මූලධර්ම හා සංකල්ප ගැඹුරින් සාකච්ඡා නොකළ ද ඉතිහාසය හා සම්බන්ධ යම් යම් කරුණු සාකච්ඡා වීම එනිසා ඉතිහාසය, විෂයයන් සියල්ල අඩංගු ගෘහයක් ලෙසට ද ට්‍රෙව්ලියන් පෙන්වා දෙයි.

**ඉතිහාසය පිළිබඳ නිර්වචන :**

- ''ඉතිහාසය යනු ඔබේ සිතුවිලි නොව, ඔබගේ මතකය යි'' ලෙස ඩබ්ලිව්. එම්. සෙල්ර් නම් ඉතිහාසඥයා සඳහන් කරයි. ඒ අනුව ඉතිහාසය යනු ප්‍රබන්ධයක් නොවන බව හා එය සත්‍ය ලෙසම සිදු වූ දේ බවට අර්ථ දැක්වෙයි.

- ''ඉතිහාසය යනු මිනිසා පිළිබඳ අධ්‍යයනයක් බව'' ආර්.පී කොලින්වුඩ් නම් ඉතිහාසඥයා පෙන්වා දෙයි.

- ''වර්තමානය හා අනාගතය අනිවාර්යෙන් ම අතීතයෙන් ගොඩනැගෙන අතර එම මුද්‍රාව එහි දක්නට ලැබෙනු ඇත. එය අමතක කිරීම අත්තිවාරමක් නොමැතිව කරන ඉදිකිරීමක් වැනි ය'' යනුවෙන් ශ්‍රී ජවහර්ලාල් නේරු පවසයි.

- කවර හෝ දෙයක වර්තමාන තත්ත්වය ආසන්න හෝ දුර අතීතයක ප්‍රතිඵලයකි. වර්තමානය මෙන් ම අනාගතය ගොඩනැගීමේ පදනම වැටී ඇත්තේ අතීතයේ කළ දේ මතයි.

- ''අතීත සිද්ධීන් පිළිබඳ දැනුම වනාහි මනුෂ්‍ය ස්වභාවය හා නිවැරැදි කිරීම සඳහා ප්‍රබලතම උපකරණය වෙයි'' යනුවෙන් පොලිබියස් නම් ඉතිහාසඥයා ප්‍රකාශ කරයි.

**ඇගයීම හා තක්සේරුකරණය :**

**(පහත සඳහන් නිර්ණායක ආශ්‍රයෙන් ඇගයීම හා තක්සේරුව සිදු කරන්න.)**

- ඉතිහාසය යන්න පැහැදිලි කරයි
- ඕනෑම සිදුවීමකට ඉතිහාසයක් ඇති බව ප්‍රකාශ කරයි
- ඉතිහාසය පිළිබඳ නිර්වචනයක් ගොඩනගයි
- ගුරු උපදෙස් පිළිපදිමින් කටයුතු කරයි
- නිසි කාලයට නිම කරයි

**ක්‍රියාකාරකම**

ඉහත විෂය කරුණු ආවරණය වන සේ පහත ක්‍රියාකාරකමෙහි සිසුන් නිරත කරවන්න.

**ක්‍රියාකාරකම 01**

- මෙය කේවල ක්‍රියාකාරකමක් ලෙස යොදා ගන්න.
- සියලුම සිසුන්ට ඉතිහාසය සඳහා නිර්වචනයක් ගොඩනැගීමට උපදෙස් දෙන්න.
- මේ සඳහා විනාඩි 15ක පමණ කාලයක් ලබා දෙන්න.
- සෑම සිසුවෙකුට ම තම නිර්වචනය පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- සිසු දුබලතා හා ප්‍රබලතා පෙන්වා දෙන්න.
- ඉහත නිර්ණායක අනුව ඇගයීම හා තක්සේරුව සිදු කරන්න.

**නිපුණතාව** : 0.1 මූලාශ්‍රය විවේචනයෙන් ගොඩනැගෙන විචාරාත්මක ශික්ෂණය ප්‍රායෝගික ජීවිතයට භාවිත කරයි.

**නිපුණතා මට්ටම** : 1.2 ඉතිහාසය ඉගෙනීමේ වැදගත්කම පැහැදිලි කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල** :

- ඉතිහාසය ඉගෙන ගැනීමේ ප්‍රයෝජන විස්තර කරයි.
- ඉතිහාසය ඉගෙනීමෙන් දැහිතකාමී පුරවැසියන් බිහි කර ගත හැකි බව ප්‍රකාශ කරයි.
- ඉතිහාසය ඉගෙනීමේ ප්‍රයෝජන ඇසුරින් ලිපියක් සකසයි.

**ආකල්ප හා හර පද්ධති** :

- ඉතිහාසය ඉගෙනීමේ වැදගත්කම අවබෝධ කර ගනියි.

**ගුණාත්මක යෙදවුම්** :

- ඉතිහාසය ඉගෙනීමේ වටිනාකම පිළිබඳ රචිත පොත් පත්
- www.enotes.com/homework-help/why-important-study-History
- www.kenyaplex.com

**පාඩම් සැලසුම් සඳහා උපදෙස් :**

**පහත විෂය කරුණු ඇසුරින් පාඩම සැලසුම් කරන්න.**

**1.2 ඉතිහාසය ඉගෙනීමේ ප්‍රයෝජන**

- අතීතය මගින් වර්තමානය තේරුම්ගෙන අනාගතය ගොඩනගා ගත හැකිවීම
- වර්තමාන සමාජය ලෝකයේ ක්‍රමික විකාශනයක ප්‍රතිඵලයකි. එය අධ්‍යයනය කිරීම ඉතිහාසය තුළින් සිදු වේ. එමගින් අනාගතය පිළිබඳ දැක්මක් ඇති කර ගැනීමට හැකිවීම
- තමා ජීවත්වන සමාජය හා ලෝකය පිළිබඳ පැහැදිලි අවබෝධයක් ලබා ගැනීමට හැකිවීම
- යම් රටක, සමාජයක, ජන වර්ගයක, සංස්කෘතියක වර්තමාන තත්ත්වය නිසි ලෙස තේරුම් ගැනීමට නම් ඒවායේ කලින් පැවති තත්ත්වය අවබෝධ කර ගැනීම
- ජාතික අනන්‍යතාව හඳුනාගත හැකි වීම. රටක දේශපාලන, සංස්කෘතික, ආර්ථික හා සමාජීය තොරතුරු අධ්‍යයනය කිරීමෙන් එරටේ ජාතික අනන්‍යතාව හඳුනා ගැනීමට හැකි වීම
- ලෝකයේ දේශපාලන සිද්ධීන් හා බලවේග පිළිබඳ අවබෝධ කර ගැනීම

- ජාතික සමගිය ගොඩනැගීමට හා අන් සංස්කෘතීන්ට ගරු කිරීමට පුරුදු පුහුණුවීම

  » සෑම ආගමක් පිළිබඳව ම සෑම සංස්කෘතියක් පිළිබඳව ම අධ්‍යයනයක් ඉතිහාසය මගින් සිදුවේ. මේ නිසා ජාතික සමගිය ඇති වේ.

- කාලය හා අවකාශය පිළිබඳ අදහස් වර්ධනය කර ගැනීමට හැකි වීම

  » ඉතිහාසය යනු කාලය හා අවකාශය සම්බන්ධයෙන් තමාට හිමි ස්ථානය මැන බැලීමේ ස්වාභාවික ක්‍රමයක් වීම
  » ඉතිහාසයට අදාළ කාල නිර්ණයන් මිනිස් ඉතිහාසයේ ඇති විශේෂ සිදුවීම් හා සම්බන්ධ කර ගෙන ඇති බව දැන ගැනීම
  » සම්බුද්ධ පරිනිර්වාණය ඇසුරින් බුද්ධ වර්ෂ ක්‍රමය ආරම්භ වීම
  » ක්‍රිස්තුන් වහන්සේගේ උපත ඇසුරින් ක්‍රි.ව. ක්‍රමය ආරම්භ වීම

**ඇගයීම හා තක්සේරුකරණය :**

**(පහත සඳහන් නිර්ණායක ආශ්‍රයෙන් ඇගයීම හා තක්සේරුව සිදු කරන්න.)**

- ඉතිහාසය ඉගෙනීමෙන් ලබා ගත හැකි ප්‍රයෝජන විස්තර කරයි
- තම ජීවිතය සාර්ථක කර ගැනීමට ඉතිහාසයෙන් ආදර්ශ ගත හැකි බව පෙන්වා දෙයි ඉතිහාසය ඉගෙනීමෙන් ලැබෙන ප්‍රයෝජන ඇසුරින් ලිපියක් සාර්ථකව සකසයි
- ලිපිය වඩා නිවැරදි ව හා තර්කානුකූල ව සකස් කරයි
- නියමිත කාලයට ලිපිය භාර දෙයි

**ක්‍රියාකාරකම**

1. ඉතිහාසය විෂය හැදෑරීමෙන් ලැබෙන ප්‍රයෝජන යන තේමාව යටතේ පුවත් පතකට ලිපියක් සකස් කරන්න.
2. මෙය කේවල ක්‍රියාකාරකමක් ලෙස යොදා ගන්න.
3. ලිපිය සැකසීමට සුදුසු කාලයක් ලබා දෙන්න.
4. සිසු නිර්මාණ අතරින් සාර්ථක නිර්මාණ තෝරා සෙසු ශිෂ්‍යයන්ට ඒවා කියවීමට අවස්ථාව ලබා දෙන්න.

# 2

# ශ්‍රී ලංකාවේ භූගෝලීය පිහිටීම

ඕනෑම රටක ඉතිහාසය ගොඩනැගීම සඳහා එහි භූගෝලීය පිහිටීම ඉතා වැදගත් සාධකයක් වේ. රටේ අභ්‍යන්තර හා බාහිර පිහිටීම එහි ප්‍රධාන සාධක වෙයි. ශ්‍රී ලංකාවේ ඉතිහාසය ගොඩනැගීම සඳහා භූගෝලීය පිහිටීම බලපෑ ආකාරය අධ්‍යයනය කිරීම මෙම ඒකකයේ අරමුණ වේ.

**නිපුණතාව** : රටක ඉතිහාසය ගොඩනැගීමේ දී භූගෝලීය සාධක බලපාන ආකාරය පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි.

**නිපුණතා මට්ටම** : 2.1 ශ්‍රී ලංකාවේ බාහිර පිහිටීම පිළිබඳ තොරතුරු විමර්ශනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල** :

- ශ්‍රී ලංකාවේ බාහිර පිහිටීම විස්තර කරයි.
- ශ්‍රී ලංකාවේ බාහිර පිහිටීම ඉතිහාසය ගොඩනැගීම සඳහා බලපා ඇති ආකාරය පැහැදිලි කරයි.
- ශ්‍රී ලංකාවේ බාහිර පිහිටීම සිතියමක් ඇසුරින් පෙන්වා දෙයි.

**ආකල්ප හා හර පද්ධති** :

- ශ්‍රී ලංකාවේ බාහිර පිහිටීමේ වැදගත්කම අවබෝධ කර ගනියි.

**ගුණාත්මක යෙදවුම්** :

- ඇමුණුම 2.1.1
- බ්‍රිස්ටල් බෝඩ්
- A3 කඩදාසි
- පෙල්ට් පෑන්
- බාහිර භූගෝලීය පිහිටීම දැක්වෙන සිතියමක්
- VCD, Multy media projector, අන්තර්ජාලය
- www.britannica.com/place/sri-Lanka.
- en.wikipedia.org/wiki/Geography-of-SriLanka

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

**පහත සඳහන් විෂය අන්තර්ගතය ඇසුරින් පාඩම සැලසුම් කර ගන්න.**

**2.1 ශ්‍රී ලංකාවේ බාහිර පිහිටීම**

- ශ්‍රී ලංකාවේ බාහිර පිහිටීම පිළිබඳ ප්‍රධාන වශයෙන් මාතෘකා තුනක් යටතේ සාකච්ඡා කළ හැකි ය. එනම්,

   1. ඉන්දියාවට ආසන්නව පිහිටීම
   2. ඉන්දියාවෙන් වෙන් ව දූපතක් ව පිහිටීම
   3. ඉන්දියානු සාගරයේ මධ්‍යගත ව පිහිටීම

**1. ඉන්දියාවට ආසන්නව පිහිටීම**

- ඉන්දියානු ජන කණ්ඩායම් පැමිණීම හා ශ්‍රී ලංකාව ජනාවාස වීම

  - විජය සමග පැමිණි පිරිස හා වරින් වර පැමිණි ජන කණ්ඩායම් විසින් දිවයිනේ විවිධ ප්‍රදේශවල පදිංචි වීම හා ජනාවාස පිහිටුවීම
  - වරින් වර එල්ල වූ චෝළ, පාණ්ඩ්‍ය ආක්‍රමණ වැනි දකුණු ඉන්දියානු බලපෑම්
  - ඉන්දියානු දේශපාලන හා සංස්කෘතික බලපෑම
  - ඉන්දියානු සම්ප්‍රදායයන්ට අනුව මෙරට පාලන කටයුතු සිදු කිරීම
  - බෞද්ධාගම මෙරට ස්ථාපිත වීම
  - ඉන්දියානු ආභාසය මෙරට වාස්තු විද්‍යාව සහ කලාශිල්පවල දක්නට ලැබීම
  - ඉන්දියාවේ බටහිර හා නැගෙනහිර ප්‍රදේශවල ආරක්ෂාව සඳහා ශ්‍රී ලංකාවේ පිහිටීම වැදගත් වීම

**2. ඉන්දියාවෙන් වෙන් ව දූපතක් වශයෙන් පිහිටීම**

  - ස්වාධීන රාජ්‍යයක් ලෙස වර්ධනය වීම
  - ශ්‍රී ලංකාවට ආවේණික වූ සභ්‍යත්වයක් බිහි වීම හා වර්ධනය වීම
  - ඉන්දියාවට එල්ල වූ ආක්‍රමණ මුළුමනින් ම ශ්‍රී ලංකාව කෙරෙහි බලපෑම් සිදු නො වීම
    උදා - ඉන්දියාවට එල්ල වූ ආක්‍රමණ
  - ථේරවාදී බුදුදහම ප්‍රධාන ආගම බවට පත් වීම හා ආරක්ෂා වීම



සිතියම අංක 3.1.1 ශ්‍රී ලංකාව ඉන්දියාවට ආසන්න ව එහෙත් ඉන්දියාවෙන් වෙන් ව පිහිටීම

**3. ඉන්දියානු සාගරයේ මධ්‍යගත ව පිහිටීම**

- පෙර අපර දෙදිග මුහුදු ගමනාගමනයේ ප්‍රධාන මධ්‍යස්ථානයක් වීම
- මේ නිසා ශ්‍රී ලංකාව ඈත අතීතයේ සිට ම යුරෝපය, අප්‍රිකාව, අරාබිය, ආසියාව යන රටවල් සමග වෙළඳ සම්බන්ධතා පැවැත් වීම
- පෙර අපර දෙදිග අතර වෙළෙඳ මධ්‍යස්ථානයක් වීම
- ඇතැම් වෙළෙඳුන් මෙරට දේශපාලන බලය අල්ලා ගැනීම
  උදා - සේන, ගුත්තික
- විවිධ රටවල දේශාටකයින් පැමිණීම
  උදා - පාහියන් හිමි, ඉබන් බතුතා
- බටහිර ජාතීන් වෙළෙඳ ද්‍රව්‍ය ලබා ගැනීමට පැමිණීම හා බලය ලබා ගැනීම



ඡායාරූප අංක 3.1.2 ශ්‍රී ලංකාව ඉන්දියානු සාගරයේ මධ්‍යගත ව පිහිටීම

**ඇගයීම හා තක්සේරුකරණය :**

**(පහත සඳහන් නිර්ණායක ආශ්‍රයෙන් ඇගයීම හා තක්සේරුව සිදු කරන්න.)**

- ශ්‍රී ලංකාවේ බාහිර පිහිටීම විස්තර කරයි.
- ශ්‍රී ලංකාවේ බාහිර පිහිටීම ඉතිහාසය ගොඩනැගීම සඳහා දායකවී ඇති ආකාරය පෙන්වා දෙයි.
- ශ්‍රී ලංකාවේ බාහිර පිහිටීම පිළිබඳ තොරතුරු වගුගත කරයි.
- වගුව සම්පූර්ණ කිරීමට දායක වෙයි.
- නියමිත වේලාවට නිම කරයි.

**ක්‍රියාකාරකම**

1. පන්තිය කණ්ඩායම් තුනකට බෙදන්න.
2. ඇමුණුම 1හි සඳහන් වගුව හුණු පුවරුවේ සටහන් කරන්න.
3. වගුවේ සටහන් මාතෘකා තුන එක් කණ්ඩායමකට එක් මාතෘකාව බැගින් වන සේ ලබා දී හුණු පුවරුවේ සඳහන් වගුව සම්පූර්ණ කිරීමට යොමු කරන්න.
4. වගුවේ තම කණ්ඩායම්වලට අදාළ තීරුව සම්පූර්ණ කළ පසු සිසු කණ්ඩායම්වල දුබලතා ප්‍රබලතා පෙන්වා දෙමින් පාඩම සමාලෝචනය කරන්න.

ඇමුණුම් අංක 2.1.1

| ඉන්දියාවට ආසන්න ව පිහිටීම | ඉන්දියාවෙන් වෙන් ව පිහිටීම | ඉන්දියානු සාගරයේ මධ්‍යගත ව පිහිටීම |
|---|---|---|
| | | |

3

# ශ්‍රී ලංකාවේ ජනාවාස ආරම්භය හා ව්‍යාප්තිය

ශ්‍රී ලංකාවේ ජනාවාස ආරම්භය පිළිබඳ විමසා බැලීමේ දී එය ප්‍රාග් ඓතිහාසික යුගය, පූර්ව ඓතිහාසික යුගය හා ඓතිහාසික යුගය වශයෙන් හඳුනාගත හැකි ය. මෙම යුගවල දී ජනාවාස පිහිටුි වීම හා ව්‍යාප්ත වීම පිළිබඳ තොරතුරු අධ්‍යයනය කිරීම මෙම ඒකකය මගින් අපේක්ෂිත ය.

**නිපුණතාව** : 3.0 ශ්‍රී ලාංකික ඉතිහාසයේ ඓතිහාසික විකාශනය හා ප්‍රවණතා පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි

**නිපුණතා මට්ටම** : 3.1 ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික යුගය පිළිබඳ අධ්‍යයනය කරයි

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල** :

- ප්‍රාග් ඓතිහාසික යුගය පිළිබඳ තොරතුරු විස්තර කරයි.
- ප්‍රාග් ඓතිහාසික ස්ථාන නම් කරයි.
- ප්‍රාග් ඓතිහාසික යුගයේ මිනිසා ස්වාභාවික පරිසරයට අනුගත ව ජීවත් වූ ආකාරය අගය කරයි.

**ආකල්ප හා වටිනාකම්** :

- කණ්ඩායමක් ලෙස සාමූහික ව කටයුතු කිරීම
- ස්වාභාවික පරිසරයට අනුගත ව ජීවත් වීම

**ගුණාත්මක යෙදවුම්** :

- බ්‍රිස්ටල් බෝඩ්
- පෑන්, පැන්සල්, පාට පැන්සල්
- ප්‍රාග් ඓතිහාසික කරුණු අලළා ඇති රූපසටහන් පොත්වලින් කපා ගන්නා ලද රූප එකතුවක්
- පෙළපොත
- අන්තර්ජාල මගින් ගන්නා පින්තූර
- https://www.archaeology.lk.prehistory.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

**පහත සඳහන් විෂය අන්තර්ගතය ඇසුරින් පාඩම සැලසුම් කර ගන්න.**

**3. ශ්‍රී ලංකාවේ ජනාවාස ආරම්භය හා ව්‍යාප්තිය**

**3.1 ප්‍රාග් ඓතිහාසික යුගය**

- ශ්‍රී ලංකාවේ ලිඛිත ඉතිහාසයක් ආරම්භ වීමට පෙර යුගය ප්‍රාග් ඓතිහාසික යුගය ලෙස හැඳින්වීම
- මෙම යුගය ගල් යුගය, දඩයම් යුගය ලෙස ද හැඳින්වීම
- දඩයමින් ජීවත් වීම මෙම යුගයේ ප්‍රධාන ලක්ෂණය වීම
- ජනාවාස තෝරා ගැනීමේ දී ආහාර හා ජලය සපයා ගැනීමේ පහසුව පිළිබඳ සොයා බැලීම

උදා: -

උතුරු ප්‍රදේශයේ මාන්කුලම්, පොම්පරිප්පු, ඉරණමඩු

- ජනාවාසවල ස්වභාවය

  - ස්වාභාවික ගල්ගුහාවල ජීවත්වීම
  (උදා: - පාහියංගල, කුරුවිට බටදොඹ ලෙන, කිතුල්ගල බෙලිලෙන)
  - බොහෝ විට වියළි කාලවල දී විවෘත ස්ථානවල පිහිටි තම දඩයම් ස්ථාන ආශ්‍රිතව ජීවත් වීම
  (උදා: - බණ්ඩාරවෙල, වැලිමඩ)



ඡායාරූප අංක 3.1.1 ගල් යුගයේ මිනිසා සිය වාසස්ථාන ලෙස භාවිත කළ බටදොඹලෙන


*මූලාශ්‍රය: http://serendib.btoptions.lk/article.php?id=1780*

- මානවයාගේ ජීවන රටාව

  - දඩයම ප්‍රධාන ජීවනෝපාය වීම
  - විවිධ හැඩවලින් යුත් ශිලා අවි භාවිත කිරීම
    (ත්‍රිකෝණාකාර, කවාකාර, ත්‍රිපිසමයාකාර)
  - ශිලා අවි තැනීම සඳහා තිරුවානා හා කහඳ ගල් භාවිත කිරීම
  - ඇඹරුම් ගල්වල ධාන්‍ය ඇඹරීම
  - සතුන්ගේ ඇට හා අංවලින් ද ආයුධ සැකසීම
  - අනුභව කළ මාංස ආහාර
    (ඉත්තෑවුන්, දඬුලේනුන්, වඳුරන්, ගොළුබෙල්ලන්, වල් ඌරන්, මුවන්)
  - අනුභව කළ ධාන්‍ය හා වෙනත් ඇට වර්ග
  - (කිතුල්, දෝතලු, කැලෑ දෙල් ඇට, කැකුණ ඇට)

- අභිචාර විධි

  - මේ පිළිබඳ තොරතුරු මළවුන් තැම්පත් කිරීම ඇසුරින් පැහැදිලි කළ හැකි ය. යමෙකු මිය ගිය විට මළ සිරුර ඉවතට ගෙන ගොස් දමා ශරීරය දිය වූ පසු එහි අස්ථි කොටස් ගෙනවුත් වර්ණ ගන්වා මිහිදන් කිරීම සිදු වේ.



ඡායාරූප අංක 3.1.2 ගල් යුගයේ මිනිසෙකුගේ ඇටසැකිල්ලක්

**ඇගයීම හා තක්සේරුකරණය :**

පහත නිර්ණායක ඇසුරින් ඇගයීම හා තක්සේරුව සිදු කරන්න.

- ප්‍රාග් ඓතිහාසික ජනාවාස පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.
- පැරණි මුතුන් මිත්තන් ස්වාභාවික පරිසරයට අනුගත ව ජීවත් වූ ආකාරය අගය කරයි.
- ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් තොරතුරු රැස් කරයි.
- කණ්ඩායමක් ලෙස වැඩ කරයි.
- නියමිත කාලයක දී ක්‍රියාකාරකම සිදු කරයි.

ඉහත තොරතුරු ආවරණය වන පරිදි සිසුන් සමග පාඩම සාකච්ඡා ස්වරූපයෙන් මෙහෙයවා පහත ක්‍රියාකාරකමෙහි යොදවන්න.

- මෙය කණ්ඩායම් ක්‍රියාකාරකමක් ලෙස සිදු කරන්න.
- පුවත්පත් හෝ ඕනෑම මාධ්‍යයක් මගින් ප්‍රාග් ඓතිහාසික තොරතුරු ඇතුළත් ලිපි, රූපසටහන් ආදිය රැස් කර ගැනීමට උපදෙස් දෙන්න.
- කණ්ඩායම විසින් රැස් කළ තොරතුරු හා රූපසටහන් බ්‍රිස්ටල් බෝඩ් එකක අලවා වඩාත් නිර්මාණශීලි ව පන්තියේ ප්‍රදර්ශනය කිරීමට සුදුසු ආකාරයට සකසා ගැනීමට උපදෙස් දෙන්න.
- මේ සඳහා සතියක පමණ කාලයක් ලබා දෙන්න.
- නියමිත දිනයේ දී කණ්ඩායම් ක්‍රියාකාරකම පන්තියේ ප්‍රදර්ශනය කිරීමට සිසුන් උනන්දු කරවන්න.
- නිර්ණායක ඇසුරින් ඇගයීම හා තක්සේරුකරණය කරන්න.

## 3.2 පූර්ව ඓතිහාසික යුගය

**නිපුණතා මට්ටම** : 3.2 පූර්ව ඓතිහාසික යුගය පිළිබඳව අධ්‍යයනය කරයි

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල** :

- පූර්ව ඓතිහාසික යුගය යන්න පැහැදිලි කරයි
- පූර්ව ඓතිහාසික යුගයේ මූලික ලක්ෂණ විස්තර කරයි
- පූර්ව ඓතිහාසික ජනාවාස බිහි වූ ප්‍රදේශ නම් කරයි

**ආකල්ප හා වටිනාකම්** :

- මිනිසාගේ සංස්කෘතික පරිණාමයේ ක්‍රමික විකාශනය වටහා ගැනීම.
- අවශ්‍යතා මත අභියෝග ජය ගනිමින් කටයුතු කිරීම පිළිබඳ දැනුවත් වීම.

**ගුණාත්මක යෙදවුම්** :

- ඇමුණුම් අංක 3.2.1
- A4 කඩදාසි
- ගම්
- කතුරු
- https://www.archaeology.lk/tag/protohistory
- www.lankalibrary.com/geo/dera1.html

**පාඩම සැලසුම් සඳහා උපදෙස් :**

පහත විෂය අන්තර්ගතය ඇසුරින් පාඩම සැලසුම් කර ගන්න.

**3.2 පූර්ව ඓතිහාසික යුගය**

- මූලාශ්‍රය, ජනප්‍රවාද ස්වරූපයක් ගැනීම
- ප්‍රාග් ඓතිහාසික යුගයේ අවසානයත්, ඓතිහාසික යුගයේ ආරම්භයත් අතර කාලය පූර්ව ඓතිහාසික යුගය ලෙස හැඳින්වීම
- මෙම යුගය ප්‍රාථමික යකඩ යුගය ලෙස ද හැඳින්වීම
- යකඩ භාවිතය, කෘෂිකර්මාන්තයට නැඹුරු වීම, ස්ථිර වාසස්ථාන තනා ගැනීම මෙම යුගයේ සුවිශේෂත්වය වීම
- මෙම යුගය තුළ දිවයිනේ සෑම පරිසර කලාපයකින් ම ජනාවාස හමුවීම
- සුසාන භූමි ඇසුරින් එම තොරතුරු හමුවීම



ඡායාරූපය: 3.2.1 දඹුල්ලට නුදුරු ඉබ්බන්කටුව සුසාන භූමියෙන් හමු වූ ශිලා මංජුසා වර්ගයේ සොහොනකි. මෙම සුසාන ගර්භය තුළ මිනිස් භෂ්මාවශේෂ සහිත මැටි බඳුන් තැම්පත් කොට තිබේ.



ඡායාරූපය: 3.2.2 සබරගමුව පළාතට අයත් රත්නපුර දිස්ත්‍රික්කයේ කොළඹගෙආර රංචාමඩම රජයේ විද්‍යාල භූමියේ පිහිටි පූර්ව ඓතිහාසික සොහොන් බිමක්.

- ජනාවාසවල ස්වභාවය

    - ස්ථිර ජනාවාස හා වාසස්ථාන ගොඩනැගීම
    - නිවාස තැනීම
    - නිවස ඇතුළත කොටස්වලට වෙන් කර තිබීම



ඡායාරූපය: 3.2.3 අනුරාධපුර පැරණි ඇතුළු නුවර සිදු කරන ලද කැණීමකින් සොයාගන්නා ලද ආයත චතුරස්‍රාකාර බිම්සැලැස්මකින් යුත් නිවාසයකට අයත් ව තිබූ කණු වළවල් කිහිපයක්

- ජීවන රටාව

    - ජීවිතය සංවිධානාත්මක ස්වරූපයකට ගොඩනැගී තිබීම
    - ආහාර නිෂ්පාදනය හෙවත් ගොවිතැනට යොමුවීම
      (වී වගාව, ධාන්‍ය හා අල වර්ග වගා කිරීම, පලතුරු හා එළවළු වගාව)
    - සිප්පි කටු හා සත්ත්ව ඇට කටු ආදියෙන් ආභරණ තනා ගැනීම

- තාක්ෂණය

    - ලෝහ භාවිතයෙන් උපකරණ නිෂ්පාදනය
    - ගල් හා යකඩ මෙවලම් භාවිතය
    - වළං තැනීම හා පින්තාරු කිරීම



ඡායාරූපය : 3.2.4
උඩරංචාමඩමේ පැරණි නිවාසයකින් සොයාගන්නා ලද පින්තාරු කළ මැටි බඳුන.



ඡායාරූපය: 3.2.5
ඉබ්බන්කටුව සුසාන භූමියෙන් සොයා ගන්නා ලද මෙම මාලය ක්‍රිස්තු පූර්ව 700 - 450 අතර කාලයට අයත් වූවකි. පබළු මාලයක් වූ මෙහි දක්නට තිබෙන ඇතැම් පබළු ආනයනය කරන ලද ඒවා යි.

**ඇගයීම හා තක්සේරුකරණය :**

- පූර්ව ඓතිහාසික යුගයේ ජනාවාස පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.
- පූර්ව ඓතිහාසික යුගයට අයත් පින්තූර නිවැරැදි ලෙස වර්ග කරයි.
- පූර්ව ඓතිහාසික මිනිසාගේ සංස්කෘතික පරිණාමය අගය කරයි.
- කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කරයි.
- වඩා ආකර්ශණීය ව තොරතුරු ද ඇතුළත් කරමින් පොත සකසයි.

ඉහත තොරතුරු ආවරණය වන පරිදි පින්තූර සහිත පොතක් සකස් කිරීමට පහත ක්‍රියාකාරකමෙහි යොදවන්න.

- මෙය කණ්ඩායම් ක්‍රියාකාරකමක් ලෙස යොදා ගන්න.
- ඇමුණුම 3.21 හි දී ඇති රූප සටහන් ඇසුරින් සුසාන, නිවාස, මැටි භාජන හා පළඳනා වෙන් වෙන් ව කපා ගන්න.
- ඒවා කුඩා පොතක් සකස් කර $A_4$ ප්‍රමාණයේ කඩදාසි දෙකකට නවා මෙම පොත සකසන්න.) වඩාත් ආකර්ශණීය ව පින්තූර අලවා ගන්න. රූපසටහනට අදාළ තොරතුරු පිළිබඳව කෙටි හැඳින්වීමක් කරන්න. උදා - සුසානයක් නම් එය හමු වූ ස්ථානය හා එහි සුවිශේෂත්වය ආදී වශයෙන්
- කුඩා පොත සකස් කර පන්තියට ඉදිරිපත් කරවන්න.
- මෙම ක්‍රියාකාරකම සඳහා එක් කාල පරිච්ඡේදයක් යොදා ගන්න.
- ඉහත නිර්ණායක ඇසුරින් ඇගයීම හා තක්සේරුකරණය සිදු කරන්න.

ඇමුණුම් අංක 3.2.1









## 3.3 ඓතිහාසික යුගය

**නිපුණතා මට්ටම** : 3.3 ජනාවාස ආරම්භය හා ව්‍යාප්තිය අධ්‍යයනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල** :

- ඓතිහාසික යුගය යන්න පැහැදිලි කරයි.
- ශ්‍රී ලංකාවේ ඓතිහාසික යුගයේ ජනාවාස ව්‍යාප්තිය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.
- ජනාවාස ව්‍යාප්ත වූ ප්‍රදේශ ශ්‍රී ලංකා සිතියමක් මගින් පෙන්වා දෙයි.

**ආකල්ප හා වටිනාකම්** :

- ඉතිහාසය ක්‍රමික විකාශනයක, සිදුවීම් මාලාවක එකතුවක් බව අවබෝධ වීම.

**ගුණාත්මක යෙදවුම්** :

- ඇමුණුම් අංක 3.3.1 (ලංකා සිතියම)
- ඇමුණුම් අංක 3.3.2

**පාඩම සැලසුම සඳහා උපදෙස්** :

පහත විෂය අන්තර්ගතය ඇසුරින් පාඩම සැලසුම් කර ගන්න.

**3.3 ඓතිහාසික යුගයේ ජනාවාස**

ලිඛිත සාධක සහිත යුගය ඓතිහාසික යුගය ලෙස හැඳින්වේ. එනම්, විජය ඇතුළු කණ්ඩායම පැමිණීමට පෙර මෙරට ජනාවාස තිබූ බවට සාධක හමුවී ඇත.

- මූලාශ්‍රය ජනප්‍රවාද ස්වරූපයක් ගෙන ඇති බව
- කුවේණිය සම්බන්ධ කතා පුවත
- යකුන් දමනයට බුදුන් මහියංගනයට වැඩම වීම
- නාග රජුගේ ප්‍රශ්නය විසඳීමට බුදුන් කැලණියට වැඩම වීම
- ලංකාපුර හා සිරිසමත්ථපුර වැනි නගර පැවතීම
- වෙළෙඳාම හා කෘෂිකර්මාන්තය පැවතීම (කපු කැටීම, රෙදි විවීම)
- විජය කුමරු ඇතුළු පිරිස මෙරටට පැමිණ පිහිට වූ ජනාවාස ශ්‍රී ලංකාවේ ඓතිහාසික යුගයේ මුල් ම ජනාවාස ලෙස පිළිගැනේ.

- ඉන්පසු වරින් වර ඉන්දියානු ජන කණ්ඩායම් පැමිණ මෙරට ජනාවාස පිහිටු වූහ. එනම්,

  * විජය ඇතුළු පිරිස කැඳවා ගත් භාර්යාවන්
  * පඬුවස් දෙව් ඇතුළු පිරිස
  * භද්දකච්ඡායනා ඇතුළු පිරිස
  * භද්දකච්ඡායනාගේ සොහොයුරන් පිරිස

- සිරිත් විරිත් යටතේ උත්සව පැවැත්වීම

  - සංගීතය හා ගායනය දැන සිටීම
  - නාග හා යක්ෂ වන්දනය මෙන් ම බුදු දහම පිළිබඳව ද දැන සිටින්නට ඇත (බුදුන් තෙවරක් ලක්දිවට වැඩම වීම)


- ජනපද පිහිටුවීමට බලපෑ සාධක

  - ප්‍රධාන ජීවනෝපාය කෘෂිකර්මාන්තය වීම
  - ගොවිතැනට හිතකර ප්‍රදේශ වියළි කලාප වීම
  - තැනිතලා බිම් පිහිටීම
  - සරුපස හා ජල පහසුවක් තිබීම
  - වාර්ෂික වර්ෂාපතන අගය

- ජන සංක්‍රමණිකයින් පිහිටුවා ගත් ජනාවාස

  - අනුරාධ ග්‍රාමය - මල්වතු ඔය අසල
  - උරුවෙල ග්‍රාමය - කලා ඔය අසල
  - උපතිස්ස ග්‍රාමය - කනදරා ඔය අසල
  - විජිත ග්‍රාමය - කලා ඔය හෝ මහවැලි ගංගා නිම්නය අසල
  - තම්බපණ්ණි ග්‍රාමය - උදේනි ග්‍රාමය
  - රාම ගෝණ - මහවැලි ගංමෝය අසල
  - දීඝායු ග්‍රාමය - ගල් ඔය අසල (වර්තමාන)

* මෙම ජනපද වයඹ, නැගෙනහිර හා ගිනිකොන දෙසට වන්නට පිහිටුවා ගැනීම
* පසු කාලීනව බටහිර දෙස කල්‍යාණි ජනපදය ද
* මැණික් ගඟ අසල කාචරගාම ජනපදය ද
* ගිනිකොන ප්‍රදේශයේ චන්දනගාම ජනපදය ද පිහිටුවා ගැනීම.




සිතියම: 3.3.1 ඓතිහාසික යුගයේ මුල් ජනාවාස

» පිහිට වූ ජනාවාස හඳුන්වා ඇත්තේ ගාම ලෙස ය.

» එහි පාලකයා ගාමිණී ය.

» පසුකාලීන ව ගාමිණීවරු අතරින් බලවත් වූ අයෙකු රජ ලෙස පත් වී ඇත.

- ආර්ථික

  - ප්‍රධාන ජීවනෝපාය කෘෂිකර්මාන්තය යි.
  - ඊට අමතර ව සත්ත්ව පාලනය හා වෙළඳාම යි.


**ඇගයීම හා තක්සේරුකරණය :**

- ඓතිහාසික යුගයේ ජනාවාස නම් කරයි.
- ඓතිහාසික යුගයේ ජනාවාස සිතියමක ලකුණු කරයි.
- ස්ථාන නිවැරැදි ව පැහැදිලි ව ලකුණු කරයි.
- සිතියම් ලකුණු කිරීමේ ක්‍රමවේද භාවිත කරයි.
- නියමිත කාලයට නිම කරයි.

ඉහත කරුණු ආවරණය වන සේ පාඩම පැහැදිලි කොට පහත ක්‍රියාකාරකමෙහි සිසුන් යොදවන්න.

- මුල් ජනාවාස පැවති ප්‍රදේශ සිතියමක ලකුණු කිරීමට යොමු කරවන්න.
- මෙය කේවල ක්‍රියාකාරකමක් ලෙස සිදු කරන්න.
- පන්තියේ සියලු ම සිසුන් ඇමුණුම 01 සිතියමෙහි, ඇමුණුම 2හි සඳහන් ස්ථාන ලකුණු කිරීමට යොමු කරන්න.
- සිසුන් ලකුණු කළ සිතියම් ඇගයීමට ලක් කරන්න.
- නිර්ණායක ඇසුරින් තක්සේරුව හා ඇගයීම සිදු කරන්න.

ඇමුණුම් අංක 3.3.1



**ඇමුණුම් අංක 02**

| |
|---|
| අනුරාධ ගාම, උරුවේල ගාම, උපතිස්ස ගාම, රාමගෝණ, දීඝගාම, කාචරගාම |

# 4
# අපේ කීර්තිමත් රජවරු

අතීත ශ්‍රී ලංකාව ඉතා සශ්‍රීක අභිමානවත් රටක් ලෙස ප්‍රසිද්ධ ය. එවැනි යුගයක් බිහි කිරීමට දායක වූ අනුරාධපුර යුගයට අයත් රජවරුන් පිළිබඳ අධ්‍යයනය කිරීම මෙම ඒකකයෙන් අපේක්ෂිත ය.

**නිපුණතාව** : ශ්‍රී ලාංකික ඉතිහාසයේ ඓතිහාසික විකාශනය හා ප්‍රවණතා පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි.

**නිපුණතා මට්ටම** : 4.1 පණ්ඩුකාභය කුමරු අභියෝග ජය ගනිමින් රාජ්‍යයත්වයට පත් වූ ආකාරය විමසා බලයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල** :

- මූලාශ්‍රය ජනප්‍රවාද ස්වරූපයක් ගෙන ඇති බව තේරුම් ගනියි.
- පණ්ඩුකාභය රජුගේ ළමා කාලය පිළිබඳව තොරතුරු විස්තර කරයි.
- පණ්ඩුකාභය කුමරු මුහුණ දුන් අභියෝග පෙන්වා දෙයි.
- අභියෝග ජය ගැනීම සඳහා පණ්ඩුකාභය චරිතයෙන් ගත හැකි ආදර්ශ විස්තර කරයි.

**ආකල්ප හා වටිනාකම්** :

- අරමුණ කරා අධිෂ්ඨානශීලී ව ගමන් කිරීම
- අභියෝගවලට ශක්තිමත් ව මුහුණු දී ඒවා ජය ගැනීම
- උපාය කෞශල්‍යයෙන් යුක්ත වීම
- ඉවසීම

**ගුණාත්මක යෙදවුම්** :

- ඇමුණුම් අංක 4.1.1
- mahavamsa.org/2008/05/king-pandukabhaya-437-bc-367-bc
- www.lankalibrary.com/geo/kings/pandukabhaya.htm

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

**පහත විෂය කරුණු ඇසුරින් පාඩම සැලසුම් කර ගන්න.**

**4.1 පණ්ඩුකාභය රජතුමා**

- ළමා කාලය

- පණ්ඩුකාභය කුමරුගේ දෙමාපියන් පිළිබඳ කථා පුවත්
    - පඬුවස්දෙව් රජුගේ දියණිය වූ උන්මාද චිත්‍රා හා දීඝායුගේ පුත් දීඝගාමිණී කුමරු දෙමාපියන් වීම
    - මව කුමරු උපන් මොහොතේ දී ම උපක්‍රමශීලී ව දොරමඬලා ගමට පිටත් කිරීම
    - කුමරුගේ දෙමාපියන් පිළිබඳ කථා පුවත් ඉදිරිපත් කිරීම

- පණ්ඩුකාභය කුමරු උපන් මොහොතේ සිට මුහුණ දුන් අභියෝග
    - උපන් අවස්ථාවේ රජ මාලිගාවෙන් පිට මං කිරීම
    - දොරමඬලාවට ගෙන යන විට කුමරු මැරීමට තැත් කිරීම
    - කුමරු විලක ක්‍රීඩා කරන අවස්ථාව
    - දොළොස් වියේ දී ගොපලු දරුවන් හා සෙල්ලම් කරන අවස්ථාව
    - රාජ්‍යත්වයට පත් වීම
    - සේනා සංවිධානය කිරීම හා සටන් මෙහෙය වීම
    - අනුරාධපුරය පාලන මධ්‍යස්ථානය කර ගනිමින් රාජ්‍යයත්වයට පත් වීම
    - අනුරාධ ග්‍රාමය අග නගරය බවට පත් කොට අනුරාධපුරය ලෙස නම් කිරීම
    - නගරය විධිමත් සැලැස්මකට ගොඩනැගීම
    - මුළු දිවයිනේ ම ග්‍රාම සීමා නියම කිරීම
    - බසවක්කුලම (අභය වැව), ජය වැව නිර්මාණය කිරීම
    - ආගමික කටයුතු
    - ආගමික සහනශීලි ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම

- පාලනය
    - වසර හැත්තෑවක් පාලනය ගෙන ගොස් තිබේ



ඡායාරූපය: 4.1.1 පණ්ඩුකාභය රාජ්‍යය සමයේ ඉදිකරන ලද අභය වැව වර්තමානයේ දිස්වෙන අයුරු

**ඇගයීම හා තක්සේරුකරණය :**

පහත නිර්ණායක ඇසුරින් ඇගයීම හා තක්සේරුව සිදු කරන්න.

- පණ්ඩුකාභය රජු මුහුණ දුන් අභියෝග විස්තර කරයි.
- අභියෝග ජය ගත් ආකාරය පෙන්වා දෙයි.
- පණ්ඩුකාභය වීර චරිතයක් ලෙස අභිමානයෙන් කතා කරයි.
- වඩා නිර්මාණශීලී ව කතාව ඉදිරිපත් කරයි.
- නියමිත වෙලාවට අවසන් කරයි.

ඉහත විෂය කරුණු ආවරණය වන සේ කතාන්දරයක් පන්තියට ඉදිරිපත් කිරීමට සිසුන් යොමු කර වන්න.

- ඇමුණුම් අංක 4.1.1හි මාතෘකාව හුණු පුවරුවේ සටහන් කර ඊට අනුව කථාවක් පන්තියට ඉදිරිපත් කරවීමට සිසුන් යොමු කරවන්න.
- මෙය කේවල ක්‍රියාකාරකමක් ලෙස යොදා ගන්න.
- පන්තියේ සියලු ම සිසුන් මේ සඳහා යොමු කරන්න.
- කතන්දරය සූදානම් කර ගැනීමට විනාඩි 5ක පමණ කාලයක් ලබා දෙන්න.
- කතන්දර අතරින් වඩාත් සාර්ථක කතාව තෝරන්න.
- නිර්ණායක ඇසුරින් ඇගයීම හා තක්සේරුකරණය සිදු කරන්න.

**ඇමුණුම් අංක 4.1.1**

- පණ්ඩුකාභය කුමරුගේ ළමා කාලය සටහන් කිරීම හා රාජ්‍යත්වයට පත් වීම යන මාතෘකා අතරින් එක් මාතෘකාවක් තෝරා ගන්න. එය පහත කරුණු අඩංගු වන පරිදි විනාඩි 3 පමණ කතාවක් සූදානම් කර පන්තියට ඉදිරිපත් කරන්න.

    i. මුහුණ දුන් අභියෝග
    ii. අභියෝග ජය ගැනීම

**නිපුණතා මට්ටම** : 4.2. ශ්‍රී ලංකාවට බුදු දහම ගෙන ඒම හා ස්ථාපිත කිරීමෙහි ලා දේවානම්පියතිස්ස රජුගේ සේවය මතු කර දක්වයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල** :

- ඉන්දියාව හා ලංකාව අතර සබඳතා විස්තර කරයි.
- ලංකාවට බුදු දහම ලැබුණු අයුරු විස්තර කරයි.
- දේවානම්පියතිස්ස රජුගේ ඓතිහාසික සේවා ව පැහැදිලි කරයි.
- බුදුදහම ආභාසයෙන් ශ්‍රී ලාංකික සමාජය පෝෂණය වූ අයුරු පෙන්වා දෙයි.

**ආකල්ප හා වටිනාකම්** :

- බුදු දහමින් ගුණ ගරුක සමාජයක් ගොඩනැගීම.
- බුදු දහම නිසා වටිනා සංස්කෘතියක් උරුම වීම.

**ගුණාත්මක යෙදවුම්** :


- ඇමුණුම් අංක 4.2.1

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

**4.2 දේවානම්පියතිස්ස රජතුමා**

- ශ්‍රී ලංකාව හා ඉන්දියාව අතර සබඳතා
    - මුටසීව රජුගෙන් පසු ඔහුගේ දෙවන පුත්‍රයා වූ තිස්ස කුමරු බලයට පත් වීම
    - තිස්ස රජුට සමකාලීන ව ඉන්දීය පාලකයා අශෝක රජු වීම
    - තිස්ස රජු හා අශෝක රජු අතර සබඳතා
    - තිස්ස රජුගේ මෞර්ය අභිෂේකය
    - තිස්ස රජුට දෙවනපිය විරුද නාමය ලැබීම
- මහින්දාගමනය හා ලක්දිව බුදු දහම පිහිටුවීම
    - බු.ව. 236 (ක්‍රි.ව. 247) මිහිඳු හිමි ඇතුළු දූත කණ්ඩායම ලක්දිවට වැඩම වීම
    - දඩයමේ යෙදී සිටි රජුට මිස්සක පව්වේ දී මිහිඳු හිමි මුණ ගැසීම

- රජු හා මිහිඳු හිමි අතර ඇති වූ සංවාදයෙන් රජුගේ බුද්ධිය විමසීම
- චූල්ල හත්ථි පදෝපම සූත්‍රය දේශනා කිරීම
- දේවානම්පියතිස්ස රජු බුදු දහම වැළඳ ගැනීම
- සංඝමිත්තා තෙරණිය සමග ශිල්ප ශ්‍රේණි පැමිණීම
- මෙහෙණි සස්න පිහිටු වීම
- වෙස්සගිරිය, ජම්බුකෝල විහාරය, මහාපාලි දාන ශාලාව, හත්ථාල්හක මෙහෙණවර ගොඩනැගීම



ඡායාරූපය: 4.2.1 මිහිඳු හිමි ඇතුළු පිරිස සහ තිස්ස රජු හමු වූ මිහින්තලය වර්තමානයේ දිස්වන අයුරු



ඡායාරූපය: 4.2.2 වෙස්සගිරිය




ඡායාරූපය: 4.2.3 මහාපාලි දාන ශාලාව

- දේවානම්පියතිස්ස රජුගේ අනුග්‍රහය යටතේ මිහිඳු හිමි සිදු කළ ආගමික සේවය.
    - භණ්ඩුක උපාසක පැවිදි කොට ලක්දිවට පැවිද්ද හඳුන්වා දීම
    - මහමෙවුනා පූජාව පිළි ගැනීම
    - මහා විහාරය පිහිටු වීමට උපදෙස් දීම
    - ප්‍රථම වස් විසීම, චේතියගිරියේ දී ප්‍රථමවරට වස් වැසීම

- මහමෙවුනා උයනේ ශ්‍රී මහා බෝධිය රෝපණය කිරීම
- අරිට්ඨ කුමරු පැවිදි කිරීම
- මහා විහාරය සීමා සලකුණු කිරීම

- ආගමික ක්ෂේත්‍රයේ ඇති වූ පරිවර්තනය

  - වෘක්ෂ වන්දනාව බෝධි වන්දනාව බවට පත් වීම
  - පර්වත වන්දනාව ස්තූප වන්දනාව බවට පත් වීම
  - ගිනි පූජාව පහන් පූජාව බවට පත් වීම
  - මළවුන් පිදීම දානමය පිංකම බවට පත් වීම
  - බමුණන්ට තිබූ ආගමික පසුබිම බුදු දහමට ලැබීම
  - (භික්ෂූන්ට) සංවිධානාත්මක ආගමක් හිමි වීම

- සමාජීය පරිවර්තනය

  - සතර සංග්‍රහ වස්තුව පිළිපදින සමාජයක් බිහි වීම
  - උපතේ සිට මරණය දක්වා සෑම අවස්ථාවක ම බුදු දහමේ ආශිර්වාදය ලබා ගැනීම

- සංස්කෘතික දියුණුව, භාෂාව හා සාහිත්‍යය

  ✳ අක්ෂර මාලාව, ත්‍රිපිටකය ඇතුළු අටුවා සාහිත්‍යය

**චිත්‍ර කලාව**

- සීගිරි චිත්‍ර, අනුරාධපුර වාහල්කඩ චිත්‍ර



ඡායාරූපය 4.2.4 සීගිරියේ චිත්‍ර

කැටයම් හා මූර්ති

- සඳකඩ පහණ, දොරටු පාල රූප, කොරවක් ගල්, ඉසුරුමුණි පෙම් යුවල, බුදු පිළිම නෙළීම



ඡායාරූපය: 4.2.5 සඳකඩපහණ



ඡායාරූපය: 4.2.6 ඉසුරුමුණිය පෙම් යුවල

**ගෘහ නිර්මාණ**

පෝය ගෙවල්, රෝහල්, නාන පොකුණු, වැසිකිළි කැසිකිළි, ස්තූප, වටදා ගෙවල්, පටිමාඝර, පධානඝර



ඡායාරූපය: 4.2.7 මිහින්තලේ රෝහල් සංකීර්ණයෙහි නටබුන්

**ඇගයීම හා තක්සේරුකරණය :**

- බුදු දහමින් ලද දායාද නම් කරයි
- බුදු දහමින් ලද දායාද අගය කරයි
- නිවැරැදි ව වගුව සම්පූර්ණ කරයි
- නියමිත වේලාවට අවසන් කරයි
- සාමූහික හැඟීමෙන් කටයුතු කරයි

ඉහත කරුණු ආවරණය වන සේ ඇමුණුම 4.2.1 වගුව සම්පූර්ණ කිරීමට සලස්වන්න.

ඇමුණුම් අංක 4.2.1

දේවානම්පියතිස්ස රජුගේ කාලයේ සිදුවූ පහත වගුව යටතේ සම්පූර්ණ කරන්න.

» මෙය කණ්ඩායම් ක්‍රියාකාරකමක් සේ යොදා ගන්න.
» පන්තියට සුදුසු පරිදි කණ්ඩායම් කරන්න.
» ඇමුණුම 4.2.1හි සඳහන් වගුව හුණු පුවරුවේ සටහන් කර කණ්ඩායම්වලට එය පිටපත් කර ගෙන සම්පූර්ණ කිරීමට උපදෙස් දෙන්න. මේ සඳහා විනාඩි 15 පමණ කාලයක් ලබා දෙන්න.

| අශෝක රජුගෙන් ලැබුණු දේශපාලන දායාද | ආගමික සේවය | සමාජීය වෙනස්වීම | සංස්කෘතික වෙනස්වීම |
|---|---|---|---|
| | | | |

**නිපුණතා මට්ටම** : 4.3 දුටුගැමුණු රජතුමාගේ ශ්‍රේෂ්ඨත්වය පෙන්වා දෙයි

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල** :

- කාවන්තිස්ස රජුගේ දූර දර්ශී ක්‍රියාකලාපය විස්තර කරයි.
- දුටුගැමුණු රජතුමාගේ ශ්‍රේෂ්ඨත්වය පැහැදිලි කරයි.
- යහපත් නායකත්වයේ ලක්ෂණ පෙන්වා දෙයි.

**ආකල්ප හා වටිනාකම්** :

- දූර දර්ශී ව කටයුතු කිරීම
- දේශ හිතෛෂී භාවය වර්ධනය වීම.
- නායකයෙකුගේ වගකීම් පිළිබඳ හඳුනා ගැනීම.

**ගුණාත්මක යෙදවුම්** :

- mail. mahawamsa.org/mahawamsa/simplifiedvision/kingh dutugamunu
- www.lankalibrary.com/geo/king/dutugamunu.htm

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

පහත විෂය අන්තර්ගතය ඇසුරින් පාඩම සැලසුම් කර ගන්න.

4.3 **දුටුගැමුණු රජතුමා**

- දුටුගැමුණු රජතුමාගේ ළමා කාලය
  - දෙමාපියන්
  - ළමා කාලය හා සම්බන්ධ කථා පුවත්

- කාවන්තිස්ස රජුගේ මෙහෙවර
  - කාවන්තිස්ස රජු රෝහණ රාජ්‍යයේ පාලකයා
  - සමකාලීන අභියෝග ජය ගැනීම සඳහා කාවන්තිස්ස රජතුමා ක්‍රියා කළ ආකාරය
    - ✵ සේනා සංවිධානය
    - ✵ රුහුණ එක්සත් කිරීම
    - ✵ ආර්ථික සමෘද්ධිය ඇති කිරීම
    - ✵ සුදුසු කාලය එළඹෙන තුරු බලා සිටීම
    - ✵ අවි ආයුධ නිෂ්පාදනය

- දුටුගැමුණු රජුගේ යුධ කටයුතු හා දිවයින එක්සේසත් කිරීම

  - විදේශ ආධිපත්‍යයෙන් රට මුදා ගැනීම ප්‍රධාන අරමුණ වීම
  - සේනාව සංවිධානය කර යුද්ධය මෙහෙය වීම
  - යුද්ධය ජය ගැනීම හා දිවයින ප්‍රථම වරට එක්සේසත් කිරීම

- ආගමික කටයුතු

  - වෙහෙර විහාර ඉදි කිරීම
  - රුවන්වැලි සෑය, මිරිස වැටි ස්තූපය, ලෝවාමහාපාය ගොඩනැගීම
  - මහියංගණ ස්තූපය ප්‍රතිසංස්කරණය කිරීම
  - වෙසක් පෝ දින උත්සව පැවැත් වීම
  - මහා විහාරයට අනුග්‍රහය දැක් වීම.



ඡායාරූපය 4.3.1 රුවන්වැලි මහාසෑය



ඡායාරූපය 4.3.2 මහියංගණ ස්තූපය

- ආර්ථික කටයුතු

  - තිස්ස කුමරු දිගාමඩුලු ප්‍රදේශයේ කෘෂිකාර්මික සංවර්ධනය සඳහා යෙද වීම
  - දසමහා යෝධයන් කෘෂිකර්මාන්තයේ මෙහෙය වීම
  - දියුණු විදේශ වෙළෙඳාමක් ක්‍රියාත්මක වීම
  - අවි ආයුධ නිෂ්පාදනය දියුණු තත්ත්වයක පැවතීම

**ඇගයීම හා තක්සේරුකරණය :**

- කාවන්තිස්ස රජුගේ කාර්යභාරය විස්තර කරයි.
- දුටුගැමුණු රජතුමාගේ ශ්‍රේෂ්ඨත්වය අගය කරයි.
- කාවන්තිස්ස හා දුටුගැමුණු චරිතවලින් ගත හැකි ආදර්ශ පෙන්වා දෙයි
- රචනාව වඩාත් ආකර්ශණීය ව ගොඩනගයි.
- ක්‍රියාකාරකම නියමිත කාලයේ දී නිම කරයි.

ඉහත විෂය කරුණු ආවරණය වන සේ දුටුගැමුණු රජතුමා පිළිබඳ රචනයක් ලිවීමට සිසුන් යොමු කරවන්න.

- මෙය කේවල ක්‍රියාකාරකමක් ලෙස යොදා ගන්න.
- පන්තියේ සියලු ම සිසුන්ට දුටුගැමුණු රජතුමා පිළිබඳ රචනයක් ලිවීමට උපදෙස් දෙන්න.
- දුටුගැමුණු රජු රට එක්සේසත් කිරීම, ඒ සඳහා පිය රජුගෙන් ලැබූ අනුග්‍රහය, එතුමාගේ ආගමික සේවා ව ආදි තොරතුරු ඇතුළත් කර රචනය ලිවීමට උපදෙස් ලබා දෙන්න.
- මේ සඳහා දින දෙකක පමණ කාලයක් ලබා දෙන්න.
- නියමිත දිනයේ දී රචනා පරීක්ෂා කර අඩුපාඩු සකස් කරන්න.
- නිර්ණායක ඇසුරින් ඇගයීම හා තක්සේරුව සිදු කරන්න.

**නිපුණතා මට්ටම** : වළගම්බා රජුගේ ශ්‍රේෂ්ඨත්වය විස්තර කරයි

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල** :

- වළගම්බා රජතුමා රාජ්‍යත්වයට පත් වූ ආකාරය පැහැදිලි කරයි.
- වළගම්බා රජතුමාගේ සාසනික සේවා ව විස්තර කරයි.
- වළගම්බා රජතුමාගේ චරිතයෙන් ගත හැකි ආදර්ශ පෙන්වා දෙයි.

**ආකල්ප හා වටිනාකම්** :

- අභියෝගවලට නොසැලී මුහුණ දීම
- දූර දර්ශී ව හා උපක්‍රමශීලී ව කටයුතු කිරීම
- kingsoflankhistory.biogspot.com

**ගුණාත්මක යෙදවුම්** :

- ඇමුණුම 4.4.1
- mahawamsa.org/2008/05/king-wattagamini-walagambahu

**පාඩම සැලසුම සඳහා උපදෙස්**

පහත විෂය අන්තර්ගතය ඇසුරින් පාඩම සැලසුම් කරගන්න

**4.4 වළගම්බා රජතුමා**

- ළමා කාලය
- රාජ්‍යත්වයට පත් වීම

- වළගම්බා රජුට මුහුණ දීමට සිදු වූ දේශපාලන අභියෝග
    - මහාරත්තක සෙනවියා මරා සිය පරපුරට හිමි රාජ්‍ය උරුමය ලබා ගැනීම
    - රජුට විරුද්ධ ව නකුල ගමෙහි තීය බමුණා කැරැල්ලක් මෙහෙය වීම
    - දකුණු ඉන්දියාවෙන් පැමිණි සත් ද්‍රවිඩයන් අනුරාධපුරය ආක්‍රමණය කිරීම
    - රජු උපක්‍රමශීලී ව එම දෙපිරිස අතර ගැටුමක් ඇති කිරීම හා තීය බමුණා එහි දී පරාජයට පත් වීම
    - සත් ද්‍රවිඩයන් අනුරාධපුර අල්ලා ගැනීම
    - රජු මලය දේශයට පසු බැසීම
    - හින්දු, ජෛන, බ්‍රාහ්මණ අන්‍ය ආගමිකයන් බලවත් ව සිටි හෙයින් සත් ද්‍රවිඩයන්ට රජු අල්ලා ගැනීමට පහසුවන ලෙස වහසි බස් දෙඩීම
    - රජු මලය දේශයේ ගත කළ අවධිය

- කුපික්කල තිස්ස හිමි වනගත ව සැඟවී සිටි රජු හා පවුලේ උදවියට පිණ්ඩපාතය කොට ආරක්ෂාව ලබා දීම
- කුපික්කල තිස්ස හිමි රජුට සේනා සංවිධානයට උපදෙස් ලබා දීම
- රජු හා සේනා අතර ගැටුම්වල දී සේනා රජුගෙන් ඉවත් වූ විට හඹුගල්ලක තිස්ස හිමි මැදිහත් වී දෙපාර්ශ්වය සමගි කිරීම
- අවසාන ද්‍රවිඩ පාලක දාඨිය මරා අනුරාධපුර බලය අත්පත් කර ගැනීම
- බැමිණිතියා සාගතය (වසර 12 - 14 ක් පැවතීම)

- ආගමික කටයුතු

  - ස්තූප ඉදි කිරීම
  - අභයගිරි විහාරය කරවා එය කුපික්කල තිස්ස තෙරණුවන්ට පූජා කිරීම
  - පසු කාලීන ව අභයගිරි සංකීර්ණය කේන්ද්‍ර කොට අන්තර්ජාතික අධ්‍යාපන මධ්‍යස්ථානයක් ගොඩනැගීම
  - නිකාය භේදය ආරම්භ වීම
  - භික්ෂූන් මාතලේ අලු විහාරයට රැස්ව ත්‍රිපිටකය සහ අටුවා ග්‍රන්ථාරූඪ කිරීම
  - සෝමා දේවිය සිහි වීම සඳහා සෝමාවතී ස්තූපය ගොඩනැගීම
  - දක්ෂිණ විහාරය, මූලවෝකාස විහාරය, සාලිය විහාරය, පබ්බතාරාමය තිස්සමහාරාමය ගොඩනැගීම



ඡායාරූපය: 4.4.1 අභයගිරිය විහාර සංකීර්ණයේ නටඹුන්

ඇගයීම හා තක්සේරුකරණය

- වළගම්බා රජු මුහුණ දුන් අභියෝග පෙන්වා දෙයි.
- වළගම්බා රජු ආගමික වශයෙන් සිදු කළ සේවාවන් තෝරා ගනියි.
- වළගම්බා රජු පිළිබඳ නිවැරැදි තොරතුරු දක්වයි.
- සාමූහික ව කටයුතු කරයි.
- ක්‍රියාකාරකම සඳහා ඉදිරිපත් වී කටයුතු කරයි.

ඉහත කරුණු ආවරණය වන පරිදි පාඩම ක්‍රියාත්මක කොට පහත ක්‍රියාකාරකමෙහි සිසුන් නිරත කරවන්න.

- මෙය කණ්ඩායම් ක්‍රියාකාරකමක් ලෙස සිදු කරන්න.
- ඇමුණුම 4.4.1 හා සිදුවීම් කණ්ඩායම්වලට ලබා දෙන්න.
- ඒ අතරින් වළගම්බා සමයේ සිදු වූ සිදුවීම් තෝරා හුණු පුවරුවේ සටහන් කිරීමට සිසු කණ්ඩායම්වලට අවස්ථාව ලබා දෙන්න.
- සිසු කණ්ඩායම් ඉදිරිපත් කිරීම්වල වැරැදි නිවැරැදි කරන්න.
- වඩාත් නිවැරැදි ව පිළිතුරු සැපයූ කණ්ඩායම තෝරා උපස්ථම්භනය කරන්න.
- නිර්ණායක ඇසුරින් ඇගයීම හා තක්සේරුකරණය සිදු කරන්න.

ඇමුණුම 4.4.1

- බැමිණිතියා සාය ඇති වීම
- තීය බමුණාගේ කැරැල්ල
- සෝමා දේවිය රථයෙන් බැස යාම
- රුවන්වැලි සෑය ඉදි කිරීම
- මහා විහාරයට අනුග්‍රහය දැක්වීම
- ප්‍රථමවරට පෞද්ගලික ආරාම පූජාව සිදු කිරීම
- පන්සිය පනස් ජාතක පොත ග්‍රන්ථාරූඪ කිරීම
- ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීම
- පබ්බතාරාමය ඉදි කිරීම
- සත් ද්‍රවිඩ ආක්‍රමණය
- දිවයින ප්‍රථමවරට එක්සේසත් කිරීම
- සද්ධාතිස්ස රජුගේ බාල පුත්‍රයා වීම
- අභයගිරිය ස්තූපය කරවීම
- මහාතිස්ස හිමි වළගම්බා රජුට උදව් කිරීම

**නිපුණතා මට්ටම** : 4.5 වසභ රජුගේ කාර්ය සාඵල්‍යය විස්තර කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල** :

- වසභ රජු රාජ්‍යයත්වයට පත් වූ අයුරු පෙන්වා දෙයි.
- වසභ රජුගේ පාලන සමයේ සුවිශේෂත්වය විස්තර කරයි.
- වසභ රජු රටේ ආර්ථිකය ගොඩනැංවීම සඳහා කළ සේවා ව අගය කරයි.

**ආකල්ප හා වටිනාකම්** :

- නායකයෙකු ලෙස අවස්ථානුකූල ව තීරණ ගැනීම
- නායකයෙකු ලෙස රටේ අභිවෘද්ධියට කටයුතු කිරීම
- අධිෂ්ඨානශීලී ව කටයුතු කිරීම

**ගුණාත්මක යෙදවුම්** :

- ඇමුණුම 4.5.1
- mahawamsa.org/mahawamsa/simplified-version/king of SriLanka-62-ad-131ad

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

පහත විෂය අන්තර්ගතය ඇසුරින් පාඩම සැලසුම් කර ගන්න.

**4.5 වසභ රජතුමා**

- දේශපාලන කටයුතු
  - ලම්බකර්ණ නමින් නව රාජ වංශයක් ආරම්භ කිරීම
- රාජ්‍යත්වයට පත් වීම
  - මුහුණ දුන් අභියෝග හා ඒවා ජය ගැනීම
- පාලන කටයුතු
  - ඒක කේන්ද්‍රීය පාලන ක්‍රමයක් ඇති කිරීම
  - පළාත් බෙදීම
  - රාජ්‍යයේ බලතල සිය නිලධාරීන්ට නිසි ලෙස පවරා සාමකාමී පාලනයක් ගෙන යාම
  - සෙල්ලිපිවලට අනුව මොහුගේ බලය ලංකාව පුරා ව්‍යාප්ත වීම
  - ඉසිගිරි ඇමති සම්බන්ධ වී ලියවුණු රන් සන්නයක් යාපනයෙන් ද
  - විජිතර ඇමති හා සබැදි කුමචෝලෙයි ශිලා ලිපිය මඩකලපුව ප්‍රදේශයෙන් ද හමු වීම

- හබැස්ස හා තම්මැන්නා ලිපිවලට අනුව දූටග, උතර නමින් මොහුගේ දරුවන් දෙ දෙනෙකු රුහුණ හා මායා රට පාලනය කිරීම
- මොහු ඉන්දියාවේ පාණ්ඩ්‍ය හා සොළී පාලකයන් බලවත් වූ නිසා අනුරාධපුර වටා විශාල ප්‍රාකාරයක් ඉදි කිරීම

- ආර්ථික කටයුතු

    - විශාල වාරි කර්මාන්ත නිර්මාණය කිරීමේ තාක්ෂණය හඳුන්වා දීම
    - මහවැව් 11ක් ඇළවල් 12ක් තනා ඇත
    - වාරි පද්ධති ජාලයක් ගොඩනැගීම
    - උමං ජල තාක්ෂණය හඳුන්වා දීම (නගරයේ තැන් තැන්වල පොකුණු තනවා ඒවාට උමං මගින් ජලය සැපයීම)
    - බදු අය කිරීම

- ආගමික කටයුතු

    - මහා විහාරීය භික්ෂූන්ගේ පක්ෂපාතීත්වය මුල සිට ලැබීම
    - ශ්‍රී මහා බෝධිය වටා හිටි පිළිම හතරක් සහිත විහාර කිරීම
    - සිතුල්පව්වෙහි ස්තූප දොළොසක් නිර්මාණය කිරීම
    - දිවයිනේ නොයෙක් පළාත්වල වෙහෙර විහාර ප්‍රතිසංස්කරණය කිරීම
    - භික්ෂූන් වහන්සේලා දහසක් උදෙසා චීවර පූජා පැවැත්වීම

**ඇගයීම හා තක්සේරුකරණය :**

- වසභ රජුගේ දේශපාලන හා ආර්ථික කටයුතු පැහැදිලි කරයි.
- වසභ රජුගේ ආර්ථික සේවාව අගය කරයි
- වසභ රජුගේ චරිතයෙන් ගත හැකි ආදර්ශ පහදයි
- සමගියෙන් කටයුතු කරයි.
- නිසි වෙලාවට නිම කරයි.

ඉහත කරුණු ආවරණය වන පරිදි වගුවක් සම්පූර්ණ කිරීමට සිසුන් යොමු කරවන්න.

- මෙය කේවල ක්‍රියාකාරකමක් ලෙස සිදු කරන්න.
- ඇමුණුම 4.5.1හි වගුව හුණු පුවරුවේ සටහන් කර සිසුන්ට එය පිටපත් කර ගැනීමට දන්වන්න.
- පෙළපොත ද ඇසුරු කර ගනිමින් වගුව සම්පූර්ණ කිරීමට සිසුන් යොමු කරවන්න.
- සිසු ක්‍රියාකාරකම් ඇගයීමට ලක් කරන්න.
- වඩාත් නිවැරැදි පිළිතුර තෝරන්න.
- නිර්ණායක ඇසුරින් ඇගයීම හා තක්සේරුකරණය කරන්න.

ඇමුණුම 4.5.1

වසභ රජතුමාගේ තොරතුරු ඇසුරින් වගුව සම්පූර්ණ කරන්න.

| පාලන | ආර්ථික | ආගමික |
| --- | --- | --- |
| | | |

**නිපුණතා මට්ටම** : 4.6 ධාතුසේන රජතුමා ඉටු කළ මෙහෙවර මතු කර දක්වයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල** :

- ධාතුසේන රජු රාජ්‍යත්වයට පත් වූ ආකාරය විස්තර කරයි.
- ධාතුසේන රජුගේ ආර්ථික කටයුතු පෙළගස්වයි.
- ධාතුසේන රජුගෙන් සිදු වූ ආගමික සේවය අගය කරයි.

**ආකල්ප හා වටිනාකම්** :

- නායකයෙකු වශයෙන් රට ආරක්ෂා කිරීම
- නායකයෙකු වශයෙන් රටේ ආර්ථිකය ශක්තිමත් කිරීම

**ගුණාත්මක යෙදවුම්** :

- en. wikipedia.org/wiki/Dhatusena-of-Anuradapura

**පාඩම සැලසුම සඳහා උපදෙස්:**

පහත විෂය අන්තර්ගතය ආවරණය වන සේ පාඩම සැලසුම් කර ගන්න.

**4.6 ධාතුසේන රජතුමා**

- රාජ්‍යයත්වයට පත් වීම
  - ධාතුසේන රජු රාජ්‍යයත්වයට පැමිණීමට පෙර මෙරට දේශපාලනමය වශයෙන් ගැටලු සහගත තත්වයක් පැවතීම
  - ආක්‍රමණිකයින් පරාජය කර රජකමට පත් වීම

- දේශපාලන කටයුතු
  - මෞර්ය පෙළපතේ ආරම්භය සිදු වීම
  - දකුණු ඉන්දියාවෙන් පැමිණි ෂඩ් ද්‍රවිඩයන් මිත්තසේන රජු මරා රාජ්‍ය පැහැර ගැනීම (පණ්ඩු, පාරින්ද, ඛුද්ද පාරින්ද, තිරීතර, දාඨිය, පීඨිය)
  - ධාතුසේන කුමරු ද්‍රවිඩ පාලකයකු වූ පීඨිය මරා අනුරාධපුර සිහසුන ලබා ගැනීම

- ආර්ථික කටයුතු
  - වැව් 18ක් හා ඇළක් නිර්මාණය කිරීම
  - කලා වැව ප්‍රධාන වේ. (කලා, බළලු වැව් දෙක එකතු කොට කලා වැව විශාල කිරීම, (මෙය අක්කර 6000 ක් විශාල ය.)
  - කලා වැවේ සිට තිසා වැවට ජලය සැපයීම සඳහා ජයගඟ නිර්මාණය කිරීම
  - වැව් 18න් මාදතුගම, මැද්දේකැටිය, යෝධ වැව හා කලා වැව පිළිබඳ තොරතුරු සඳහන් වේ.

- ආගමික කටයුතු
    - ධාතුසේන රජු සියලු නිකායික භික්ෂූන්ට උපස්ථාන කිරීම
    - නොයෙක් ප්‍රදේශවල විහාර 18ක් කරවීම
    - උතුරු ප්‍රදේශයේ මංගණ විහාරය, ථූපවට්ටි විහාරය, නැගෙනහිර ප්‍රදේශයේ පණ්ණාවල්ලක විහාරය, රුහුණු ප්‍රදේශයේ දායගාම විහාරය, සාලවාණ විහාරය, හිල්ලවාන විහාරය, කාලවාපි විහාරය (අවුකන විහාරය) ඔහුගේ නිර්මාණ අතර වේ.
    - මිහිඳු පෙරහැර ආරම්භ කිරීම
    - රුවන්වැලි සෑයේ වජ්‍රචුම්බටකයක් තැන්පත් කිරීම



ඡායාරූපය: 4.6.1 කලාවැව



ඡායාරූපය: 4.6.2 කලාවැවෙන්; ජයගඟ හෙවත් යෝධ ඇළට ජලය මුදාහරින ස්ථානයෙහි වර්තමාන දර්ශනයක්

ඇගයීම හා තක්සේරුකරණය :

- ධාතුසේන රජතුමා පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.
- ධාතුසේන රජතුමාගේ සේවාවන් අගය කරයි.
- වගුව නිවැරදි ව සම්පූර්ණ කරයි.
- ක්‍රියාකාරකම පිරිසිදු හා ආකර්ෂණීය ව සකස් කරයි.
- නියමිත වේලාවට අවසන් කරයි.

ඉහත කරුණු ආවරණය වන පරිදි පහත ක්‍රියාකාරකමෙහි සිසුන් නිරත කරවන්න.

- මෙය කේවල ක්‍රියාකාරකමක් ලෙස සිදු කරන්න.
- පහත සඳහන් වගුව අදාළ කරුණුවලින් සම්පූර්ණ කරන්න.
- පෙළපොත ඇසුරින් වගුව සම්පූර්ණ කරවන්න.
- වගුව සම්පූර්ණ කිරීම සඳහා විනාඩි 15 පමණ කාලයක් ලබා දෙන්න.
- සියලු දෙනාගේ ම ක්‍රියාකාරකම් අගයන්න.
- සිසු ප්‍රබලතා හා දුබලතා හඳුනා ගනිමින් පාඩම සමාලෝචනය කරන්න.
- නිර්ණායක ඇසුරින් ඇගයීම හා තක්සේරුකරණය සිදු කරන්න.

ඇමුණුම් අංක 4.6.1

| ධාතුසේන රජුගේ දේශපාලන කටයුතු | ධාතුසේන රජුගේ ආර්ථික කටයුතු | ධාතුසේන රජුගේ ආගමික කටයුතු |
|---|---|---|
| | | |

## 5
## ශ්‍රී ලංකාවේ පිරිවෙන් ඉතිහාසය

බුදු දහම විසින් පොදුවේ මානව ශිෂ්ටාචාරයටත්, පෙරදිග ලෝකයටත් උරුම කොට දෙනු ලැබූ වටිනාම දායාදය වූයේ ආරාමික අධ්‍යාපන ක්‍රමය යි. පළමු ව පස්වග භික්ෂූන් වහන්සේලාගෙන් ආරම්භ වූ බෞද්ධ අධ්‍යාපන ක්‍රමය සියවස් ගණනාවක් තිස්සේ ක්‍රමානුකූල ව ව්‍යාප්ත වීමේ ප්‍රතිඵලයක් ලෙස පෙරදිග ආශ්‍රිතව ශීඝ්‍ර බුද්ධි ප්‍රබෝධයක් ඇති කළේ ය. ලෝකයේ මුල් ම විශ්වවිද්‍යාල වන ඉන්දියාවේ නාලන්දා, වික්‍රමශිලා, ජගත්දලා, ඕදන්තපුරී ආදි අධ්‍යාපන ආයතන බිහිවන්නේ භික්ෂූන් වහන්සේලාගේ මැදිහත් වීමෙනි. ශ්‍රී ලංකාවේ බිහි වූ ආරාමික අධ්‍යාපන ක්‍රමය මිහිඳු හිමියන් ඇතුළු පිරිසගේ වැඩම වීම හා උන්වහන්සේලා විසින් බුදු දහම හඳුන්වා දීමෙන් අනතුරුව ඇති විය. ශ්‍රී ලංකාවේ සාහිත්‍ය හා පුරාවිද්‍යා මූලාශ්‍රය තුළින් හමුවන සාධකවලට අනුව රජරට ශිෂ්ටාචාර අවධියේ සිට වර්තමානය දක්වා පිරිවෙන් අධ්‍යාපනය වර්ධනය වීම හා ව්‍යාප්ත වීම දක්නට ලැබේ. ඊට අදාළ තොරතුරු අධ්‍යයනය කිරීම මෙම ඒකකයේ අරමුණ වේ.

**නිපුණතාව** : 5. ශ්‍රී ලංකාවේ පිරිවෙන් අධ්‍යාපන ඉතිහාසයේ ආරම්භය හා විකාශනය පිළිබඳව අවබෝධයෙන් කටයුතු කරයි.

**නිපුණතා මට්ටම** : 5.1 පිරිවෙන් ඉතිහාසයේ ආරම්භය හා විකාශනය විස්තර කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල** :

- පිරිවෙන් අධ්‍යාපන සංකල්පයේ අර්ථය පැහැදිලි කරයි.
- පිරිවෙන්හි ඓතිහාසික විකාශනය විස්තර කරයි.
- පිරිවෙන් අධ්‍යාපනයේ සුවිශේෂතා පෙන්වා දෙයි.
- පිරිවෙන් අධ්‍යාපනය මඟින් සදාචාරවත් සමාජයක් ගොඩනගාගත හැකි බව අගයමින් කතා කරයි.

**ආකල්ප හා හර පද්ධති** :

- අධ්‍යාපනය මඟින් විනය සහ හික්මීමක් සහිත පුද්ගලයන් නිර්මාණය වීම සඳහා පිරිවෙන් අධ්‍යාපනය වැදගත් වීම

**ගුණාත්මක යෙදවුම්** :

- පිරිවෙන් ඉතිහාසය පිළිබඳ ලිපි
- පිරිවෙන් හා සම්බන්ධ නටඹුන් හා ආශ්‍රිත ඡායාරූප
- මූලාශ්‍රය ග්‍රන්ථ ආශ්‍රිත තොරතුරු ගොණු
- ඇමුණුම 5.1.1 සහ 5.1.2

**පාඩම් සැලසුම් සඳහා උපදෙස් :**

පහත සඳහන් විෂය කරුණු ඇසුරින් පාඩම සැලසුම් කරන්න.

**5.1 පිරිවෙන් ආරම්භය හා විකාශනය**

- පිරිවෙන අධ්‍යාපන සංකල්පය
  - විහාර, මහා විහාර ආදිය තුළ ප්‍රාකාර ආදියෙන් වටකොට භික්ෂූන් වහන්සේලාට වාසය කිරීම සඳහා ඉදි කරන ලද ආවාසය පිරිවෙන යනුවෙන් හඳුන්වා ඇත.
  - සාරාර්ථදීපනී විනය ටීකාව, ධම්මපද අටුවාව, බෝධි වංසය, සිංහල විශ්ව කෝෂය යනාදි මූලාශ්‍රයවල පිරිවෙන යනු, භික්ෂූන් වහන්සේලා උදෙසා ඉදි කරන ලද 'ආවාස' ලෙස දක්වා ඇත.
  - 12වන සියවසෙන් පමණ පසු පිරිවෙන යන්නෙහි අදහස වෙනස් වී එය විද්‍යාස්ථානයක් හැඳින්වීම සඳහා යොමු වී ඇති බව සඳහන් වේ.
  - කෝට්ටේ යුගය වන විට පිරිවෙන යන්නෙන් පැහැදිලිව ම භික්ෂූන් වහන්සේලාගේ අධ්‍යාපනික මධ්‍යස්ථාන හැඳින් වූ බවට මූලාශ්‍රය ගත තොරතුරු හමු වේ.

- බෞද්ධ සංස්කෘතියේ උරුමයක් ලෙස ආරාමික අධ්‍යාපන ක්‍රමයේ ආරම්භය සිදු වූ බව පැහැදිලි කිරීම.
  - පස්වග භික්ෂූන් වහන්සේලාගේ මැදිහත් වීම මඟින් ඉන්දියාවේ දී බෞද්ධ අධ්‍යාපනය ආරම්භ වී ඇත.
  - සියවස් ගණනාවක් පුරා ජනපදයෙන් ජනපදයට රටින් රටට මෙම අධ්‍යාපන ක්‍රමය ව්‍යාප්ත විය.
  - මෙම සම්ප්‍රදාය තුළ ධර්මාවබෝධය ලබන්නට කැමති පුද්ගලයන් ඔවුන් වෙත ගොස් ධර්මාවබෝධය ලබාගෙන ඇත.
  - මෙය ඉන්දියාවේ පැවති ගුරුවරයා සමීපයේ නේවාසික ව සිට ශිල්ප ඉගෙනීමේ ක්‍රමයට බෙහෙවින් වෙනස් වූ අධ්‍යාපන රටාවකි.
  - බුදු දහම පැතිරී ගිය සෑම රටක ම මෙම අධ්‍යාපන ක්‍රමය මඟින් බුද්ධි ප්‍රබෝධයක් ඇති විය.
  - මහින්දාගමනයෙන් පසු බෞද්ධ ආරාමික අධ්‍යාපන ක්‍රමය ලංකාවට උරුම වීම හා පැතිරීම.

ඉහත විෂය කරුණු ආවරණය වන සේ පන්තියේ සිසුන් අතර කථික තරගයක් පැවැත් වීමට කටයුතු සලස්වන්න. මෙය කේවල ක්‍රියාකාරකමක් ලෙස යොදා ගන්න.

- ඇමුණුම 5.1.1 අනුව සිසුන්ට මාතෘකාව ලබා දෙන්න.
- ඇමුණුම 5.1.2 අනුව ක්‍රියාකාරකම සිදු කරන්න.

**ඇගයීම හා තක්සේරුකරණය :**

**(පහත සඳහන් නිර්ණායක ආශ්‍රයෙන් ඇගයීම හා තක්සේරුව සිදු කරන්න.)**

- පිරිවෙන් අධ්‍යාපනයේ ඉතිහාසය පිළිබඳ නිවැරැදි කරුණු ඉදිරිපත් කරයි.
- පිරිවෙන් අධ්‍යාපනයෙන් ලද සේවා අගය කරයි
- කථික තරගය සඳහා ඉදිරිපත් වෙයි.
- නියමිත කාලය තුළ කථාව අවසන් කරයි.

ඇමුණුම 5.1.1

**මාතෘකාව**

- පිරිවෙන් අධ්‍යාපනයේ ආරම්භය

ඇමුණුම 5.1.2

මාතෘකාව පන්තියේ සෑම සිසුවෙකුට ම ලබා දෙන්න.
මාතෘකාව ගම්‍ය වන අයුරින් කරුණු පෙළගැසීමට සිසුන්ට උපදෙස් ලබා දෙන්න.
කථික තරගය පවත්වන දිනය සහ ලබා දෙන කාලය පිළිබඳව සිසුන් දැනුවත් කරන්න. (විනාඩි 05)
සෑම සිසුවෙකු ම තරගය සඳහා ඉදිරිපත් කිරීමට වග බලා ගන්න.
නිර්ණායක අනුව ලකුණු ලබා දෙන්න.
තරගය සඳහා සක්‍රීය ව දායක වූ සිසුන් උපස්ථම්භනය කර දුර්වල සිසුන් සඳහා අවශ්‍ය ප්‍රතිපෝෂණය ලබා දෙන්න.

**නිපුණතා මට්ටම** : 5.2 අනුරාධපුර හා පොලොන්නරු යුගවල පිරිවෙන් ඉතිහාසය අධ්‍යයනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 03

**ඉගෙනුම් පල** :

- ලංකාවේ පිරිවෙන් අධ්‍යාපනය අනුරාධපුරයෙන් ආරම්භ වූ බවට කරුණු දක්වයි.
- අනුරාධපුරයේ හා පොලොන්නරු යුගයේ සුප්‍රකට පිරිවෙන් නම් කරයි.
- රජරට ශිෂ්ටාචාර සමයේ සදාචාර සම්පන්න සමාජයක් බිහිවීම සඳහා පිරිවෙන් අධ්‍යාපනය දායක වූ බව අගයමින් කථා කරයි.

**ආකල්ප හා හර පද්ධති** :

- පිරිවෙන් අධ්‍යාපනය මඟින් බිහි වූ විනයානුකූල ගිහි පැවිදි සිසුහු තම දේශයේ ගෞරවය හා ආරක්ෂාව වෙනුවෙන් නිරන්තරයෙන් පෙනී සිටිති.

**ගුණාත්මක යෙදවුම්** :

- රජරට පිරිවෙන් අධ්‍යාපනයේ ඓතිහාසිකත්වය පිළිබඳ අන්තර්ගත කෘති
- පැරණි පිරිවෙන් ආශ්‍රිත ඡායාරූප (ආලාහන පිරිවෙන් සංකීර්ණය, මහා විහාර (පිරිවෙන ආශ්‍රිත)
- ඇමුණුම් අංක 5.2.1, 5.2.2

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

පහත විෂය කරුණු ඇසුරින් පාඩම සැලසුම් කරන්න.

**5.2 අනුරාධපුර හා පොලොන්නරු යුගවල පිරිවෙන් අධ්‍යාපනය**

**අනුරාධපුර යුගයේ පිරිවෙන් අධ්‍යාපනය**

- මහින්දාගමනයේ ප්‍රතිඵලයක් ලෙස ලංකාවේ පිරිවෙන් අධ්‍යාපනය ආරම්භ වීම
- පැරණි සාහිත්‍ය මූලාශ්‍රයවල මහා විහාරයේ පරිවේණ හෙවත් පිරිවෙන් නමින් හැඳින්වූ භික්ෂු වාසස්ථාන සිය ගණනකුත්, රෝහණයේ තිස්ස මහා විහාරයේ එ බඳු පිරිවෙන් සිය ගණනකුත් තිබූ බව සඳහන් වේ.
- මෙම පිරිවෙන් ගොඩනැගිලි හුදෙක් භික්ෂූන් වහන්සේලාගේ වාසස්ථාන පමණක් නොව, බුද්ධ ධර්මය හදාරන, එය ප්‍රගුණ කරන ස්ථානයක් ද විය.
- අනුරාධපුරයේ මහා විහාරයේ පිරිවෙන

- මයුර පිරිවෙන
- කාලපාසාද පිරිවෙන
- අභයගිරියේ උත්තරාරාම පිරිවෙන
- අනුරාධපුරයේ පැවති එවැනි අධ්‍යාපන මධ්‍යස්ථානයන්ට උදාහරණ වේ.
- මිහිඳු මහරහතන් වහන්සේ විසින් බුදු දහම හඳුන්වා දෙන අවධියේ පටන් මෙරට තෙරවරු ත්‍රිපිටකය සහ අට්ඨකථා, වාචනා මාර්ගයෙන් හෙවත් කටපාඩමෙන් රැගෙන ආහ. මෙම තෙරවරුන් භාණක නමින් හඳුන්වා ඇත.

- මුල් යුගවල දී ධර්මය වාචනා මාර්ගයෙන් රැගෙන ආ නමුත් වළගම්බා රාජ්‍ය සමයේ පැවති බැමිණිතියා මහා සාගතය හේතුවෙන් බොහෝ භික්ෂූන් වහන්සේලා අපවත් වූ අතර අනිකුත් අය විදේශ ගත වූහ. මෙම පසුබිම තුළ ත්‍රිපිටකය ලියා තැබීම මහා විහාර භික්ෂූන් වහන්සේලාගේ තීරණය විය.

- ථූපාරාම විහාරවාසී කුන්තගත්ත තිස්ස මහ රහතන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් මාතලේ අලු ලෙනට රැස් වූ භික්ෂූන් 500ක් පිරිස ත්‍රිපිටකය හා අර්ථ කථා සංගායනා කොට පුස්කොළ පොත්වල ලියා ඇත.

- පොත් ලිවීම, ඒ සඳහා කොළ ලිවීමේ උපකරණ සැකසීම, අක්ෂර වින්‍යාසය, ධර්මය නිවැරැදි ලෙස ලියා තැබීම වැනි විෂයයන් පිරිවෙන් අධ්‍යාපනයට එකතු විය.

- තවද පාලි භාෂාව, ඉතිහාසය, නිවැරැදි උච්චාරණ විධි, අක්ෂර කලාව, සංස්කෘත භාෂාව වැනි විෂයයන් ද එයට අයත් විය.

- බුදුන් වහන්සේගේ ධර්මෝපදේශය පරිදි භික්ෂු භික්ෂුණී උපාසක උපාසිකා යන සිවුවණක් පිරිස මෙම පිරිවෙන් තුළ අධ්‍යාපනය හදාරා ඇත.

- එහෙත් අභයගිරි විහාරය ලංකාවට ගලා එන මහායාන මතවාදවලට මධ්‍යස්ථානයක් බවට පත් වීමත් සමග ලංකාවේ ආරාමික අධ්‍යාපනයේ විශාල වෙනස්කම් ඇති විය.

- මහා විහාරික ථෙරවාදීන්ගේ අධ්‍යාපන පරමාර්ථය වූයේ තුන්තරා බෝධියෙන් එක්තරා බෝධියකින් නිර්වාණය අවබෝධ කර ගැනීමයි. ඒත් මහායානිකයෝ බෝධිසත්ව ජීවිතයකට අවශ්‍යය. ශික්ෂාවන්හි පුහුණුව ලබන අතර ධර්මය ධාරණය කර ගැනීමට උත්සුක වූහ. ඔවුන්ගේ ධර්මය ත්‍රිපිටකයට පමණක් සීමා නොවී ය.

- අතීත රජවරුන්ගේ රාජ්‍ය අනුග්‍රහය මත පිරිවෙන් අධ්‍යාපනයට ශීඝ්‍ර දියුණුවක් අත් විය. ක්‍රමයෙන් ගමේ පන්සල් කාර්ය බහුල පොදු ජන අධ්‍යාපන ආයතනයක් විය.

**පොලොන්නරු යුගයේ පිරිවෙන් අධ්‍යාපනය**

පොලොන්නරු යුගයේ මහා පරාක්‍රමබාහු රජුගේ ගල් විහාර කතිකාවතේ සඳහන් තොරතුරුවලට අනුව දිඹුලාගල මහා කාශ්‍යප වැනි මහ තෙරුන් වහන්සේලා ථේරවාදී සම්ප්‍රදාය ඉදිරියට පවත්වාගෙන යාමට උත්සාහ ගෙන ඇත.

- මෙම යුගයේ දී මූලායතන අටකට අයත් පිරිවෙන් ලංකාව පුරා විසිරී පැවතී ඇත.
- භික්ෂු අධ්‍යාපනය නවක, මධ්‍යම, ස්ථවිර වශයෙන් අවධි තුනකට බෙදා ඇත. එහි දී අධ්‍යයනය කළ යුතු කාල සීමාව සහ ධර්ම කොටස් ද සඳහන් කොට ඇත.

- ඉහත විෂය කරුණු ඇසුරින් පන්තියේ සිසුන් හට ප්‍රශ්නාවලියක් සකස් කිරීමට උපදෙස් ලබා දෙන්න. එය කේවල ක්‍රියාකාරකමක් ලෙස යොදා ගන්න.
- ඇමුණුම් අංක 5.2.1 අනුව ප්‍රශ්නාවලිය සැකසීමට උපදෙස් ලබා දෙන්න.

**ඇගයීම හා තක්සේරුකරණය :**

**(පහත සඳහන් නිර්ණායක ආශ්‍රයෙන් ඇගයීම හා තක්සේරුව සිදු කරන්න.)**

- රජරට ශිෂ්ටාචාරයේ පිරිවෙන් නම් කරයි
- රජරට පිරිවෙන් අධ්‍යාපනයේ හර පද්ධතීන් අගය කරයි.
- මාතෘකාවට අදාළ ව ප්‍රශ්න සකස් කරයි.
- නියමිත කාලයට ප්‍රමාණාත්මක ව ප්‍රශ්න සකස් කරයි.

**ඇමුණුම් අංක 5.2.1**

- ක්‍රියාකාරකම පිළිබඳව සිසුන් දැනුවත් කරන්න.
- ප්‍රශ්නාවලිය සඳහා අවශ්‍ය ප්‍රශ්න ප්‍රමාණය සහ ලබා දෙන කාලය පිළිබඳව සිසුන් දැනුවත් කරන්න.
- පාඩමට අදාළ ව ප්‍රශ්න නිර්මාණය කරන ලෙස උපදෙස් දෙන්න.
- සිසුන්ගේ ප්‍රශ්නවලින් ඇගයීම සිදු කරන්න.
- ප්‍රශ්නාවලිය ක්‍රමවත් ව සිදුකරන සිසුන් උපස්ථම්භනය කර අනිකුත් සිසුන් සඳහා ප්‍රතිපෝෂණය ලබා දෙන්න.

**නිපුණතා මට්ටම** : 5.3 දඹදෙණි යුගයේ පිරිවෙන් ඉතිහාසය විස්තර කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල** :

- දඹදෙණි යුගයේ බිහි වූ පිරිවෙන් අධ්‍යාපන ආයතන නම් කරයි.
- දඹදෙණි කතිකාවත මඟින් දඹදෙණි රාජධානි සමයේ පැවති අධ්‍යාපන ක්‍රමය පහදයි.
- ලාංකික අධ්‍යාපන ක්‍රමයට දඹදෙණි රාජධානි සමයේ එක් වූ නවාංග පෙන්වා දෙයි.

**ආකල්ප හා හර පද්ධති** :

- දඹදෙණි යුගයේ දී පිරිවෙන් අධ්‍යාපනයට එක් වූ ලෞකික විෂය කරුණු හේතුවෙන් පිරිවෙන් අධ්‍යාපනය යාවත්කාලීන වීම.

**ගුණාත්මක යෙදවුම්** :

- දඹදෙණි යුගයේ පිරිවෙන් ඉතිහාසය අන්තර්ගත කෘති
- ඇමුණුම 5.3.1, 5.3.2

**පාඩම් සැලසුම් සඳහා උපදෙස් :**

පහත විෂය කරුණු ඇසුරින් පාඩම සැලසුම් කරන්න.

**5.3 දඹදෙණි යුගයේ පිරිවෙන් අධ්‍යාපනය**

- රජරට ශිෂ්ටාචාරය බිඳ වැටී රාජධානිය දඹදෙණියට සංක්‍රමණය වීමෙන් පසු පිරිවෙන් අධ්‍යාපනයේ ක්‍රමික විකාශනයක් ඇති විය.
- තෙවන විජයබාහු රජු සංඝරක්ඛිත මාහිමියන්ගේ උපදෙස් ප්‍රකාර ව බෞද්ධාගම දියුණුවට මෙන් ම නිකාය සමඟියක් ඇති කිරීමට ද කටයුතු කිරීම
- දඹදෙණි රාජධානියේ පාලකයින් දෙවුන්දර නන්දන, කුරුණෑගල, මහේන්ද්‍ර, අනුරාධපුරයේ බුවනෙකබා වැනි පිරිවෙන් දියුණු කිරීමට රාජ්‍ය අනුග්‍රහය ලබා දීම
- පිරිවෙන් අධ්‍යාපනයේ විෂය ක්ෂේත්‍රයට අනුරාධපුර හා පොලොන්නරු යුගවල දී නොපැවති ලෞකික හා අධ්‍යාපනික අංග එකතු වීම
- දඹදෙණි අධ්‍යාපන රටාවේ පැවති දියුණුව හේතුකොට ගෙන පූජාවලිය, සද්ධර්ම රත්නාවලිය ආදි සාහිත්‍ය ග්‍රන්ථ රැසක් බිහි වීම හා උගත් නැණවත් කතුවරු පරම්පරාවක් බිහි වීම
- දඹදෙණි කතිකාවතේ අන්තර්ගත තොරතුරුවලට අනුව ලෞකික විෂය කරුණු භික්ෂු ජීවිතයට ඇතුළත් වීම, භික්ෂු ජීවිතයේ පරිහානියට ද හේතු වීම

ඉහත සඳහන් විෂය කරුණු ආවරණය මඟින් පන්තියේ සිසුන්ට රචනාවක් ලිවීම සඳහා උපදෙස් ලබා දෙන්න. එය කේවල ක්‍රියාකාරකමක් ලෙස යොදා ගන්න.

ඇමුණුම 5.3.1 අනුව සිසුන්ට මාතෘකාව ලබා දෙන්න.
ඇමුණුම 5.3.2 අනුව ක්‍රියාකාරකම සිදු කරන්න.

**ඇගයීම හා තක්සේරුකරණය :**

**(පහත සඳහන් නිර්ණායක ආශ්‍රයෙන් ඇගයීම හා තක්සේරුව සිදු කරන්න.)**

- දඹදෙණි යුගයේ පිරිවෙන් අධ්‍යාපනය පිළිබඳව පැහැදිලි කරයි.
- පාලකයින් පිරිවෙන් අධ්‍යාපනය දියුණු කිරීමට ගත් ක්‍රියාමාර්ග පෙන්වා දෙයි
- පිරිවෙන් අධ්‍යාපනයේ යහපත් ගුණාංග අගය කරයි.
- නියමිත කාලයට වැඩ නිම කරයි.
- වඩා නිර්මාණශීලී ව රචනාව ගොඩනගයි.

**ඇමුණුම 5.3.1**

✳ දඹදෙණි අවධියේ පිරිවෙන් අධ්‍යාපනය

**ඇමුණුම 5.3.2**

✳ රචනාව සඳහා අවශ්‍ය වචන ප්‍රමාණය පිළිබඳ සිසුන් දැනුවත් කරන්න.
✳ රචනාව ලිවීම සඳහා අවශ්‍ය කාලය ලබා දෙන්න. (දින දෙකක් පමණ)
✳ නියමිත දිනයට රචනාව භාර දිය යුතු බව දැනුවත් කරන්න.
✳ සිසුන්ගේ රචනා අතරින් හොඳ ම රචනාව තෝරා පිරිවෙන් සඟරාවෙහි පළ කරන්න.
✳ දුර්වල සිසුන් සඳහා ප්‍රතිපෝෂණය ලබා දෙන්න.

**නිපුණතා මට්ටම** : 5.4 කුරුණෑගල යුගයේ පිරිවෙන් ඉතිහාසය විස්තර කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල** :

- කුරුණෑගල යුගයේ පිරිවෙන් අධ්‍යාපනය විස්තර කරයි.
- කුරුණෑගල යුගයේ පිරිවෙන් අධ්‍යාපනයට එල්ල වූ අභියෝග පහදා දෙයි.
- සිවුවන පරාක්‍රමබාහු රාජ්‍ය සමයේ පිරිවෙන් අධ්‍යාපනයේ වර්ධනය පැහැදිලි කරයි.

**ආකල්ප හා හර පද්ධති** :

- කුරුණෑගල යුගයේ පිරිවෙන් අධ්‍යාපනයෙන් පෝෂණය වූ සාහිත්‍ය ග්‍රන්ථ මගින් සමාජ සාරධර්ම පෝෂණය වීම තුළින් යහපත් සමාජීය වටපිටාවක් නිර්මාණය වීම

**ගුණාත්මක යෙදවුම්** :

- කුරුණෑගල යුගයේ පිරිවෙන් අධ්‍යාපන ඉතිහාසය ආශ්‍රිත ග්‍රන්ථ

**පාඩම් සැලසුම් සඳහා උපදෙස් :**

පහත විෂය කරුණු ඇසුරින් පාඩම සැලසුම් කරන්න.

**5.4 කුරුණෑගල රාජධානි සමයේ පිරිවෙන් අධ්‍යාපනය**

- ස්ථාවර දේශපාලන පසුබිමක් මත ක්‍රමවත් අධ්‍යාපනයක් කුරුණෑගල යුගයේ දී බිහි විය. නමුත් කුරුණෑගල රාජධානි සමය ආරම්භයට පෙර ලංකාවේ දේශපාලනය තුළ අභ්‍යයන්තර අරගල රාශියක් පැවති අතර දෙවන බුවනෙකබාහු රජු එම තත්ත්වය පාලනය කර පාලන ක්‍රමය යහපත් තත්ත්වයට පත් කිරීම

- දෙවන බුවනෙකබාහු රජුගෙන් පසුව ඔහු පුත් හතරවන පරාක්‍රමබාහු රාජ්‍යයත්වයට පත් කිරීම

- සිවුවන පරාක්‍රමබාහු රජු ස්වකීය ගුරු තනතුරට(රාජගුරු) චෝළ දේශයේ සිට මෙහි පැමිණි මහතෙරුන් වහන්සේ නමක් පත් කර වීදාගම මහවිහාරයක් කරවා පූජා කිරීම

- එයින් ඇරඹි ආගමික මෙහෙවර අතර දළදා පූජා උත්සව පැවැත්වීම, දළදා මාළිගයට ගම්බිම් පිදීම පුද පූජා ද වීම

- පාලි පන්සිය පනස් ජාතක පොත සිංහලයට පරිවර්තනය වීම, කැලණි විහාරයේ වැඩ විසූ විල්ගම්මුල ශ්‍රී පරාක්‍රමබාහු මාහිමියන් අතින් අනාගත වංශය, එළුබෝධිවංශය රචනා වීම ආදිය මඟින් අධ්‍යාපන, ආගමික හා සාහිත්‍ය සේවය සඳහා රජුගේ දායකත්වය ලබා දීම

- රජුගේ රාජ්‍ය අනුග්‍රහය මත ක්‍රියාත්මක වූ පිරිවෙන් අතර,

  » වීදාගම ශ්‍රී සනානන්ද පිරිවෙන
  » කුරුණෑගල පරාක්‍රමබාහු පිරිවෙන දැක්විය හැක. එමගින් මෙම යුගයේ පිරිවෙන් අධ්‍යාපනය පෝෂණය වීම

ඉහත සඳහන් විෂය කරුණු ආවරණය වන සේ පහත ක්‍රියාකාරම සිදු කරන්න.

ක්‍රියාකාරකම් 01

- මෙය කේවල ක්‍රියාකාරකමක් ලෙස සිදු කරන්න.
- ඇමුණුම් අංක 5.4.1හි ඇතුළත් ප්‍රශ්න සිසුන්ට අභ්‍යාස පොතේ සටහන් කර ගැනීමට අවස්ථාව ලබා දෙන්න.
- දී ඇති පිළිතුරු ආශ්‍රයෙන් නිවැරැදි පිළිතුර තෝරා ගැනීමට සිසුන් යොමු කරන්න.
- නිවැරැදි පිළිතුරු අනුව ලකුණු ලබා දී ප්‍රශ්න හා පිළිතුරු සාකච්ඡා කරන්න.

**ඇමුණුම් අංක 5.4.1**

- කුරුණෑගල රාජධානියේ ආරම්භක පාලකයා කවුද?
- චෝළ දේශයේ සිට ලංකාවට පැමිණි සිවුවන පරාක්‍රමබාහු රජුගේ රාජගුරු තනතුර හෙබ වූ මහතෙරුන් වහන්සේ කවුද?
- පන්සිය පනස් ජාතක පොත සිංහලයට පරිවර්තනය වූයේ කුමන රාජ්‍ය සමයේ දී ද?
- කුරුණෑගල යුගයේ දී රචනා වූ සාහිත්‍ය ග්‍රන්ථ දෙකක් ලියන්න.

(බුවනෙකබාහු රජු, වීදාගම මහතෙරුන් වහන්සේ, දෙවන බුවනෙකබාහු රජු, දඹදෙණි යුගය, හයවන පරාක්‍රමබාහු රජු, කුරුණෑගල යුගය, විල්ගම්මුල ශ්‍රී පරාක්‍රමබාහු, බෝධි වංශය, එළු බෝධි වංශය, අනාගත වංශය, ථූප වංශය)

**නිපුණතා මට්ටම** : 5.5 කෝට්ටේ යුගයේ පිරිවෙන් ඉතිහාසයේ ආරම්භය හා විකාශනය විස්තර කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල** :

- කෝට්ටේ යුගයේ බිහි වූ පිරිවෙන් ආයතන නම් කරයි.
- ක්‍රමවත් පිරිවෙන් අධ්‍යාපනයක් නිර්මාණය වීම කෙරෙහි පැවති දේශපාලන එක්සත් භාවයේ වැදගත්කම පෙන්වා දෙයි.
- කෝට්ටේ යුගයේ පැවති අධ්‍යාපනය පිළිබඳව සන්දේශ කාව්‍ය මඟින් විස්තර කරයි.

**ආකල්ප හා හර පද්ධතිය** :

- කෝට්ටේ යුගයේ අධ්‍යාපනයේ හා සාහිත්‍යයේ දියුණුව සහ එම දියුණුව වර්තමාන ජන සමාජයට ද යහපත් ආකාරයෙන් බලපෑම

**ගුණාත්මක යෙදවුම්** :

- කෝට්ටේ යුගය තුළ බිහි වූ සාහිත්‍යය කෘති

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

පහත විෂය කරුණු ඇසුරින් පාඩම සැලසුම් කරන්න.

**5.5 කෝට්ටේ යුගයේ පැවති පිරිවෙන් අධ්‍යාපනය**

- අධ්‍යාපන ආයතන පිළිබඳව කෝට්ටේ රාජධානි සමයේ ලියවුණු සන්දේශ කාව්‍යය හා තත්කාලීන මූලාශ්‍රය මගින් හඳුනාගත හැකි වීම.

- විශේෂයෙන් ගිරා සන්දේශය, හංස සන්දේශය, කෝකිල සන්දේශය ආදි කෘතිවල එකල පිරිවෙන් අධ්‍යාපනය ඉදිරියට ගෙන ගිය මහතෙරුන් වහන්සේලා ලෙස තොටගමුවේ රාහුල මා හිමි, කැරගල වනරතන මා හිමි, වීදාගම මෛත්‍රීය හිමියන්, දෙවුන්දර ඉරුගල් කුලතිලක හිමියන් ආදී මහතෙරවරුන් පිළිබඳ සඳහන් වීම.

- කෝට්ටේ රාජධානි සමයේ ප්‍රසිද්ධියට පත් වූ පිරිවෙන් අතර

    - තොටගමුවේ විජයබා පිරිවෙන
    - කැරගල පද්මාවතී පිරිවෙන
    - දෙවිනුවර ඉරුගල් කුලතිලක පිරිවෙන
    - පැපිලියානේ සුනේත්‍රාදේවි පිරිවෙන
    - වීදාගම සනානන්ද පිරිවෙන වැදගත් වේ.

- මෙම පිරිවෙන් අධ්‍යාපන ආයතන ග්‍රාමවාසී සහ වනවාසී ලෙස ප්‍රධාන කොටස් දෙකකට බෙදී පැවති අතර ථේරවාදී සම්ප්‍රදාය ඉදිරියට ගෙන යමින් කාලයට සුදුසු පරිදි හැඩගැසී පැවති බව හඳුනාගත හැකි ය.

ඉහත විෂය කරුණු ආවරණය වන සේ පහත ක්‍රියාකාරකම සඳහා සිසුන් යොමු කරන්න. එය කේවල ක්‍රියාකාරකමක් ලෙස යොදා ගන්න.

- ඇමුණුම් අංක 5.5.1 යටතේ ඇති වගුව පිටපත් කරවන්න.
- ක්‍රමානුකූල ව වගුව පිරවීමට උපදෙස් දෙන්න.
- වගුව පිරවීමෙන් අනතුරුව එහි ඇති කරුණු පිළිබඳව සමාලෝචනයක් කරන්න.

**ඇගයීම හා තක්සේරුකරණය :**

**(පහත සඳහන් නිර්ණායක ආශ්‍රයෙන් ඇගයීම හා තක්සේරුව සිදු කරන්න.)**

- කෝට්ටේ යුගයේ පිරිවෙන් අධ්‍යාපනය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.
- සාහිත්‍ය ග්‍රන්ථ නම් කරයි.
- නිවැරදි ව වගුව සම්පූර්ණ කරයි.
- නියමිත කාලයට නිම කරයි.
- පැහැදිලි ව තොරතුරු ඉදිරිපත් කරයි.

ඇමුණුම් අංක 5.5.1

| උගත් පඬිවරු | පිරිවෙන් | සාහිත්‍ය ග්‍රන්ථ |
|---|---|---|
| | | |

**නිපුණතා මට්ටම** : 5.6 කෝට්ටේ යුගයේ පිරිවෙන් අධ්‍යාපනයේ විෂය මාලාව විස්තර කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල** :

- කෝට්ටේ යුගයේ ආරාමික අධ්‍යාපනයේ විෂයයන් නම් කරයි.
- කෝට්ටේ යුගයේ දී පිරිවෙන් අධ්‍යාපනයේ නව්‍යතාවන් පිළිබඳ විස්තර කරයි.
- කෝට්ටේ යුගයේ පැවති අධ්‍යාපන ක්‍රියාවලිය හේතුවෙන් ශ්‍රී ලංකාව ජාත්‍යන්තර කීර්තියට පත් ව තිබූ බව අගයමින් කතා කරයි.

**ආකල්ප හා හර පද්ධතිය** :

- පිරිවෙන් අධ්‍යාපනයේ ස්වර්ණමය අවධිය කෝට්ටේ යුගය වීම
- එයින් පෝෂණය වූ වර්තමාන පිරිවෙන් අධ්‍යාපනයට ද එම මාර්ගය ඔස්සේ ඉදිරියට ගමන් කිරීමට හැකි වීම

**ගුණාත්මක යෙදවුම්** :

- කෝට්ටේ රාජධානියට අදාළ ඓතිහාසික මූලාශ්‍රය හා නූතන ග්‍රන්ථ
- පින්තූර

  ඇමුණුම් අංක 5.6.1

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

පහත විෂය කරුණු ඇසුරින් පාඩම සැලසුම් කරන්න.

**5.6 කෝට්ටේ යුගයේ පිරිවෙන් අධ්‍යාපන විෂයමාලාව**

- දඹදෙණි කතිකාවතෙහි සඳහන් සාමණේර හා උපසම්පන්න අධ්‍යාපන ජීවිතය ක්‍රමයෙන් වර්ධනය වී ඇත.
- කෝට්ටේ යුගයේ සාමණේර අධ්‍යාපනයට අක්ෂරාභ්‍යාසය, ව්‍යාකරණය ආදි විෂයන් ද ඇතුළත් වූ බව හඳුනාගෙන ඇත.
- ශිෂ්‍ය අධ්‍යාපනය තුළ නිසබණ, ප්‍රාතිමෝක්ෂය, පිරිත් පොත, විනය පිටකය, සූත්‍ර, අභිධර්මය, දර්ශනවාද ආදි ධර්ම කොටස් අධ්‍යයනය සිදුව ඇත.
- ඉන්දියානු කලාපීය භාෂාවන් රාශියක් ද කෝට්ටේ පිරිවෙන් ආයතන ආශ්‍රිතව උගන්වා ඇත.

- ලෞකික විෂයන් පිළිබඳව ද අවධානය යොමු කොට ඇත. ඒවා අතර වෛද්‍ය ශාස්ත්‍රය, තර්ක ශාස්ත්‍රය ආදි අංශ ද ඉන්දීය පුරාණ සහ වේද ග්‍රන්ථ ද රාමායනය, මහා භාරතය ආදි ග්‍රන්ථ ද අධ්‍යාපනය සඳහා යොදා ගෙන ඇත.

- ජාත්‍යයන්තර අධ්‍යාපන ආයතන ලෙස කෝට්ටේ පිරිවෙන් ආයතන කීර්තියක් උසුලා ඇත. එම නිසා විදේශීය සිසුන් ද මෙම පිරිවෙන් තුළ අධ්‍යයනය සිදු කර ඇත.

ඉහත විෂය කරුණු අනාවරණය වන සේ ප්‍රශ්න විචාරාත්මක වැඩ සටහනක් පවත්වන්න. කණ්ඩායම් ක්‍රියාකාරකමක් ලෙස යොදා ගන්න.

- පන්තිය සුදුසු පරිදි කණ්ඩායම් කරන්න.
- ඇමුණුම 5.6.1 යටතේ මාතෘකාව කණ්ඩායම් අතර බෙදා දෙන්න.
- එක් එක් කණ්ඩායමට මාතෘකාව අනුව ප්‍රශ්න හා පිළිතුරු සැකසීමට උපදෙස් දෙන්න.
- ඒ ඒ කණ්ඩායම් සකස් කළ ප්‍රශ්න හා පිළිතුරු එක් රැස් කර ගොනු කර ගන්න.
- සුදුසු ලකුණු ක්‍රමයක් අනුගමනය කරමින් ප්‍රශ්න විචාරාත්මක වැඩසටහන පවත් වන්න.
- මෙම ක්‍රියාකාරකමට සක්‍රීය ව දායක වූ සිසුන් උපස්ථම්භනය කර අනිකුත් සිසුන් හට ප්‍රතිපෝෂණය ලබා දෙන්න.

**ඇගයීම හා තක්සේරුකරණය :**

**(පහත සඳහන් නිර්ණායක ආශ්‍රයෙන් ඇගයීම හා තක්සේරුව සිදු කරන්න.)**

- කෝට්ටේ රාජධානි සමයේ පිරිවෙන් අධ්‍යාපනයේ විෂයමාලාව පිළිබඳ කරුණු ඉදිරිපත් කරයි.
- මාතෘකාවට උචිත පරිදි ප්‍රශ්න හා පිළිතුරු සකස් කරයි.
- ප්‍රශ්න නිවැරැදි ව සකස් කරයි.
- ක්‍රියාකාරකම සඳහා සක්‍රිය ව දායක වෙයි
- කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කරයි.

**ඇමුණුම 5.6.1**

**ප්‍රශ්න විචාරාත්මක වැඩසටහනකට මාතෘකා**

✴ කෝට්ටේ යුගයේ පිරිවෙන් විෂය මාලාව

## 6

## ශ්‍රී ලංකාවේ පිරිවෙන් අධ්‍යාපනයේ නව ප්‍රවණතා

යුරෝපා ජාතීන්ගේ ආගමනයත් සමඟ පන්සල මුල් කර ගත් පිරිවෙන්හි බෞද්ධ අධ්‍යාපනය ඉතා ශීඝ්‍රයෙන් පිරිහී ගිය බව නොරහසකි. එසේ වුවත් බුද්ධ ශාසනයත් බෞද්ධ අධ්‍යාපනයත් රැක ගැනීම සඳහා රජුන් හා තෙරවරුන් වහන්සේලා ක්‍රියා කළ ආකාරය ප්‍රශංසනීය ය. ඒ අනුව බෞද්ධ අධ්‍යාපනය නගා සිටුවීමට ඉටු කළ කාර්යභාරය සරණංකර සංඝරාජයන් වහන්සේගේ චරිතයෙන් පැහැදිලි වේ. ඊට ක්‍රි.ව. 1747 දී රජ පැමිණි කීර්ති ශ්‍රී රාජසිංහ රජු අනුග්‍රහය දැක්විය. මේ කාර්යභාරය පසුකාලීන යතිවරුන් වහන්සේලා නව ප්‍රවණතාවකින් ඉදිරියට ගෙන ගිය ආකාරය පිළිබඳවත් එම ආදර්ශය මඟින් අනන්‍යතාව හා උරුමය පිළිබඳ සංවේදී පුරවැසියෙකු නිර්මාණය කිරීම මෙන් ම එහි භාරකාරිත්වය පිළිබඳව මාර්ගෝපදේශය සැලසීම මෙම ඒකකයෙන් අපේක්ෂා කෙරේ.

**නිපුණතාව** : 6.0 ශ්‍රී ලංකාවේ පිරිවෙන්වල නව ප්‍රවණතා පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි.

**නිපුණතා මට්ටම** : 6.1 පිරිවෙන් ඉතිහාසයේ නව පිබිදීම පිළිබඳ තොරතුරු විමර්ශනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල** :

- මුල් කාලයේ පිරිවෙන් අධ්‍යාපනය දියුණු තත්ත්වයක තිබූ බව පෙන්වා දෙයි.
- පිරිවෙන් අධ්‍යාපනය පිරිහීමට හේතු පැහැදිලි කරයි.
- පිරිවෙන් අධ්‍යාපනයේ පැවති දියුණුව අගය කරයි.
- පිරිවෙන් අධ්‍යාපනය රැක ගැනීමට අවශ්‍ය බවට සාධක දක්වයි.

**ආකල්ප හා වටිනාකම්** :

- බෞද්ධ අධ්‍යාපනය රැක ගැනීමට කටයුතු කිරීම

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

6.1 ආරම්භය හා වර්තමාන තත්ත්වය

- මිහිඳු මා හිමියන්ගේ සිට කෝට්ටේ යුගය දක්වා පිරිවෙන්වල තත්ත්වය
- කෝට්ටේ යුගයේ පිරිවෙන්හි දියුණුව

- ලංකාවේ පිරිවෙන් අධ්‍යාපනය පිරිහීම
    - යුරෝපා ජාතීන් මෙරට ආක්‍රමණය කිරීම
    - මෙරට පාලකයන් විදේශීය ජාතීන් සමඟ යුද්ධවලට පැටලී සිටීම
    - දේශීය වශයෙන් පැවති අභ්‍යන්තර කැරලි කෝලාහල
    - දේශීය ආර්ථික තත්ත්වය පිරිහීම
    - විවිධ වසංගත රෝග පැතිරීම
    - කතෝලික හා ක්‍රිස්තියානි මිෂනාරි බලපෑම
    - යුරෝපා ජාතීන් තම අධ්‍යාපන ක්‍රම ප්‍රචලිත කිරීම
    - බුද්ධ ශාසනයට හා පිරිවෙන් සඳහා රාජ්‍ය අනුග්‍රහය නොලැබීම.

- බුදු සසුනේ පරිහානිය දැක්වෙන අවස්ථා
    - ගණින්නාන්සේලා ලෙස ඇතැම් භික්ෂූන් අඹු දරුවන් පෝෂණය කරමින් පන්සල්වල දේපල භුක්ති විඳීම
    - ඔවුන් යකදුරුකම්, වෙදකම්, නැකැත්කම් ආදිය සිදු කිරීම
    - ගිහියන් මෙන් කර්මාන්ත ආදියෙහි යෙදීම

- ගණින්නාන්සේලාගෙන් සිදු වූ සේවය
    - එකල පැවති තාඩන පීඩන හා සමාජ විපර්යාස තුළ මෙන් ම ආර්ථික රටාව තුළ ඔවුන් ඉතිරි වී තිබූ ත්‍රිපිටක ග්‍රන්ථ ඇතුළු පොත පත ආරක්ෂා කිරීම
    - පිරිවෙන් අධ්‍යාපනයේ නව ප්‍රබෝධයක් ඇති කරමින් පිරිවෙන් ආරම්භ කිරීම

**ඇගයීම හා තක්සේරුකරණය :**

- පිරිවෙන් අධ්‍යාපනය පිරිහීමට හේතු දක්වයි.
- පිරිවෙන් අධ්‍යාපනය බෞද්ධයන්ට වැදගත් වන බව අගය කරයි.
- පිරිවෙන් අධ්‍යාපනය රැක ගැනීමට කටයුතු කළ යුතු බව පෙන්වා දෙයි.
- කතාවක් කිරීම සඳහා ඉදිරිපත් වෙයි.
- කථන හැකියා ප්‍රදර්ශනය කරයි.

ඉහත විෂය කරුණු ආවරණය වන සේ පන්තියේ සිසුන් ''ශ්‍රී ලංකාවේ පිරිවෙන් අධ්‍යාපනයේ පරිහානිය'' යන මාතෘකාව යටතේ කථාවක් පන්තියට ඉදිරිපත් කිරීමට යොමු කරවන්න.

- මෙය කේවල ක්‍රියාකාරකමක් ලෙස යොදා ගන්න.
- ඇමුණුම 6.1.1හි තොරතුරු ඇසුරින් කතාව සූදානම් කර ගැනීමට දැනුම් දෙන්න.
- කතාව සූදානම් කර ගැනීම සඳහා දිනයක් සහ කාලයක් ලබා දෙන්න.
- කතාව සඳහා ගත යුතු කාලය පිළිබඳ සිසුන් දැනුවත් කරන්න.

- නියමිත දිනයේ දී සිසුන්ගේ කතා ඉදිරිපත් කරවා ඉහත නිර්ණායක අනුව ඇගයීම හා තක්සේරුව සිදු කරන්න.
- හොඳ ම කතාව සහ කථිකයා තෝරා උපස්ථම්භනය කරන්න.

ඇමුණුම් අංක 6.1.1

"ශ්‍රී ලංකාවේ පිරිවෙන් අධ්‍යාපනයේ පරිහානිය" යන මාතෘකාවට අදාළ ව පහත කරුණු යටතේ කතාවක් සූදානම් කර ගන්න.

- ශ්‍රී ලංකාවේ පිරිවෙන් අධ්‍යාපනය දියුණුව පැවති බව
- පිරිවෙන් අධ්‍යාපනය පිරිහීමට හේතු
- පිරිවෙන් අධ්‍යාපනයේ වැදගත්කම හා එය රැක ගත යුතු බව

කතාව සඳහා විනාඩි 3 ත් 5 අතර කාලයක් යොදා ගන්න.
නියමිත දිනයේ දී සූදානම් කළ කතාව පන්තියට ඉදිරිපත් කරන්න.

**නිපුණතා මට්ටම** : 6.2 පිරිවෙන් ඉතිහාසයේ නව පිබිදීම ඇති කළ සඟරජහිමි පිළිබඳ තොරතුරු විමර්ශනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල** :

- වැලිවිට ශ්‍රී සරණංකර සංඝරාජ හිමි පිළිබඳ තොරතුරු විස්තර කරයි.
- වැලිවිට ශ්‍රී සරණංකර සංඝරාජ හිමි උගත් පඬිවරයෙකු බව පෙන්වා දෙයි.
- වැලිවිට ශ්‍රී සරණංකර හිමියන්ගේ ශ්‍රේෂ්ඨත්වය අගය කරයි.

**ආකල්ප හා වටිනාකම්** :

- ඵලදායි බෞද්ධයෙකු ලෙස ජීවත් වීම

**ගුණාත්මක යෙදවුම්** :

- ඇමුණුම 6.2.1
- weliwitasrisaranankarafoundation.blogspot.com

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

පහත විෂය අන්තර්ගතය ඇසුරින් පාඩම සැලසුම් කර ගන්න.

**6.2.1 වැලිවිට ශ්‍රී සරණංකර සංඝරාජයාණන් වහන්සේ**

- ක්‍රි.ව. 1689 ජුනි 19 දින උපත ලැබීම
- සූරියගොඩ විහාරයේ දී පැවිදි වීම
- ලෙව්කේ රාළහාමි, පල්කුඹුරේ අත්තදස්සී හිමි ගුරුවරුන් වීම
- ඉතා අපහසුතා මැද අධ්‍යාපනය ලැබීම
- සිල්වත් සමාගම ආරම්භ කිරීම
- සාමණේර හිමිවරුන්ට සහ ගිහියන්ට හෝඩිය, ලේඛනය, සකස්කඩ ආදිය ඉගැන්වීම
- කෘති ගණනාවක් රචනා කිරීම
- උපසම්පදාව නැවත ඇති කිරීම
- සංඝරාජ තනතුරින් පිදුම් ලැබීම

ඉහත විෂය කරුණු ආවරණය වන සේ වැලිවිට ශ්‍රී සරණංකර සංඝරාජ හිමි පිළිබඳ ලිපියක් සැකසීමට උපදෙස් දෙන්න.

- මෙය කණ්ඩායම් ක්‍රියාකාරකමක් සේ යොදා ගන්න.
- පන්තිය සුදුසු පරිදි කණ්ඩායම් කරන්න.
- සෑම කණ්ඩායමකට ම වැලිවිට ශ්‍රී සරණංකර සංඝරාජ හිමි පිළිබඳ ඇමුණුම 01හි තොරතුරු ඇතුළත් කර බිත්ති පුවත්පතක් සැකසීමට උපදෙස් දෙන්න.
- තොරතුරු රැස් කිරීමට සතියක කාලයක් ලබා දෙන්න.
- තොරතුරු රැස් කර පන්තියට රැගෙන ආ යුතු දිනය දන්වන්න.
- නියමිත දිනයේ දී වැලිවිට ශ්‍රී සරණංකර සංඝරාජ හිමි පිළිබඳ බිත්ති පුවත්පතක් සැකසීමට උපදෙස් දෙන්න.
- මේ සඳහා එක් කාලච්ඡේදයක් යොදා ගන්න.
- ක්‍රියාකාරකම බිත්ති පුවත්පතක් ලෙස පන්තියට ඉදිරිපත් කරවන්න.

**ඇගයීම හා තක්සේරුකරණය :**

පහත සඳහන් නිර්ණායක ආශ්‍රයෙන් ඇගයීම හා තක්සේරුව සිදු කිරීම

- වැලිවිට ශ්‍රී සරණංකර සංඝරාජ හිමි පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.
- සරණංකර සංඝරාජ හිමි උගත් පඬිවරයෙකු බව අගය කරයි.
- සංඝරාජ හිමි පිළිබඳ නිවැරැදි තොරතුරු ඇතුළත් බිත්ති පුවත්පතක් සකස් කරයි.
- ක්‍රියාකාරකම වඩා නිර්මාණශීලී ව සිදු කරයි.
- සාමූහික ව ක්‍රියා කරයි.

ඇමුණුම් අංක 6.2.1

- වැලිවිට ශ්‍රී සරණංකර සංඝරාජ හිමි පිළිබඳ ඉහත තොරතුරු ඇතුළත් වන සේ බිත්ති පුවත්පතක් සකස් කරන්න.

**නිපුණතා මට්ටම :** 6.3 පිරිවෙන් අධ්‍යාපනය සඳහා සඟරජ හිමිගේ දායකත්වය පෙන්වා දෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 02

**ඉගෙනුම් පල :**

- වැලිවිට ශ්‍රී සරණංකර සංඝරාජ හිමි පිරිවෙන් අධ්‍යාපනය සඳහා කළ සේවය විස්තර කරයි.
- බිඳ වැටෙමින් පැවති පිරිවෙන් අධ්‍යාපනය ස්ථාපිත කිරීම සඳහා සංඝරාජ හිමි දැක් වූ දායකත්වය පෙන්වා දෙයි.
- පිරිවෙන් අධ්‍යාපනය රැක ගැනීමට උරදුන් නායකයින් අගය කරයි.

**ආකල්ප හා වටිනාකම් :**

- යුතුකම් හා වගකීම් නොපිරිහෙළා ඉටු කිරීම

**ගුණාත්මක යෙදවුම් :**

- ''සංඝරාජ සාධු චරියාව'' හා කොටගම වාචිස්සර හිමිගේ ''සරණංකර සංඝරාජ සමය'' ග්‍රන්ථ

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

**පහත විෂය කරුණු ඇසුරින් පාඩම සැලසුම් කර ගන්න.**

**6.3 පිරිවෙන් අධ්‍යාපනය සඳහා සංඝරාජ හිමිගේ දායකත්වය**

- සංඝරාජ හිමියන්ගේ සමයේ විවිධ හේතු මත පිරිවෙන් අධ්‍යාපනයට බාධා එල්ල වීම
- එම අභියෝග ජයගනිමින් පිරිවෙන් අධ්‍යාපනය නගා සිටුවීමට කටයුතු කිරීම.
- පළමුව උන් වහන්සේ වැඩ සිටි මහනුවර නියමකන්ද විහාරස්ථානය පිරිවෙනක් බවට පත් කිරීම



ඡායාරූපය 6.3.1 මහනුවර නියමාකන්ද පිරිවෙන වර්තමානයේ දිස්වන අයුරු

- ගඩලාදෙණිය ධර්මතිලක විහාරය උසස් අධ්‍යාපන ආයතනයක් බවට පත් කිරීම
- දිවයිනේ විවිධ ප්‍රදේශවල අධ්‍යාපන මධ්‍යස්ථාන පිහිටු වීම
- මෙම පිරිවෙන් වර්තමානය දක්වා වර්ධනය වීම
- ගිහි පැවිදි විශාල පිරිසක් මෙම මධ්‍යස්ථානවලින් අධ්‍යාපනය ලැබීම
- සංඝරාජ හිමියන්ගේ ශිෂ්‍ය පරම්පරාවෙන් බෞද්ධ අධ්‍යාපනය සඳහා විශාල සේවාවක් ඉටු වීම

ඉහත විෂය කරුණු ආවරණය වන සේ ''සංඝරාජ හිමියන් පිරිවෙන් අධ්‍යාපනය සඳහා දැක්වූ දායකත්වය'' යන මාතෘකාව යටතේ රචනාවක් ලිවීමට සිසුන් යොමු කරන්න.

- මෙය කේවල ක්‍රියාකාරකමක් ලෙස සිදු කරන්න.
- මේ සඳහා එක් කාලපරිච්ඡේදයක් යොදා ගන්න.
- රචනාව ලියා අවසන් කිරීමෙන් පසු එය ඇගයීම සිදු කරන්න.
- වඩාත්ම සාර්ථක රචනාව තෝරා සෙසු අයටත් එය කියවීමට අවස්ථාව ලබා දෙන්න.

**ඇගයීම හා තක්සේරුකරණය :**

පහත සඳහන් නිර්ණායක ආශ්‍රයෙන් ඇගයීම හා තක්සේරුව සිදු කිරීම

- සංඝරාජ හිමි පිරිවෙන් අධ්‍යාපනය සඳහා දැක් වූ දායකත්වය පැහැදිලි කරයි.
- උන්වහන්සේ විසින් ආරම්භ කළ පිරිවෙන් නම් කරයි.
- සංඝරාජ හිමිගේ සේවාව අගය කරයි
- වඩාත් නිවැරැදි ව හා සාර්ථක ව රචනාව ලියයි.
- කාලය කළමනාකරණය කරමින් ක්‍රියාකාරකමෙහි නිරත වෙයි.

**නිපුණතා මට්ටම** : 6.4 පිරිවෙන් අධ්‍යාපනයේ නව පිබිදීම පිළිබඳ තොරතුරු විමර්ශනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල** :

- පසුකාලීන ව ආරම්භ වූ පිරිවෙන් නම් කරයි.
- පිරිවෙන් මගින් සිදු වූ සේවා ව අගය කරයි.
- පිරිවෙන් අධ්‍යාපනයේ වර්ධනය පෙන්වා දෙයි.

**ආකල්ප හා වටිනාකම්** :

- මෙරට මහා වියතුන් පඬිවරුන් රැසක් පිරිවෙන් අධ්‍යාපනයෙන් බිහි වීම

**ගුණාත්මක යෙදවුම්** :

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

පහත විෂය කරුණු ඇසුරින් පාඩම සැලසුම් කර ගන්න.

**6.4 පසුකාලීන ව පිරිවෙන් ආරම්භ කළ නාහිමිවරු හා විවිධ සමිති සමාගම්**

සරණංකර හිමිගේ පිරිවෙන් යුගයෙන් පසු බිහි වූ ප්‍රථම පිරිවෙන රත්නපුර පැල්මඩුල්ලේ විහාරය යි.

- මෙම පිරිවෙනින් පඬිවරු රැසක් බිහි වීම

උදාහරණ: වලානේ ශ්‍රී සිද්ධාර්ථ හිමි, ඉඳුරුවේ සුමංගල හිමි, වස්කඩුවෙ ශ්‍රී සුභූති හිමි

- මෙම වියතුන් පිරිවෙන් රැසක් ආරම්භ කිරීම

- වලානේ ශ්‍රී සිද්ධාර්ථ නාහිමි - රත්මලානේ පරමධම්මචේතිය පිරිවෙන
- හික්කඩුවේ සුමංගල නාහිමි - 1873 විද්‍යෝදය පිරිවෙන
- රත්මලානේ ධම්මාලෝක නාහිමි - 1875 විද්‍යාලංකාර පිරිවෙන
- හෙන්රි ස්ටීල් ඕල්කට්තුමා 1880 - පරම විඥානාර්ථ සමාගම
- ශ්‍රීමත් අනගාරික ධර්මපාලතුමා - මහා බෝධි සමාගම
- ගිහි බෞද්ධ සිසුන් උදෙසා රට පුරා පාසල් ඇරඹීම
- පිරිවෙන්හි දියුණුවට පංචමහාවාද හා ශාස්ත්‍රීය වාද හේතු වීම

- 1864 බද්දේගම වාදය
- 1866 උදම්විට වාදය
- 1865 වරාගොඩ වාදය
- 1871 ගම්පොල වාදය
- 1873 පානදුර වාදය
- සව්සත්දම් වාදය
- නණ ලළ වාදය
- පාරුපණ වාදය

ඉහත විෂය අන්තර්ගතය ආවරණය වන සේ ඇමුණුම 1 හා 2 හි සඳහන් වගුව සම්පූර්ණ කිරීමට සිසුන් යොමු කරවන්න.

මෙය කේවල ක්‍රියාකාරකමක් ලෙස යොදා ගන්න.

- ඇමුණුම 6.4.1හි සඳහන් වගුව හුණු පුවරුවේ සටහන් කර සිසුන්ට එය පිටපත් කර ගැනීමට සලස්වා එය සම්පූර්ණ කිරීමට සිසුන් යොමු කරවන්න.
- වගුව සම්පූර්ණ කිරීමට විනාඩි 20ක පමණ කාලයක් ලබා දෙන්න.
- සිසු ක්‍රියාකාරකම් ඇගයීමට ලක් කරන්න.

**ඇගයීම හා තක්සේරුකරණය :**

- බෞද්ධ අධ්‍යාපන පුනරුදයේ පුරෝගාමී නායක උතුමන් නම් කරයි.
- පසුකාලීන වියතුන්ගේ පිරිවෙන් පෙන්වා දෙයි
- කරුණු නිවැරැදි ව ඉදිරිපත් කරයි.
- කරුණු ගොනු කරලීමේ හා ඉදිරිපත් කිරීමේ කුසලතා පෙන්වයි.
- නියමිත කාලයට ඉදිරිපත් කරයි

ඇමුණුම 6.4.1

| සමාගම | ආරම්භ කළ අය | සිදු වූ සේවාව |
|---|---|---|
| | | |

**නිපුණතා මට්ටම :** 6.5 පිරිවෙන් පාලනය, සාමාජිකයන් හා එහි සංයුතිය පාලන සංවිධාන විමසා බලයි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 03

**ඉගෙනුම් පල :**

- පිරිවෙන් පාලන සංවිධාන පැහැදිලි කරයි.
- පිරිවෙන් පාලනයට බලපාන ව්‍යවස්ථා හා පනත් පැහැදිලි කරයි
- පිරිවෙන් ආයතනවල කාර්යක්ෂමතාවයට එහි පරමාර්ථ හේතු වන ආකාරය පෙන්වා දෙයි.
- පිරිවෙන් පාලන අණපනත් මගින් විධිමත් ව පිරිවෙන් පවත්වාගෙන යාමට ඇති හැකියාව අගය යි.

**ආකල්ප හා වටිනාකම් :**

- නීතිරීතිවලට අනුගතව කටයුතු කිරීමේ වැදගත්කම වටහා ගැනීම

**පාඩම සැලසුමට උපදෙස්**

**6.5 පිරිවෙන් පාලනය හා පාලන සංවිධානය**

- පිරිවෙන් පාලනයට එකතු වූ සමාගම් හා පනත්
- ක්‍රි.ව. 1867 අධ්‍යාපන කොමිසන් සභාව
- ක්‍රි.ව.1902 පිහිට වූ ප්‍රාචීන භාෂෝපකාර සමාගම
- ක්‍රි.ව. 1943 සී. ඩබ්.ඩබ්. කන්නන්ගර මහතා උපදේශක සභාවක් පත් කිරීම
- ක්‍රි.ව. 1959 ඩබ්. දහනායක මහතා පිරිවෙන් වර්ග කොට ව්‍යවස්ථා මාලාවක් සැකසීම
- ක්‍රි.ව.1959 විද්‍යෝදය විද්‍යාලංකාර පිරිවෙන් දෙක විශ්වවිද්‍යාල බවට පත් කිරීම
- ක්‍රි.ව. 1979 අංක 64 දරන පිරිවෙන් අධ්‍යාපන පනත
- ක්‍රි.ව. 1980 අංක 1 දරන පිරිවෙන් පනත

- මෙම පනත් මගින් ඉටු කිරීමට බලාපොරොත්තු වන අරමුණු

1. පරියත්ති, පටිපත්ති, පටිවෙධ සහ ත්‍රිවිධ ශාසනයට අනුගත භික්ෂූන් හැඩගැසීම
2. භික්ෂූන් වහන්සේලා තුළ විනය, ත්‍රිපිටකධාරණය, ධර්මගරුක බව ඇති කිරීම
3. දේශීය, විදේශිය ධර්මදූත සේවය

- වර්තමාන පිරිවෙන් වර්ග

  මූලික පිරිවෙන්
  මහ පිරිවෙන්
  පිරිවෙන් විද්‍යායතන
  ග්‍රාමවාසී පිරිවෙන්
  වනවාසී පිරිවෙන්
  දසසිල් මාතාවන්ගේ අධ්‍යාපන ආයතන
  වතුරවිල අරණ්‍ය සේනාසනය මුල් කර ගත් වනවාසී ශාසනික පිළිවෙත් හා ආධ්‍යාත්මික හික්ම වීම
  මාතර මුලටියන, මිනුවන්ගොඩ, මානෙල් වත්ත, මහනුවර, කළුතර ආදි ප්‍රදේශවල දස සිල් මාතාවන් සඳහා අධ්‍යාපන ආයතන පවත්වාගෙන යාම

**ගුණාත්මක යෙදවුම්** :

- පිරිවෙන් හා සම්බන්ධ පනත් හා ව්‍යවස්ථා
- පිරිවෙන් අරමුණු සහිත ලියන ලද පෝස්ටර්
- පිරිවෙන් වර්ග හා ඉගැන්වෙන පාඨමාලා සහිත පුවරු

**ඇගයීම හා තක්සේරුකරණය** :

- ශ්‍රී ලංකාවේ වර්තමාන පිරිවෙන් පාලන ක්‍රියාවලිය පිළිබඳ කරුණු ඉදිරිපත් කරයි.
- එහි සංයුතිය හා අරමුණු පැහැදිලි කරයි.
- තොරතුරුවලට අදාළ ප්‍රශ්න සකස් කරයි.
- ලබා දෙන නියමිත කාලයට අවසන් කරයි.
- පොත් පිංච පිරිසිදු ව හා ආකර්ශණීය ව සකස් කරයි

ඉහත විෂය කරුණු ආවරණය වන සේ පහත ක්‍රියාකාරකමෙහි සිසුන් යොමු කරන්න.

- මෙය කේවල ක්‍රියාකාරකමක් ලෙස යොදා ගන්න.
- නිර්ණායක ඇසුරින් ඇගයීම හා තක්සේරුව සිදු කරන්න.
- මෙම පාඩම ඇසුරින් කෙටි ප්‍රශ්න හා පිළිතුරු ඇතුළත් පොත් පිංචක් සකස් කිරීමට උපදෙස් දෙන්න.
- මේ සඳහා සතියක කාලයක් ලබා දෙන්න.
- ප්‍රශ්න පොත් එකතු කර වඩාත් නිවැරැදි හා සාර්ථක ප්‍රශ්න තෝරා උපස්ථම්භනය කරන්න.

7

# ශ්‍රී ලංකාවේ අනන්‍යතාව අගයමු.

අතීතයේ ශ්‍රී ලංකාවේ පැවති සිංහල බෞද්ධ ජන සමාජය වර්තමානය වන විට විවිධ ජන වර්ගවලට අයත් (සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර්, මැලේ) පිරිස ජීවත්වන රටක් බවට පත් වී ඇත. මේ නිසා එක් එක් ජන වර්ගවලට සුවිශේෂී වූ ආගම් හා සංස්කෘතීන් ගණනාවක් ගොඩනැගී ඇත. ජනවර්ග අතර ආගමික හා සංස්කෘතිකමය වශයෙන් විවිධත්වයක් දැක ගත හැකි වුවත් ශ්‍රී ලංකාව එකම රටක් ලෙස ගත් කල මෙම විවිධත්වය පසෙකලා එක ම ජාතික අනන්‍යතාවකින් යුතු ව ජීවත් වන ශ්‍රී ලාංකිකයන් ලෙස හඳුන්වා දිය හැකිය.

සැබෑ ශ්‍රී ලාංකිකයෙකු ලෙස ජීවත් වන්නේ නම්, සියලු ආගම් හා සංස්කෘතික බෙදීම්වලින් තොරව ජාතියේ අනන්‍යතාව රැක ගැනීමට කටයුතු කළ යුතු ය. මේ නිසා ශ්‍රී ලාංකික සංස්කෘතිය තුළ ජාතික අනන්‍යතාව නිවැරැදි ව හඳුනාගැනීම මඟින් රට, ජාතිය පිළිබඳව හැඟීම හා ගෞරවය ගොඩනැගෙනු ඇත.

එම නිසා ජාතික අනන්‍යතාව හඳුනාගනිමින් ජාතික සංකේත පිළිබඳව අවබෝධයක් ලබාදීම මෙම ඒකකයෙන් අපේක්ෂා කෙරේ.

**නිපුණතාව** : 7.0 ශ්‍රී ලාංකික අනන්‍යතාව හඳුනාගෙන ඊට අනුගත වේ.

**නිපුණතා මට්ටම** : 7.1 ශ්‍රී ලාංකික අනන්‍යතාව හඳුනාගනිමින් ඊට ගෞරව කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : **02**

**ඉගෙනුම් පල** :

- ශ්‍රී ලාංකික අනන්‍යතාව පැහැදිලි කරයි
- විවිධ ජන වර්ග පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි

**ආකල්ප හා හර පද්ධති** :

- රටේ අනන්‍යතාව ආරක්ෂා වන පරිදි කටයුතු කිරීම
- රට පිළිබඳ හැඟීම හා ගෞරවයක් ඇති කර ගැනීම
- ශ්‍රී ලාංකිකත්වය පිළිබඳ හැඟීමෙන් කටයුතු කිරීම
- විවිධ ජන කොටස් අතර සමගිය හා සහයෝගීතාව වර්ධනය කර ගැනීම

**පාඩම් සැලසුම් සඳහා උපදෙස් :**
පහත විෂය කරුණු ඇසුරින් පාඩම සැලසුම් කර ගන්න.

**4.1 ශ්‍රී ලංකාවේ ජාතික අනන්‍යතාව**

- රටට ආවේණික සිරිත් විරිත් සම්ප්‍රදායයන් හා ජාතිකත්වය පිළිබිඹු කරන සංකේත මගින් ශ්‍රී ලාංකික අනන්‍යතාව ගොඩනැගී තිබීම
- රටේ අනන්‍යතාව පිළිබඳ පැහැදිලි කිරීමේ දී පහත සඳහන් අංශ කෙරෙහි අවධානය යොමු කළ යුතු ය.
- රටේ ජීවත්වන ජන වර්ග
    - සිංහල
    - දෙමළ
    - මුස්ලිම්
    - බර්ගර්
    - මැලේ
    - වෙනත්
- ජනවර්ගවලට අයත් ප්‍රධාන ආගමික ස්ථාන



ඡායාරූපය 7.1.1 පන්සල



ඡායාරූපය 7.1.2 පල්ලිය



ඡායාරූපය 7.1.3 මස්ජිදය



ඡායාරූපය 7.1.4 කෝවිල

- අප රටේ ප්‍රධාන ආගම්වල ආගමික සංකේත හඳුන්වාදීම
    - ධර්ම චක්‍රය
    - ත්‍රිශූලය
    - කුරුසය
    - හඳ පළුව හා තරුව



ඡායාරූපය 7.1.5 ධර්ම චක්‍රය



ඡායාරූපය 7.1.6 ත්‍රිශූලය



ඡායාරූපය 7.1.7 කුරුසය



ඡායාරූපය 7.1.8 හඳ පළුව හා තරුව

බෞද්ධ, හින්දු, ඉස්ලාම් හා ක්‍රිස්තියානි යන ආගම් පහත කරුණු මගින් පැහැදිලි කරන්න.

- දෙවනපැතිස් රජ දවස මිහිඳු හිමියන්ගේ ආගමනයත් සමඟ සංවිධානාත්මක ආගමක් ලෙස බුදුදහම ස්ථාපිත වීම
- විවිධ සබඳතා මගින් (සංක්‍රමණ, ආක්‍රමණ, හා වෙළෙඳාම) හින්දු ආගම මෙරටට පැමිණි අතර එය චෝළ පාලන අවදිය සම්බන්ධයෙන් වඩාත් හොඳින් තහවුරු වීම
- වෙළෙඳාම සඳහා පැමිණි ඉස්ලාම් භක්තිකයන්ගෙන් මෙරට ඉස්ලාම් ධර්මය ව්‍යාප්ත වීම
- යුරෝපා බල ව්‍යාප්තියත් සමඟ ක්‍රිස්තියානි ධර්මය මෙරට ස්ථාපිත වීම (පෘතුගීසි බලපෑම - රෝමානු කතෝලික ආගම, ලන්දේසි - රෙපරමාදු හෙවත් ප්‍රොතෙස්තන්ත්‍ර ආගම)

- ජන වර්ගවලට අයත් ව්‍යවහාරික ප්‍රධාන භාෂා
    - සිංහල
    - දෙමළ
    - ඉංග්‍රීසි

- විවිධ ජන වර්ගවලට අයත් ජන කොටස් අතර විවිධ බෙදීම් පැවතියත් එක ම රටක් එක ම ජාතිය ක් ලෙස ගත් කල සියලු දෙනා ම ශ්‍රී ලාංකිකයන් ලෙස හැඳින්වේ.

- විදේශ රටවල පවතින ඇඳුම් පැලඳුම්, පෙළපත් නාම, පුද්ගල නාම, ග්‍රාම නාම, ආහාරපාන, ගෘහනිර්මාණ මෙරට ජන සමාජයට සම්මිශ්‍ර වී ඇති බව පැහැදිලි කරන්න.

උදාහරණ : සාරිය, කලිසම, කමිස, ගවුම්, සාය, හැට්ට,
පෙරේරා, සොයිසා, ප්‍රනාන්දු, සිල්වා, කොස්තා
සම්බෝල, අච්චාරු, කිරිබත්, පාන්, වයින්, කේක්
කණප්පු, ඉස්තෝප්පු, තරප්පු, වැරන්ඩා

ඉහත විෂය කරුණු තහවුරු වන පරිදි පහත සඳහන් ක්‍රියාකාරකම සිදු කරන්න.

ක්‍රියාකාරකම සඳහා උපදෙස්


- මෙය කණ්ඩායම් ක්‍රියාකාරකමක් ලෙස යොදා ගන්න.
- පන්තිය සුදුසු පරිදි කණ්ඩායම් කරන්න.
- ඇමුණුම් අංක 1 හා කාර්ය පත්‍රිකාව කණ්ඩායම්වලට ලබා දෙන්න.
- එක් එක් කණ්ඩායමට බ්‍රිස්ටල් බෝඩ් 2 බැගින් හා ප්ලැටිග්නම් පෑන් ලබා දෙන්න.
- ඇමුණුම් අංක 02හි ඇතුළත් පින්තූර එක් එක් කණ්ඩායමට ලබා දෙන්න
- කාර්ය පත්‍රිකාවේ සඳහන් වගු සටහන් බ්‍රිස්ටල් බෝඩ්වල ඇඳ ගන්නා ලෙස උපදෙස් දෙන්න.
- වගු සටහනේ සඳහන් මාතෘකාවලට අදාළ පින්තූර ඇමුණුම් අංක 2 න් තෝරා කපා අලවන ලෙස දැනුම් දෙන්න.
- ඇතැම් මාතෘකාවලට අදාළ ව වගු සටහනේ තොරතුරු ඇතුළත් කරන්න
- ක්‍රියාකාරකම අවසානයේ පන්තියේ ප්‍රදර්ශනය කර එය විස්තර කිරීමට උපදෙස් දෙන්න.
- සිසු ඉදිරිපත් කිරීම්වල දුබලතා හා ප්‍රබලතා පෙන්වා දෙමින් පාඩම් සමාලෝචනය කරන්න.

**ගුණාත්මක යෙදවුම්:**


- බ්‍රිස්ටල් බෝඩ්
- ප්ලැටිග්නම්
- ඇමුණුම අංක 01,02

ඇමුණුම 01

කාර්ය පත්‍රිකා 01




කාර්ය පත්‍රිකා 02



**ඇගයීම හා තක්සේරුකරණය :**

පහත සඳහන් නිර්ණායක ඇසුරින් ඇගයීම හා තක්සේරුව සිදු කරන්න.

- එක් එක් මාතෘකාවලට අදාළ ව තොරතුරු පැහැදිලි කරයි.
- නිවැරැදි ව (වගු සටහන) සම්පූර්ණ කරයි
- කණ්ඩායම් සහයෝගයෙන් කටයුතු කරයි
- ශ්‍රී ලාංකික අනන්‍යතාව පිළිබඳ අදහස් ඉදිරිපත් කරයි
- නියමිත කාලයට කාර්යය නිම කරයි


ඇමුණුම 2

**ජන වර්ග**






**ඇඳුම් පැළඳුම්**



ආහාර පාන









ආගමික සිද්ධස්ථාන






ආගමික සංකේත

**නිපුණතා මට්ටම** : 7.2 ශ්‍රී ලංකාවේ රාජ්‍ය ලාංඡනය පිළිබඳ විස්තර කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 01

**ඉගෙනුම් පල** :

- රාජ්‍ය ලාංඡනය නිර්මාණය වූ ආකාරය පෙන්වා දෙයි.
- රාජ්‍ය ලාංඡනයේ සංකේත හා ඉන් නිරූපිත අංග පැහැදිලි කරයි.
- රාජ්‍ය ලාංඡනය භාවිත කරන අවස්ථා විස්තර කරයි.

**ආකල්ප හා හර පද්ධති** :


- රාජ්‍ය ලාංඡනයක ඇති වටිනාකම හඳුනා ගැනීම

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

පහත සඳහන් විෂය කරුණු ඇසුරින් පාඩම සැලසුම් කරන්න.

- ශ්‍රී ලංකාවේ රාජ්‍ය ලාංඡනය

1. පුන් කළස - සෞභාග්‍යය
2. වී කරල් - සශ්‍රීකත්වය
3. ධර්මචක්‍රය - ධර්මය
4. ඉර හඳ - සදාතනික බව
5. සිංහයා - රට හා විනය ගරුක ජාතිය
6. පලා පෙති - පිවිතුරු බව




රූපය 7.2.1

**ගුණාත්මක යෙදවුම්** :

- රාජ්‍ය ලාංඡනයේ පින්තූරයක්
- ඇමුණුම් අංක 01

**ක්‍රියාකාරකම**

ඉහත විෂය කරුණු ඉස්මතු වන සේ පහත ක්‍රියාකාරකම සිදු කරන්න.

- මෙය කේවල ක්‍රියාකාරකමක් ලෙස සිදු කරන්න.
- ඇමුණුම් අංක 01හි කාර්ය පත්‍රිකාව පන්තියට ප්‍රදර්ශනය කරන්න.
- රාජ්‍ය ලාංඡනයෙහි පිටපත් සිසුන්ට ලබා දෙන්න.
- ක්‍රියාකාරකම සඳහා අවශ්‍ය කාලය ලබා දෙන්න.

- සිසු ක්‍රියාකාරකම්වල ප්‍රබලතා හා දුබලතා හඳුනා ගනිමින් ඉදිරි පෝෂණ ප්‍රතිපෝෂණ ලබා දෙන්න.
- පාඩම සමාලෝචනය කරන්න.

**ඇමුණුම් අංක 01**

- ඔබට ලැබී ඇති රාජ්‍ය ලාංඡනය අභ්‍යාස පොතේ අලවා එහි ඇති සංකේත මගින් නිරූපණය වන අර්ථය සටහන් කරන්න.
- රාජ්‍ය ලාංඡනය භාවිත වන අවස්ථා පහක් උදාහරණ සහිතව නම් කරන්න

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

- සංකේත නිවැරැදි ව නම් කිරීම
- රාජ්‍ය ලාංඡනය මගින් නිරූපණය වන දෑ විස්තර කිරීම
- රාජ්‍ය ලාංඡනය දැකිය හැකි ස්ථාන සඳහන් කිරීම
- තොරතුරු නිවැරැදි ව දැක්වීම
- නියමිත කාලයට කාර්යය නිම කිරීම

**නිපුණතා මට්ටම** : 7.3 ශ්‍රී ලංකාවේ ජාතික කොඩියේ සංකේත පැහැදිලි කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල** :

- ජාතික කොඩියේ සංකේත හා ඉන් නිරූපිත අංග පැහැදිලි කරයි.
- ජාතික කොඩිය ඔසවන හා අඩකුඹු කරන අවස්ථා විස්තර කරයි.
- ජාතික කොඩියට ගරු කිරීමට හුරු වෙයි.
- ජාතික කොඩිය අවභාවිත වන අවස්ථා පෙන්වා දෙයි.

**ආකල්ප හා හර පද්ධති** :

- ජාතික කොඩියට ගරු කිරීමට පෙළඹීම
- ජාතික කොඩිය නිවැරදි ව භාවිත කිරීමට හුරුවීම
- ජාතික කොඩිය පිළිබඳ ගෞරවාන්විත හැඟීමෙන් කතා කිරීම

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

පහත සඳහන් විෂය කරුණු ඇසුරින් පාඩම සැලසුම් කර ගන්න.

**ජාතික කොඩිය**



- ශ්‍රී ලාංකික ජාතික කොඩිය නිර්මාණය කිරීමේ දී ආභාසය ලබා ගත් මූලාශ්‍රය පිළිබඳ විස්තර කරන්න.
- ජාතික කොඩියේ සංකේත මගින් නිරූපණය වන දෑ පෙන්වා දෙන්න.
- ජාතික කොඩිය ඔසවන ලද අවස්ථා පැහැදිලි කරන්න.
- ජාතික කොඩිය අඩකුඹු කෙරෙන අවස්ථා පැහැදිලි කරන්න.

  » රාජ්‍ය නායකයෙකු මිය ගිය විට
  
  » ජාතික විපතක දී
  
  » ජාතික ශෝක දිනවල දී

- ජාතික කොඩිය ප්‍රදර්ශනය කිරීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු පෙන්වා දෙන්න.

ජාතික කොඩිය අවභාවිත කරන අවස්ථා

- » ක්‍රීඩා තරගවල දී කරේ දමාගෙන නැටීම
- » ඉරුණු ජාතික කොඩි එස වීම
- » මංගල අවස්ථාවල දී සිරස් අතට එල්ලීම

**මූලික වදන් සංකල්ප** : අඩකුඹු

**ගුණාත්මක යෙදවුම්** :

- ජාතික කොඩියේ පින්තූරයක්
- ජාතික කොඩිය අඩකුඹු කළ අවස්ථාවක පින්තූරයක්
- ජාතික කොඩිය අවභාවිත වන අවස්ථාවල පින්තූර

**ක්‍රියාකාරකම**

- මෙය කේවල ක්‍රියාකාරකමක් ලෙස සිදු කරන්න.
- ඇමුණුම් අංක 1හි ඇතුළත් කාර්ය පත්‍රිකාව පන්තියට ප්‍රදර්ශනය කරන්න.
- ක්‍රියාකාරකම සඳහා සුදුසු කාලයක් ලබා දෙන්න.
- අහඹු ලෙස තෝරා ගත් ක්‍රියාකාරකම් කිහිපයක් පන්තියට ඉදිරිපත් කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- සිසු ක්‍රියාකාරකම් අගය කරමින් පාඩම සමාලෝචනය කරන්න.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**
පහත සඳහන් නිර්ණායක ඇසුරින් ඇගයීම හා තක්සේරුව සිදු කරන්න.

- කරුණුවල නිවැරැදිබව
- කරුණු සංවිධානාත්මකව ඉදිරිපත් කිරීම
- නිර්මාණශීලී ව අදහස් ප්‍රකාශ කිරීම
- සමස්ත නිමාව
- කාල කළමනාකරණය

ඇමුණුම 1

- ශ්‍රී ලංකාවේ අනන්‍යතාව පිළිබිඹු කරන ජාතික කොඩිය යන මැයෙන් රචනයක් ලියන්න.

**නිපුණතා මට්ටම** : 7.4 ජාතික අනන්‍යතාව පෙන්නුම් කෙරෙන සංකේත පැහැදිලි කරයි

**කාලච්ඡේද සංඛ්‍යාව** : 03

**ඉගෙනුම් පල** :

- ශ්‍රී ලාංකික අනන්‍යතා සංකේත විස්තර කරයි.
- ශ්‍රී ලාංකික අනන්‍යතාවට අනුගත ව ක්‍රියා කළ යුතු බව පෙන්වා දෙයි.
- ශ්‍රී ලංකාවට ආවේණික සංකේත මොනවාදැ'යි පැහැදිලි කරයි.

**ආකල්ප හා වටිනාකම්** :

- ජාතික ගීයට ගරු කිරීම
- ජාතික ගීය ගායනා කිරීමේ දී නිවැරැදි ඉරියව් අනුගමනය කිරීම
- ජාතික සංකේත පිළිබඳ ගෞරවනීය හැඟීමක් ඇති කර ගැනීම

**පාඩම සැලසුම සඳහා උපදෙස්** :

පහත සඳහන් විෂය කරුණු ඇසුරින් පාඩම සැලසුම් කර ගන්න

- **ජාතික ගීය**

  » ජාතික ගීය පන්තියේ සිසුන්ට ඇසීමට සලස්වන්න.
  » ජාතික ගීය ගායනා කරනු ලබන අවස්ථා පෙන්වා දෙන්න.
  » ජාතික ගීයේ අවශ්‍යතාව පැහැදිලි කරන්න.

- **ජාතික වෘක්ෂය**



ඡායාරූපය 7.4.1

ජාතික වෘක්ෂය ලෙස **නා ගස** තෝරා ගැනීමට හේතු සහ නා ගසේ වටිනාකම පැහැදිලි කරන්න.

- **ජාතික පුෂ්පය**



ඡායාරූපය 7.4.2

ජාතික පුෂ්පය ලෙස **ශ්‍රී ලංකා මානෙල් මල** තෝරා ගැනීමට බලපෑ හේතු සහ වටිනාකම පෙන්වා දෙන්න.

- **ජාතික පක්ෂියා**



ඡායාරූපය 7.4.3

ශ්‍රී ලංකාවේ ජාතික පක්ෂියා ලෙස **වලිකුකුළා** තෝරා ගැනීමට හේතු පැහැදිලි කර දෙන්න.

- **ජාතික ක්‍රීඩාව**



ඡායාරූපය 7.4.4

ශ්‍රී ලංකාවේ ජාතික ක්‍රීඩාව ලෙස **අත්පන්දු ක්‍රීඩාව** (වොලිබෝල්) තෝරා ගැනීමට හේතු පෙන්වා දෙන්න.

- **ජාතික සත්වයා**



ඡායාරූපය 7.4.5

ශ්‍රී ලංකාවේ ජාතික සත්වයා **දඬු ලේනා** ය.

ශ්‍රී ලංකාවේ සෑම පළාතකම දැක ගත හැකිය.


- **ජාතික සමනලයා**



ඡායාරූපය 7.4.6

ලංකාවේ ජාතික සමනලයා **ශ්‍රී ලංකා බර්ඩ් වින්ග්** ය.

- **ජාතික මැණික**



ඡායාරූපය 7.4.7

ශ්‍රී ලංකාවේ ජාතික මැණික **නිල් මැණික** ය.

**ක්‍රියාකාරකම**

ඉහත විෂය කරුණු ආවරණය වන පරිදි ප්‍රශ්න විචාරාත්මක වැඩසටහනක් පවත්වන්න.

- පහත සඳහන් මාතෘකා යටතේ ප්‍රශ්න සකස් කර දෙන ලෙස සිසුන්ට දැනුම් දෙන්න.
  - ජාතික ගීය - ජාතික වෘක්ෂය
  - ජාතික පුෂ්පය - ජාතික පක්ෂියා
  - ජාතික ක්‍රීඩාව - ජාතික සත්වයා
  - ජාතික සමනලයා - ජාතික මැණික
- සුදුසු පරිදි සිසුන් කණ්ඩායම් කර ඉහත මාතෘකා බෙදා දෙන්න
- ප්‍රශ්න සැකසීමට අවශ්‍ය කාලය ලබා දෙන්න
- විෂය අන්තර්ගතය ආවරණය වන සේ සකස් කරන ලද ප්‍රශ්න තෝරා ප්‍රශ්න එකතුවක් සකස් කරන්න.
- සිසු සංඛ්‍යාව අනුව පන්තිය බෙදා ප්‍රශ්න විචාරාත්මක තරගයක් පවත්වන්න.
- මේ සඳහා එක් කාලච්ඡේදයක් යොදා ගන්න.
- ප්‍රශ්න විචාරාත්මක තරගයක දී පිළිපැදිය යුතු නීති රීති අනුගමනය කරමින් කණ්ඩායම් සඳහා ලකුණු ලබා දෙන්න.
- සිසු දක්ෂතා ඇගයීමට ලක් කරන්න.

**ගුණාත්මක යෙදවුම් :**

- ජාතික සංකේත සඳහා ඇති පොත් පත්

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- ජාතික සංකේත පිළිබඳ නිවැරැදි ව තොරතුරු ඉදිරිපත් කිරීම
- නිවැරැදි ව ප්‍රශ්න සකස් කිරීම
- ප්‍රශ්න විචාරාත්මක වැඩ සටහන් නීතිරීතිවලට අනුව පැවැත්වීම
- ප්‍රශ්නවලට පිළිතුරු දීමට ඉදිරිපත් වීම
- ජය පරාජය දෙකම විඳිමින් සහයෝගයෙන් කටයුතු කිරීම

**නිපුණතා මට්ටම** : 7.5 පිරිවෙන් ලාංඡනය හඳුනාගෙන පැහැදිලි කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල** :

- පිරිවෙන ධජය නිර්මාණය වූ ආකාරය හඳුන්වා දෙයි.
- පිරිවෙන ධජයෙන් නිරූපණය වන සංකේත පැහැදිලි කරයි.
- පිරිවෙන ධජයෙහි වටිනාකම පිළිබඳ ප්‍රකාශ කරයි.

**ආකල්ප හා වටිනාකම්** :

- විවිධ සංකේත මගින් අර්ථ පිළිඹිබු වන බව වටහා ගැනීම

**පාඩම් සඳහා උපදෙස් :**

පහත සඳහන් විෂය කරුණු ඇසුරෙන් පාඩම සැලසුම් කර ගන්න.

- **පිරිවෙන් ධජය**

  සමස්ත ලංකා පිරිවෙන් කෘත්‍යාධිකාරී පරිවේනාධිපති සංගමය මගින් පිරිවෙන් ඒකකයේ අනුමැතියෙන් පිරිවෙන් ධජය නිර්මාණය කර ඇති ආකාරය පෙන්වා දෙන්න.

- **පිරිවෙන් ධජයේ සංකේත**

  - කහපාට පසුබිම
  - දුඹුරුපාට කොටස
  - පහන
  - ධර්ම චක්‍රය
  - ධර්ම චක්‍රය මධ්‍යයේ ඇති නෙළුම් මල
  - හතරැස් කොටුවේ මුලු හතරේ ඇති නෙළුම් මල් හතර



ඡායාරූපය 7.5.1

- පාසලෙන් පාසලට, පාසල් ධජය වෙනස් වුව ද පිරිවෙන් පද්ධතියට එක ම ධජයක් තිබීම සුවිශේෂත්වයක් බව පෙන්වා දෙන්න.

- පිරිවෙණ සඳහා ධජයක අවශ්‍යතාව පැහැදිලි කරන්න.

ක්‍රියාකාරකම

- **ඉහත කරුණු ආවරණය වන සේ පහත ක්‍රියාකාරකමෙහි සිසුන් යොමු කරවන්න.**

  - **''පිරිවෙන ධජයෙහි වටිනාකම''** යන මැයෙන් කථාවක් ඉදිරිපත් කරන්න.
  - මෙය කේවල ක්‍රියාකාරකමක් ලෙස යොදා ගන්න.
  - ප්‍රමාණවත් කාලයක් ලබා දෙන්න.
  - සිසු ප්‍රබලතා, දුබලතා පෙන්වා දෙමින් විෂය කරුණු සමාලෝචනය කරන්න.

**ඇගයීම හා තක්සේරුකරණය :**

- පිරිවෙන ධජයෙහි සංකේත නම් කිරීම
- එම සංකේත මගින් නිරූපිත අර්ථය පැහැදිලි කිරීම
- කරුණු සංවිධානගත කිරීම
- ආකර්ෂණීය ලෙස කථාව ඉදිරිපත් කිරීම
- කාලය කළමනාකරණය කිරීම

8

## ලෝකයේ පැරණි ශිෂ්ටාචාර

වානර මානවයාගේ සිට නූතන මිනිසා බිහිවීමෙන් අනතුරුව, නූතන මිනිසා ස්වාභාවික පරිසරය සමඟ ගැටෙමින් ජීවත් වූ කාල පරිච්ඡේදය මානව ශිෂ්ටාචාරය විකාශනයේ තීරණාත්මක කාල පරිච්ඡේදයක් විය. තම අවශ්‍යතා ඉටු කර ගැනීමට ක්‍රියා කිරීමේ දී මුහුණ දුන් අභියෝගවලට ප්‍රතිචාර දැක්වීමට යාමෙන් විවිධ ජයග්‍රහණ අත්පත් කර ගැනීමට මිනිසා සමත් විය. ලෝකයේ විවිධ කාල පරිච්ඡේදවල විවිධ භූගෝලීය පරිසරයන්හි ගොඩනැගුණු ශිෂ්ටාචාර ද එම මානවයාගේ සුවිශේෂ ජයග්‍රහණයකි. එනම් ශිෂ්ටාචාර බිහි වීම යනු ක්‍රමික විකාශනයක ප්‍රතිඵලයක් ය යන්න ය. ශිෂ්ටාචාර බිහි වීමට පෙර යුගය ද ලෝකයේ ශිෂ්ටාචාර ආරම්භය හා වර්ධනය ද ශිෂ්ටාචාරවලින් පසු කාලීන සමාජයට ඇති වූ බලපෑම පිළිබඳව ද මෙම ඒකකයෙන් අධ්‍යයනය කිරීමට අපේක්ෂා කෙරේ.

**නිපුණතාව** : 8.0 ලෝකයේ ශිෂ්ටාචාරවල ආරම්භය හා වර්ධනය පෙන්වා දෙයි.

**නිපුණතා මට්ටම** : 8.1 ශිෂ්ටාචාර ආරම්භ වීමට පෙර ඓතිහාසික තත්ත්වය පිළිබඳ තොරතුරු විස්තර කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල** :

- ශිෂ්ටාචාර ආරම්භ වීමට පෙර ආදි මානවයා පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.
- ආදි මානවයන් මුහුණ දුන් අභියෝග හා ඒවා ජය ගත් ආකාරය පැහැදිලි කරයි.

**ආකල්ප හා හර පද්ධති** :

- අභියෝගවලට සාර්ථකව මුහුණ දීමට හැකියාව ලබා ගැනීම

**ගුණාත්මක යෙදවුම්** :

- www.philosophytalk.org/blog/being-human-being - here
- www.britannica.com
- පැරණි මානවයා හා ඔහුගේ ක්‍රියාකාරකම් පිළිබඳ පින්තූර
- ඇමුණුම් අංක 1,2

**පාඩම් සඳහා උපදෙස්** :

පහත සඳහන් විෂය කරුණු ඇසුරෙන් පාඩම සැලසුම් කර ගන්න.

**8.1 ශිෂ්ටාචාර බිහි වීමට පෙර අවදිය**

ලෝකයේ ශිෂ්ටාචාර ගොඩනැගීමට පෙර අවදියේ (ප්‍රාග් ඓතිහාසික යුගය) මානවයා භාවිත කළ ශිලා මෙවලම් අනුව එම යුගය ප්‍රධාන අවදි තුනකට බෙදා දැක්විය හැකි ය.

» පූර්ව ශිලා යුගය
» මධ්‍ය ශිලා යුගය
» නව ශිලා යුගය

- පූර්ව ශිලා යුගය

  - මිනිසුන් කණ්ඩායම් ලෙස තැනින් තැන ජීවත් වීම
  - ආහාර සම්පාදනය කර ගැනීම සඳහා දඩයම හා ආහාර එකතු කිරීම සිදු කිරීම
  - මළවුන් සඳහා චාරිත්‍ර පැවැත් වීම
  - ඇටසැකිලිවල වර්ණ ආලේප කිරීම (මේ සඳහා ගුරු ගල් භාවිත කිරීම)
  - මෙම යුගයේ අවසාන භාගයේ දී පමණ චිත්‍ර ඇඳීම හා ගලින් කරන ලද රූප නෙළීමට පුරුදු වීම



ඡායාරූපය 8.1.1 පූර්ව ශිලා යුගයට අයත් ගල් මෙවලම්



ඡායාරූපය 8.1.2 පූර්ව ශිලා යුගයට අයත් 14000කට වඩා පැරණි අල්ටමීරා ගුහා සිතුවමක්

- මධ්‍ය ශිලා යුගය

  - ආහාර සම්පාදනය සඳහා තවදුරටත් දඩයම හා ආහාර එකතු කිරීම සිදු කිරීම
  - සතුන් දඩයම සඳහා ගල් මෙවලම් භාවිත කිරීම
  - ගස් ගෙඩි, අලවර්ග, වැඩි වශයෙන් ආහාරයට ගැනීමට පුරුදු වීම
  - වැඩි කාලයක් එක් ස්ථානයක නවාතැන් ගැනීමට පුරුදු වීම
  - දැව දඬු හා කොළ අතු ආදිය භාවිත කරමින් තාවකාලික වාසස්ථාන සකස් කර ගැනීම



ඡායාරූපය 8.1.3
එංගලන්තයේ කෙනට් මිටියාවතේ මෙසෝලිතික තැන්පතුවේ පරීක්ෂණ වළක්

- **නව ශිලා යුගය**

  - නව ශිලා යුගය මීට වසර 9000කට පමණ පෙර ආරම්භ වූ බව පෙන්වා දීම
  - පූර්ව ශිලා, මධ්‍ය ශිලා යුගවලට වඩා මෙම යුගය සුවිශේෂ ලක්ෂණවලින් යුක්ත වීම

    - ගොවිතැන ආරම්භ වීම

උදාහරණ

තිරිඟු, බාර්ලි, කුරක්කන් වැනි ධාන්‍ය වර්ග වගා කිරීම ආරම්භ වීම

- සතුන් හීලෑ කිරීම මගින් විවිධ ප්‍රයෝජන අත් කර ගැනීම (සත්ත්ව පාලනය)

උදාහරණ

කිරි, බිත්තර, මස්, ලොම්

- ලෝහ වර්ග හඳුනාගැනීම

  ගල් මෙවලම් වෙනුවට ලෝහ භාවිතයෙන් විවිධ මෙවලම් හා ආයුධ සකස් කර ගැනීම



ඡායාරූපය 8.1.4
නවශිලා යුගයේ භාවිත කළ ඊතල හිසක් ක්‍රි. පූ. 4000 සහරා කාන්තාරයෙන් සොයා ගෙන ඇත.

- ස්ථිර වාසස්ථාන බිහි වීම හා ඉන් අනතුරු ව ක්‍රමයෙන් ගම් බිහි වීම දක්වා වර්ධනය වී ඇත.

- ආගමික කටයුතුවලට ක්‍රමයෙන් හුරු වීම හා දෙවියන් පිදීම
  බව බෝග සම්පත් හා ආරක්ෂාව පතා දෙවියන් පිදීමට හුරු වීම

මිනිසා ස්වාභාවික පරිසරය සමග කටයුතු කිරීමේ දී මුහුණ දුන් අභියෝග ජය ගැනීම නිසා විවිධ ජයග්‍රහණ අත්පත් කර ගැනීමට හැකි වීම.

- තාක්ෂණය
- වාසස්ථාන
- ආහාර පාන
- ආගමික තත්ත්වය

- ඉහත කරුණු උදාහරණ සහිතව පැහැදිලි කරයි.

**ක්‍රියාකාරකම**

**ඉහත විෂය කරුණු ආවරණය වන පරිදි පහත ක්‍රියාකාරකම සිදු කරන්න.**

- මෙය කේවල ක්‍රියාකාරකමක් ලෙස සිදු කරන්න.
- මිනිසා තම අවශ්‍යතා සපුරා ගැනීමේදී පූර්ව ශිලා, මධ්‍ය ශිලා වශයෙන් යුග හා එම යුගවල දී අත්පත් කර ගත් ජයග්‍රහණ පිළිබඳ සිසුන් සමඟ සාකච්ඡා කරන්න.
- ඇමුණුම් අංක 01හි ඇතුළත් කාර්ය පත්‍රිකාව පන්තියට ප්‍රදර්ශනය කරන්න.
- කාර්ය පත්‍රිකාවේ ඇතුළත් වගුව අභ්‍යාස පොතේ පිටපත් කර ගැනීමට උපදෙස් දෙන්න.
- වගුව සම්පූර්ණ කිරීමට උපදෙස් දෙන්න.
- මෙම ක්‍රියාකාරකම සඳහා එක් කාල පරිච්ඡේදයක් යොදා ගන්න.
- ක්‍රියාකාරකම පන්තියට ප්‍රදර්ශනය කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- ප්‍රතිපෝෂණ හා ඉදිරිපෝෂණ සිදු කරමින් පාඩම සමාලෝචනය කරන්න.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

පහත සඳහන් නිර්ණායක ඇසුරෙන් තක්සේරුව හා ඇගයීම සිදු කරන්න.

- මෙවලම් අනුව මිනිසා ගත කළ යුග නම් කිරීම
- එක් එක් යුගවල දී මිනිසා අත්පත් කර ගත් ජයග්‍රහණ සඳහන් කිරීම
- මිනිසා පරිසරය ජයගත් ආකාරය විස්තර කිරීම
- කරුණුවල නිවැරැදි බව
- කාල කළමනාකරණය


ඇමුණුම් අංක 01

කාර්ය පත්‍රිකාව

| පූර්ව ශිලා යුගයේ අත්පත් කර ගත් ජයග්‍රහණ | මධ්‍ය ශිලා යුගයේ අත්පත් කර ගත් ජයග්‍රහණ | නව ශිලා යුගයේ අත්පත් කර ගත් ජයග්‍රහණ |
|---|---|---|
| | | |

ඇමුණුම් අංක 02

ඔස්ට්‍රලෝපිතිකස් සිට හෝමෝසාපියන් මානවයා දක්වා




රූපය 8.1.5 මානව පරිණාමය

**නිපුණතා මට්ටම** : 8.2 ලෝක ශිෂ්ටාචාර හඳුනාගෙන විස්තර කරයි.

**ඉගෙනුම් පල** :

- ශිෂ්ටාචාරය යන්න හඳුන්වයි.
- පැරණි ශිෂ්ටාචාරවල පොදු ලක්ෂණ පෙන්වා දෙයි.
- ශිෂ්ටාචාරවල භූගෝලීය ව්‍යාප්තිය ලෝක සිතියමක ලකුණු කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ආකල්ප හා වටිනාකම්** :

- පැරණි ශිෂ්ටාචාර පිළිබඳ මනා දැනුමක් ලබා ගනියි.
- ශිෂ්ටාචාර පිළිබඳ අභිමානයෙන් කථා කරයි.
- ශිෂ්ටාචාරවලින් ලබා දුන් ආදර්ශ වර්තමානය ගොඩනගා ගැනීමට උපකාරී කර ගනියි.

**ගුණාත්මක යෙදවුම්** :

- ශිෂ්ටාචාර දැක්වෙන සිතියම

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය සඳහා උපදෙස් :**

**පහත සඳහන් විෂය කරුණු ඇසුරින් පාඩම සැලසුම් කර ගන්න.**

8.2 **ලෝකයේ පැරණි ගංගා නිම්න ශිෂ්ටාචාර**
8.2.1 **ශිෂ්ටාචාර හැඳින්වීම**

ශිෂ්ටාචාර බිහි වීම දීර්ඝ කාලයක් පුරා සිදු වූ ඓතිහාසික ක්‍රියාවලියක් බව.

ශිෂ්ටාචාරයක් යනු නගර හා නාගරික ජීවන රටාවකට අනුව ජීවත් වන ජනතාවක් වෙසෙන නාගරික ජන සමාජයක් ලෙස හැඳින්විය හැකි බව

ලෝකයේ විවිධ භූගෝලීය කලාපවල විවිධ ලක්ෂණවලින් යුතු ශිෂ්ටාචාර ගොඩනැගුණ ද ශිෂ්ටාචාර බිහි වීමට බලපෑ සාධක කිහිපයක් හඳුනා ගත හැකි බව

ශිෂ්ටාචාර පිළිබඳ විවිධ විද්වතුන් විසින් අදහස් ඉදිරිපත් කර ඇති අතර ඒ අතුරෙන් ගෝල්ඩන් බයිල්ඩ්ස් විසින් ශිෂ්ටාචාර බිහි වීමට බලපාන ලද පොදු ලක්ෂණ 10ක් පිළිබඳ ඉදිරිපත් කර ඇති බව

- අකුරු භාවිත කිරීමට පුරුදු වීම
- ආගමික විශ්වාස
- බාහිර ලෝකය සමග වෙළෙඳාම
- පාලන ක්‍රමයක් ගොඩනගා ගැනීම

- මුදල් හෝ හුවමාරු ක්‍රමයක් ඇති කර ගැනීම
- සමාජය පන්ති වශයෙන් බෙදී තිබීම
- විද්‍යාත්මක දැනුම
- මහජන ගොඩනැගිලි
- ශිල්ප ප්‍රාගුණ්‍යතාව
- නීති පද්ධතියක්

- ''ශිෂ්ටාචාරය'' හැඳින්වීම හා පැහැදිලි කිරීම
    - ශිෂ්ටාචාර ගොඩනැගීමට දීර්ඝ කාලයක් ගත වන බව
    - ශිෂ්ටාචාරයක් යනු නගර හා නාගරික වැසියන්ගෙන් සමන්විත ජන සමාජයක් බව

ඉහත විෂය කරුණු ආවරණය වන සේ පහත ක්‍රියාකාරකමෙහි සිසුන් නිරත කරවන්න.

- මෙය කේවල ක්‍රියාකාරකමක් ලෙස සිදු කරවන්න.
- ''ශිෂ්ටාචාර බිහි වීම'' යන මාතෘකාව යටතේ කෙටි ඉදිරිපත් කිරීමක් කරන්න.
- ඉදිරිපත් කිරීම් සඳහා විනාඩි 3 - 5 දක්වා කාලයක් ලබා දෙන්න.
- සිසු ඉදිරිපත් කිරීම්වල ගුණදොස් පෙන්වා දෙමින් ප්‍රතිපෝෂණ, ඉදිරි පෝෂණ ලබා දෙන්න.

ගංගා නිම්න කේන්ද්‍රකොට ගනිමින් ගොඩනැගුණු ශිෂ්ටාචාර 4ක් ඇති බව,

1. මෙසපොතේමියානු ශිෂ්ටාචාරය
2. මිසර හෙවත් ඊජිප්තු ශිෂ්ටාචාරය
3. හොවැංහෝ ශිෂ්ටාචාරය
4. ඉන්දු නිම්න ශිෂ්ටාචාරය

පහත සඳහන් නිර්ණායක පදනම් කර ගනිමින් තක්සේරුකරණය සිදු කරන්න.

- ශිෂ්ටාචාර යන්න පැහැදිලි කිරීම
- ශිෂ්ටාචාරවල පොදු ලක්ෂණ නම් කිරීම
- කරුණු නිවැරැදි ව ඉදිරිපත් කිරීම
- සංවිධානාත්මක බව
- ඉදිරිපත් කිරීමේ කුසලතා

**නිපුණතා මට්ටම :** 8.3 මෙසපොතේමියානු ශිෂ්ටාචාරයේ ආරම්භය හා විකාශනය විස්තර කරයි.

**ඉගෙනුම් පල :**

- ශිෂ්ටාචාරයේ ආරම්භය විස්තර කරයි.
- ශිෂ්ටාචාරයේ වර්ධනීය අවස්ථාවන් පෙන්වා දෙයි.
- මෙසපොතේමියානු ශිෂ්ටාචාරයෙන් ලෝකයට උරුම වූ දායාද පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.
- මෙසපොතේමියානු ශිෂ්ටාචාරය සිතියමක ලකුණු කොට නම් කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 02

**ආකල්ප හා වටිනාකම් :**

- පැරණි මුතුන් මිත්තන්ගේ නිර්මාණාත්මක හැකියාවන් වර්තමානයට ද ප්‍රයෝජනවත් වන ආකාරයට ඇගයීම
- නව නිපයුම් දීර්ඝ කාලීන ප්‍රතිඵලදායක වන අයුරින් ගොඩනැගීමට පෙළඹ වීම

**ගුණාත්මක යෙදවුම් :**

- www.ancient.edu/Mesopotamia
- www.britannica.com/place/Mesopotami

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය සඳහා උපදෙස් :**

**පහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම සැලසුම් කරන්න.**

8.3 මෙසපොතේමියානු ශිෂ්ටාචාරය

- හැඳින්වීම

  - මෙසපොතේමියාව යනුවෙන් අදහස් කෙරෙන්නේ ගංගා දෙක අතර පිහිටි ප්‍රදේශය යන්න ය.
  - මෙම ශිෂ්ටාචාරය ගොඩනැගුවේ සුමේරියන්වරුන් විසින් ය. එබැවින් සුමේරියානු ශිෂ්ටාචාරය යනුවෙන් ද හඳුන්වා ඇත.
  - මෙම ශිෂ්ටාචාරයට අයත් භූමි ප්‍රදේශය ඉතා සශ්‍රීක ය. අඩ සඳක හැඩය ගන්නා මෙම සාරවත් භූමි භාගය නිසා ''සරුසාර චන්ද්‍රවංකය'' යනුවෙන් ද හැඳින්වේ.
  - යුප්‍රටීස් - ටයිග්‍රීස් ගංගා අතර පිහිටි ශිෂ්ටාචාරය ''දෙගම්මැදි ශිෂ්ටාචාරය'' යනුවෙන් ද හඳුන්වා ඇත.
  - ලෝකයේ පැරණිතම ජනාවාස හමුවන්නේ මෙසපොතේමියානු ශිෂ්ටාචාරයෙනි.

- ආරම්භය

    - 19 වන සියවසේ මෙසපොතේමියා ප්‍රදේශ ආශ්‍රිත පුරාවිද්‍යාත්මක කැණීම් ආරම්භ විය.
    - පුරාවස්තු එක්රැස් කිරීම, හඳුනා ගැනීම, පැරණි අක්ෂර කියවීම හා යුරෝපයේ කෞතුකාගාරවලට භාණ්ඩ ලබා ගැනීම, මුල් පුරා විද්‍යා කැණීම්වල අරමුණ විය.
    - ඉරාක රජය මැදිහත්වීමෙන් විධිමත් පුරාවිද්‍යාත්මක කැණීම්, 20වන සියවස ආරම්භයේ සිට සිදු විය.
    - මෙසපොතේමියානු ප්‍රදේශවලට අයත් පැරණි නගර හඳුනා ගැනීම සිදු විය.
    - දේශපාලන, ආර්ථික, සංස්කෘතික ක්ෂේත්‍ර පිළිබඳ අධ්‍යයනය විය.
    - ගොඩනැගිලි හා නටබුන් සොයා ගැනීම යනාදී ලෙස පුරාවිද්‍යා කැණීම් ක්ෂේත්‍ර පුළුල් විය.
    - දැනට අනාවරණය කර ගෙන ඇති පුරාවිද්‍යා සාධක අනුව මෙම ශිෂ්ටාචාරය ක්‍රි.පූ 5000 තරම් ඈතට දිව යන බව පුරා විද්‍යාඥයන්ගේ මතය වේ.

**ව්‍යාප්තිය**

මෙම ශිෂ්ටාචාරය, මෙසපොතේමියාවේ සිට බැබිලෝනියානු අවධිය දක්වා අවධි කිහිපයක් ඔස්සේ වර්ධනය වී ව්‍යාප්ත වී ඇති බව ද අනාවරණය කර ගෙන ඇත.

1. උබයිඩ් අවධිය ක්‍රි.පූ. 5300 - 4000
2. සුමේරියානු යුගය ක්‍රි.පූ. 4000 - 200

| | | | | |
|---|---|---|---|---|
| උරුක් යුගය ක්‍රි.පූ. 4000 ක්‍රි.පූ 3100 | (ජෙම්ඩට් නසර්) යුගය ක්‍රි.පූ. 3100 ක්‍රි.පූ 2900 | (පුරාණ රාජවංශ යුගය) ක්‍රි.පූ. 3100 ක්‍රි.පූ 2900 | (ආකේඩියානු අධිරාජ්‍ය යුගය) ක්‍රි.පූ. 2300 ක්‍රි.පූ 2100 | (තෙවන ඌර් යුගය) ක්‍රි.පූ. 2100 ක්‍රි.පූ 2004 |

3. **බැබිලෝනියානු යුගය ක්‍රි.පූ. 2004 - ක්‍රි.පූ 539**

    - මෙසපොතේමියානු ශිෂ්ටාචාරය වර්තමාන ඉරාකයට අයත් ප්‍රදේශවල ව්‍යාප්ත වී ඇත.
    - මෙසපොතේමියානු ශිෂ්ටාචාරයට ඉතා විශාල භූමි ප්‍රදේශයක් අයත් වීමත් විවිධත්වයෙන් යුතු ජනාවාස ව්‍යාප්තියත් නිසා පුරාවිද්‍යාඥයින් විසින් මෙම ප්‍රදේශවල පුරාවිද්‍යාත්මක පර්යේෂණ සිදු කිරීමේ දී ප්‍රධාන කලාප දෙකකට වෙන් කර ඇත.

- 1. ඉහළ මෙසපොතේමියානු ප්‍රදේශ (උතුරු මෙසපොතේමියාව)
- 2. පහළ මෙසපොතේමියානු ප්‍රදේශ (දකුණු මෙසපොතේමියාව)
- ජනාවාස ව්‍යාප්තිය අනුව ඉහත කලාප දෙක **අක්කාඩ්** හා **සුමර්** යනුවෙන් පුරා විද්‍යාඥයන් විසින් හඳුන්වා ඇත.

**උබයිඩ් අවධිය**

**උබයිඩ් අවධියට පෙර අවධිය**

- දකුණු මෙසපොතේමියානු ප්‍රදේශයේ උබයිඩ් සභ්‍යත්වය ආරම්භ වන විට හා ආරම්භ වීමට පෙර උතුරු මෙසපොතේමියානු ප්‍රදේශවල පූර්වශිලා, මධ්‍ය ශිලා හා නව ශිලා යුගයට අයත් ජනාවාස පැවති බවට පුරාවිද්‍යාත්මක සාක්ෂි රැසක් අනාවරණය කර ගෙන ඇත.

උදාහරණ :

- ක්‍රි.පූ 17000 - 9000 ෂාශියන් සංස්කෘතිය - දඩයමින් ජීවත් වූ ජනතාවක් විසීම
- ක්‍රි.පූ 11500 - 9000 දඩයම හා කෘෂිකර්මාන්තයට හුරු වෙමින් සිටි ජනතාවක් විසූ බව
- ජාර්මෝ සංස්කෘතිය ක්‍රි.පූ 7000 - 5000 පැරණිතම ගම්මාන



**ඡායාරූපය 8.3.1**
**ජාර්මෝ සංස්කෘතියට අයත් පැරණි ගමක්**

- මෙම ජනාවාසය නව ශිලා යුගයේ මුල් අවධියට අයත් කෘෂිකාර්මික ජනාවාසයකට උදාහරණයකි.
- තවදුරටත් උතුරු මෙසපොතේමියාවේ හසුනා, සමාරා හා හලාෆ් යනුවෙන් නව ශිලා යුගයට අයත් සංස්කෘතීන් කිහිපයක් පිළිබඳ තොරතුරු රැසක් පුරාවිද්‍යා පර්යේෂණවලින් අනාවරණය කර ගෙන ඇත.
- දකුණු මෙසපොතේමියාවේ සිදු කළ පුරා විද්‍යා කැණීම්වලට අනුව අනාවරණය කර ගත් පැරණි ම සභ්‍යත්වය උබයිඩ් සභ්‍යත්වය යි.

- උබයිඩ් සභ්‍යත්වය බිහි කළ ජනතාව මෙම ප්‍රදේශයට පිටතින් පැමිණි පිරිසක් බවත් ඔවුන් සමාරා, හලාෆ් සංස්කෘතීන්ගෙන් ආභාසය ලැබූ පිරිසක් බවත් විශ්වාස කෙරේ.
- උබයිඩ් සභ්‍යත්වය විශාල ප්‍රදේශයක ව්‍යාප්ත වී ඇති අතර එයින් හමු වූ පුරා වස්තු පදනම් කර ගෙන මෙම සභ්‍යත්වය අවධි තුනකට බෙදා දක්වා ඇත.

1. පළමු උබයිඩ් අවධිය හෙවත් එරිදු අවධිය
   (ක්‍රි.පූ 5300 - 4700)
2. දෙවන උබයිඩ් අවධිය හෙවත් හජී මෙහොමඩ් අවධිය (ක්‍රි.පූ 4800 - 4500)
3. තෙවන උබයිඩ් අවධිය
   (ක්‍රි.පූ. 4500 - 4000)

- ක්‍රි.ව. 1855 සිට 1949 දක්වා එරිදුවල සිදු කළ කැනීම්වලට අනුව උබයිට් සභ්‍යත් වයේ මුල් අවධියට අයත් තොරතුරු හමු වේ.

**ආර්ථික තත්ත්වය**

- කෘෂිකාර්මික කටයුතු සිදු කිරීම
- කෘෂිකාර්මික කටයුතු සඳහා වාරි මාර්ග ඉදි කිරීම
- වර්ණ ආලේපිත මැටි භාණ්ඩ නිපද වීම
  (මේ සඳහා දුඹුරු, කළු, දම් වර්ණ ආලේප කිරීමට යොදා ගෙන ඇත.)
- මඩ ගඩොල් හෝ වරිච්චියෙන් නිවාස ඉදි කිරීම



ඡායාරූපය 8.3.2 උබයිඩ් අවධියේ නිපදවන ලද වර්ණ ආලේපිත මැටි බඳුනක්. දැනට ලුවර් කෞතුකාගාරයේ තැන්පත් කර ඇත.



ඡායාරූපය 8.3.3 මුද්දර සඳහා භාවිත කළ පාෂාණ මුද්‍රා

**ආගමික තත්වය**

- මෙසපොතේමියානු ශිෂ්ටාචාරයේ ඇදහිලි හා විශ්වාස පිළිබඳ පැරණිතම සාක්ෂි හමුවන්නේ එරිදුවලිනි.
- මෙම අවදියේ ජනතාව **එන්කි** දෙවියන් සඳහා පුද පූජා පවත්වා ඇත. ඒ සඳහා දේවස්ථාන ඉදි කිරීම මෙකල ආරම්භ විය.



ඡායාරූපය 8.3.4 එන්කි දෙවියා

- එරිදු අවධියේ ඉදි කෙරුණු දේවස්ථාන ප්‍රාථමික අවස්ථාවේ ඒවා වූ නමුත් උබයිඩ් අවධියේ අවසාන අවධිය වන විට ක්‍රමික ව දියුණු වූ ආකාරයක් දක්නට ලැබේ.



ඡායාරූපය 8.3.5 එරිදි දෙවියන් සඳහා ඉදිකරන ලද දේවස්ථානයක කැණීම් කරන ලද අවස්ථාවක්

**සමාජ තත්වය**

- උබයිඩ් අවධියේ මුල් භාගයේ විසූ ජනයා ගම්මාන මුල් කර ගනිමින් ග්‍රාමීය ජීවිතයක් ගෙන ගිය ද පසු කාලය වන විට ක්‍රමයෙන් ග්‍රාමීය සමාජ රටාව නාගරික රටාවකට පරිවර්තනය වන ආකාරය දැක ගත හැකිය.
- මෙම වැසියන්ගේ ඇදහිලි හා විශ්වාස, නිවාස තාක්ෂණය ආගමික ගොඩනැගිලි වලින් සහ ආර්ථික රටාවේ කරන ලද දියුණු ලක්ෂණ, නාගරික සමාජයක පරිවර්තනය පිළිඹිබු කරන්නකි.
- මෙසපොතේමියානු ශිෂ්ටාචාරයේ දියුණු නාගරික සභ්‍යත්වයක් ලෙස සුමේරියානු සභ්‍යත්වය ගොඩනැගෙන්නේ උබයිඩ් සභ්‍යත්වයේ පදනම මතිනි.

**සුමේරියානු යුගය ක්‍රි.පූ 4000 - 2000**

- උබයිඩ් සභ්‍යත්වයට පසු මෙසපොතේමියාවේ දියුණු ශිෂ්ටාචාරයක් ගොඩනගන්නේ සුමේරියානුවන් විසිනි. එය සුමේරියානු ශිෂ්ටාචාරය ලෙස හැඳින්වේ.
- ක්‍රි.පූ 2000 දී පමණ බැබිලෝනියානු අධිරාජ්‍යය ගොඩනගන තෙක් වසර 2000ක් පමණ දීර්ඝ කාලපරිච්ඡේදය සුමේරියානු යුගය ලෙස හැඳින්වේ.
- සුමේරියානු අවදිය යුග පහකට බෙදා දක්වා ඇත.

**උරුක් යුගය ක්‍රි.පූ 4000 - 3100**

- විලියම් කෙනම් නම් පුරාවිද්‍යාඥයා විසින් වර්ෂ 1849 දී පැරණි උරුක් නගරය සොයා ගන්නා ලදී.
- සුමේරියානු ශිෂ්ටාචාරයේ පැරණිතම අවධිය ලෙස සැලකෙන්නේ උරුක් යුගයයි.
- මෙම අවධිය තීරණාත්මක වෙනස්කම් සිදු වූ කාලපරිච්ඡේදයක් විය.
- ප්‍රථම වරට සකපෝරුව භාවිත කිරීම මෙම අවදියේ සිදු විය.
- ලේඛන කලාව ආරම්භ වීමත් මෙම අවදියේ සිදු වී ඇත.



ඡායාරූපය 8.3.6
මැටි පුවරුව මත ලියන ලද රූපාක්ෂර

- මහජන ගොඩනැගිලි ඉදි කිරීම
- නගර මුල් කර ගත් පාලන තන්ත්‍රයක් ගොඩනැගීම
- නගරය පවුරකින් ආරක්ෂා කොට තිබීම
- ආගමික කටයුතුවල ප්‍රධානීන් වූ පූජක පන්තිය මෙකල පාලන කටයුතු මෙහෙය වන්නට ඇති බව සැලකීම
- නාගරික සංස්කෘතියක් බිහි වීම
- උරුක්වලට අමතරව නිපූර්, ලගාෂ්, ඌර්, එරිදු එකල පැවති තවත් නගර කිහිපයකි.



ඡායාරූපය 8.3.7 ඌර් නගරයේ නටබුන්



ඡායාරූපය 8.3.8 ඌර් නගරයේ නටබුන්

- නගර ආශ්‍රිත දුරස්ථ වෙළෙඳාම දියුණු වීම

උදාහරණ - උරුක් අවධියට අයත් භාණ්ඩ උතුරු මෙසපොතේමියා, සිරියානු හා බටහිර ඉරානයෙන් හමුවී ඇත.

**ජෙම්ටඩ් නසර් යුගය**



ඡායාරූපය 8.3.9 ඌරුක් යුගයේ භාවිත කළ සිලින්ඩරාකාර මුද්‍රාවක්

- උරුක් යුගයේ භාවිත කළ සිලින්ඩරාකාර මුද්‍රාවක්
- වගා කටයුතු, ධාන්‍ය බෙදා හැරීම, ගවයන් පිළිබඳ සංඛ්‍යා ලේඛන තබා ගැනීම, බියර්, ආහාර ද්‍රව්‍ය පිළිබඳ තොරතුරු වාර්තා කිරීමට මුද්‍රා භාවිතා කිරීම. (සිලින්ඩරාකාර මුද්‍රා බහුල ව භාවිත කර ඇත)

**පුරාණ රාජවංශ යුගය ක්‍රි.පූ 2900 - 2350**

- සුමේරියානු ශිෂ්ටාචාරයේ ඓතිහාසික යුගය ආරම්භ වන්නේ පුරාණ රාජවංශ යුගයෙනි.
- සුමේරියානු යුගයේ ඇති වූ මහා ජල ගැලීමකින් පසු ව බිහි වූ යුගය පුරාණ රාජවංශ යුගය යි.

මෙම අවධියේ කැපී පෙනෙන ලක්ෂණ

- පැහැදිලි පාලන තන්ත්‍රයක් ස්ථාපිත වීම
- ශක්තිමත් පාලනයක් බිහි වීම
- කිෂ්, ලගාෂ්, ඌර්, උරුක් නගර කේන්ද්‍ර කර ගත් පාලනයක් බිහි වීම



පාලකයන් ඇතැම් ප්‍රදේශ යටත් කර ගැනීම නිසා රාජ්‍ය උරුමය පිළිබඳ සම්ප්‍රදායක් ඇති වීම
'කිෂ්' නගරය පාලන මධ්‍යස්ථානය බවට පත්වීම (මෙය සුමේරියානු ශිෂ්ටාචාරයේ ස්වර්ණමය යුගය ලෙස හැඳින්වේ.)

ඡායාරූපය 8.3.10
ක්‍රිෂ් නගරයේ
නටබුන්

- කිෂ් නගරය පාලන මධ්‍යස්ථානය කර ගෙන පාලනය කළ රජවරු 21 දෙනෙකු පිළිබඳ තොරතුරු හමුවීම
- පසු කාලය වන විට ඉහත සඳහන් නගර වරින් වර දේශපාලන බල මධ්‍යස්ථාන බවට පත් වීම දැකිය හැකි විශේෂ ලක්ෂණයකි. එනම් නගර කිහිපයක් නගරයක දේශපාලන බලයට යටත් වීම ය.
- රාජවංශ අවධියේ අවසාන කාලයේ දී අක්ෂක්, උම්මා, අඩබ් වැනි තවත් නගර දේශපාලන බලය සඳහා ඒකරාශීවීම් කැපී පෙනෙන ලක්ෂණයක් වීම.
- පූජකයන්ට අමතරව ගිහි නායකයන් දේශපාලනයට අවතීර්ණ විය.

**ආකේඩියානු අධිරාජ්‍ය ක්‍රි.පූ 2300 - 2100**

- ලෝකයේ ප්‍රථම වරට අධිරාජ්‍යයක් ගොඩනැගෙන්නේ ආකේඩියානු අවධියේ දී ය. මෙම අධිරාජ්‍ය පළමුවන සාර්ගෝන් රජු විසින් ගොඩනගන ලදී.
- උතුරු හා දකුණු මෙසපොතේමියාව එක්සත් කිරීම
- සාර්ගෝන රජුගේ අගනගරය වූයේ අක්කාඩ් ප්‍රදේශය යි.
- මෙසපොතේමියාවෙන් බාහිර ලෝකයේ පිහිටි ඉරානය, සිරියාව හා සුළු ආසියාවේ විශාල ප්‍රදේශයක සාර්ගෝන් රජුගේ අධිරාජ්‍ය ව්‍යාප්ත වී ඇත.



**ඡායාරූපය 8.3.11 සාර්ගෝන් රජු**

**තෙවන ඌර් නගරය ක්‍රි.පූ 2100 - 2004**

- ඌර් නම්මු හා ෂුල්ගි රජුන් විසින් සිදු කළ කාර්ය ය



**ඡායාරූපය 8.3.12 ඌර් නම්මු රජු**

- සිගුරාට් දේවස්ථානය ඉදි කිරීම සිදු වූ අතර ඌර් නම්මු නීති සංග්‍රහය සකස් කිරීම ලෝකයේ ප්‍රථම ලිඛිත ලේඛන සංග්‍රහය වේ.



ඡායාරූපය 8.3.14 සිගුරාට් දේවස්ථානය




ඡායාරූපය 8.3.13 ඌර් නම්මු නීති සංග්‍රහය

- ඌර් නගරය බිඳ වැටීමෙන් පසු ඇමොරයිට්ස්වරුන් යටතේ බැබිලෝනියාව මුල් කර ගනිමින් රාජ්‍යයක් බිහි විය. එයින් බැබිලෝනියානු යුගයේ ආරම්භය සිදු වීය.

- ඇමොරයිට්ස්වරු යනු මෙසපොතේමියාවට බටහිරින් පිහිටි සිරියානු ප්‍රදේශවල ජීවත් වූ සෙමටික් භාෂාව කථා කළ ජන කොටසකි.

- ඇමොරයිට්ස් පාලනය පිළිබඳ ක්‍රි.පූ 1894 පමණ පැහැදිලි තොරතුරු ලැබී ඇත.

- සුමුඅබුම් නම් ඇමොරයිට්ස් නායකයා විසින් බැබිලෝනියාව මුල් කර ගනිමින් පාලනය ගොඩනැගීම සිදු කර ඇත.

- හමුරාබිගේ පාලනය ආරම්භවන තෙක් මෙසපොතේමියාවේ එක්සත් පාලනයක් නො වී ය. තවදුරටත් උතුරු මෙසපොතේමියාවේ අසුර් එෂ්නුනානා හා දකුණේ ඉසින්, ලාසා ප්‍රදේශවල ස්වාධීන රාජධානී ගොඩනැගීම සිදුව ඇත.

**හමුරාබි පාලන සමය (ක්‍රි. පූ 1792 - 1750)**

- ඇමොරයිට්ස් පාලකයන් අතුරෙන් මෙසපොතේමියාවේ එක්සත් පාලනයක් ගොඩනගනු ලැබුවේ හමුරාබි විසින් වීම.

- උතුරු හා දකුණු මෙසපොතේමියාව එක්සත් කිරීමෙන් පසු හමුරාබි අධිරාජ්‍ය තුළ ශක්තිමත් පාලන තන්ත්‍රයක් ඇති කිරීමට කටයුතු කිරීම.

- අධිරාජ්‍යයාගේ පාලනය රජුගේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වීම
- ප්‍රාදේශීය පාලකයින්ට පාලන කටයුතු සම්බන්ධයෙන් දිය යුතු නියෝග ලිඛිතව යැවීමේ ක්‍රමයක් අනුගමනය කිරීම
- උදාහරණ - එවැනි නියෝග ඇතුළත් ලිඛිත පුවරු වාරි නගරයෙන් සොයා ගෙන තිබීම

**හමුරාබි නීති සංග්‍රහය**

- රටේ නීතිය හා සාමය රකිමින් විනය ගරුක සමාජයක් සඳහා හමුරාබි විසින් නීති සංග්‍රහයක් ඉදිරිපත් කිරීම
- හමුරාබි නීති සංග්‍රහය ලෝකයේ පැරණි නීති සංග්‍රහවලින් එකක් වීම



**නීති සංග්‍රහය ඇතුළත් කොටස**

8.3.15
**හමුරාබි නීති සංග්‍රහය**

- 1901 සිදු කළ පුරාවිද්‍යා කැණීම් මගින් හමුරාබි නීති සංග්‍රහයේ ශිලාමය පිටපත් සොයා ගෙන ඇත.
- නීති 282ක් පමණ ඇතුළත් මෙම නීති සංග්‍රහයේ විවිධ ක්ෂේත්‍රවලට අයත් නීති ඇතුළත් වී ඇත.

උදාහරණ - විවාහය, දික්කසාදය, දේපල අයිතිය, ජල පරිභෝජනය, වහල්ලු, කෘෂිකර්මාන්තය ආදි....

- මෙහි ඇතුළත් දඬුවම් ක්‍රම අතර මරණ දඬුවම, කස පහර ගැසීම, දඩ ගැසීම, පිළිස්සීම, අංග ඡේදනය ආදි දඬුවම් ක්‍රම විය.

**සමාජ තත්ත්වය**

- බැබිලෝනියානු සමාජය තුළ ස්ථරායන ක්‍රමයක් පැවතීම

**1. ඉහළ සමාජ ස්ථරය**

- රජ පවුලේ පිරිස්, පූජක පන්තිය, රජයේ ඉහළ නිළධාරීන්

**2. මධ්‍යම පන්තිය**

- වෙළෙන්දන්, නිදහස් වැසියන්, විවිධ වෘත්තිකයන්

**3. පහළ පන්තිය**

- වහල්ලු

- මුල් අවධියේ කාන්තාව හා පිරිමියාට සමාන අයිතිවාසිකම් පැවතියත් පසු කාලය වන විට පීතෘ මූලික සමාජයක් බවට පත් වීම.

- සමාජයේ සීමිත පිරිසකට අධ්‍යාපනය ලැබීමේ වරප්‍රසාද හිමිවීම. (පිරිමි පක්ෂයට පමණක් හිමිවීම)
- හමුරාබි නීතිය යටතේ කාන්තාවට නීතියේ රැකවරණය ලබාදීම.
- උදාහරණ - දික්කසාදය, දූ දරු අයිතිය, දේපල උරුමය

**සමාජය තුළ වාර්ෂිකව පවත්වනු ලැබූ උත්සව**

- චන්ද්‍රයා මුල් කර ගත් උත්සව
- කෘෂිකර්මාන්තය සම්බන්ධ උත්සව
- යුධ ජයග්‍රහණ සැමරීමේ උත්සව
- රාජ්‍ය ප්‍රාප්ති උත්සව ආදි...

**ආර්ථික තත්ත්වය**

කෘෂිකර්මාන්තය

කෘෂිකර්මාන්තය ප්‍රධාන ජීවනෝපාය ක්‍රමය වීම

- කෘෂිකර්මාන්තය සඳහා වාරි මාර්ග ක්‍රම භාවිත කිරීම
- බාර්ලි, තිරිඟු, මිල්ට්, මෙනේරි පළතුරු හා එළවළුවගා කිරීම
- කෘෂිකාර්මික කටයුතු සඳහා සතුන් යොදා ගැනීම
- නිෂ්පාදන කාර්යය සාමාන්‍ය වැසියන් හා වහලුන් අතින් සිදු වීම.
- නිෂ්පාදිත අස්වැන්නෙන් කොටසක් බදු වශයෙන් පාලක පන්තියට හා පූජක පන්තියට ගෙවීම
- මෙම පිරිස්වලට ලැබුණු ධාන්‍ය තැන්පත් කිරීම සඳහා විශාල ධාන්‍ය ගබඩා ඉදි කර තිබීම.

**සත්ත්ව පාලනය**

- ගවයන් එළුවන් සහ බූරුවන් ඇති කිරීම

**වෙළෙඳාම**

**අභ්‍යන්තර වෙළෙඳාම**

- අභ්‍යන්තර වෙළෙඳ කටයුතුවල දී භාණ්ඩ හුවමාරුව පැවතීම
- පසුකාලීනව වෙළෙඳාම සඳහා විවිධ හුවමාරු මාධ්‍ය ක්‍රියාත්මක වීම.
- මැටි බෝල, මුද්‍රා, බාර්ලි, රිදී, ලෝහවලින් සැකසූ මැද සිදුරක් සහිත කාසි හමු වීම.



**ඡායාරූපය 8.3.16 ෂෙකල් කාසියක්**

- බැබිලෝනියානු යුගයේ දී ''ෂෙකල්'' මුදල් ලෙස භාවිත කළ අතර මේවා රන්, රිදී, තඹ ආදි ලෝහයන්ගෙන් නිෂ්පාදනය කර ඇත.

**බාහිර වෙළෙඳාම**

- මෙසපොතේමියාව හා බාහිර ලෝකයේ රටවල් අතර වෙළෙඳ කටයුතු පහසු වූයේ මෙම ප්‍රදේශ හරහා වැටී තිබූ වෙළෙඳ මාර්ග හේතුවෙනි.
- මේ නිසා මෙසපොතේමියාව සුළු ආසියාව, තුර්කිය, නැගෙනහිර මධ්‍යධරණී ප්‍රදේශ, ඊජිප්තුව, ඕමානය, බහරේන් හා ඉන්දියාව යන රටවල් සමග වෙළෙඳ සබඳතා ගොඩනගා ගෙන තිබුණි.
- මුල්වරට රෝදය සොයා ගන්නේ සුමේරියාවෙනි. මේ නිසා වෙළෙඳ කටයුතු සඳහා ප්‍රවාහන ක්‍රම භාවිත කිරීමට පුරුදු වී තිබුණි.
- සත්ත්ව ලොම්, රෙදි, ධාන්‍ය තෙල් වර්ග, අපනයනය කරන ලද භාණ්ඩ වන අතර මැටි බඳුන් හා ලෝහ වර්ග පිට රටවලින් ආනයනය කර ඇත.

**විවිධ වෘත්තීන්**

- ධීවරයන්, බේකරිකරුවන්, බියර් වැනි මත්පැන් නිෂ්පාදකයින්
- වෙළෙඳාම සම්බන්ධ වෘත්තීන්,- රෙදිපිළි නිපදවන්නන්, හම් පදම්කරුවන්, කුඹල්ලු ඉදිකිරීම් සම්බන්ධ වෘත්තීන්, - බෝට්ටු තනන්නන්, වඩුවන්, පෙදරේරුවන්, ආභරණ තනන්නන්.

**කලාව සාහිත්‍ය හා ගෘහ නිර්මාණය**

- ලෝකයේ ප්‍රථමවරට ලේඛන කලාවක් ආරම්භ වීම.
- මැටි පුවරු, මුද්‍රා ආදිය ලේඛන මාධ්‍ය ලෙස යොදා ගැනීම.
- සුමේරියානු අවධියේ පුරාවෘත්ත බොහොමයක් බැබිලෝනියානු අවධියේ දී ලේඛන ගත කිරීම
- '' වීර කාව්‍ය'' මෙසපොතේමියානු සාහිත්‍යයේ ප්‍රධාන අංශයකි.
- වීර කතා, නැළවිලි ගී, ස්තෝත්‍ර, දෙබස් ආකාරයෙන් ලියූ රචනා ද මේ අතර වේ.
- උදාහරණ. මාළුවා හා කුරුල්ලා අතර සංවාදය

  බැටළුවා හා ධාන්‍ය අතර සංවාදය
- විවිධ කලාකෘති නිර්මාණය වීම

  වර්ණ ගැන් වූ මැටි බඳුන්
- ගෘහ නිර්මාණ

උදාහරණ- ධාන්‍යාගාර, දේවස්ථාන, ප්‍රභූ නිවාස, මහජන ගොඩනැගිලි, මහාමාර්ග පද්ධති

**නිපුණතා මට්ටම :** ඊජිප්තු ශිෂ්ටාචාරයේ ආරම්භය හා විකාශය විස්තර කරයි.

**ඉගෙනුම් පල :**

- ඊජිප්තු ශිෂ්ටාචාරයේ ආරම්භය විස්තර කරයි.
- ඊජිප්තු ශිෂ්ටාචාරයේ වර්ධනීය අවස්ථා පෙන්වා දෙයි.
- ඊජිප්තු ශිෂ්ටාචාරයෙන් ලෝකයට උරුම වූ දායාද හා වටිනාකම් අගයයි.
- ඊජිප්තු ශිෂ්ටාචාරය සිතියමක ලකුණු කොට නම් කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 03

**ආකල්ප හා වටිනාකම් :**

- පැරණි මුතුන්මිත්තන්ගේ නිර්මාණාත්මක හැකියා වර්තමානයට ද ප්‍රයෝජනවත් වන ආකාරය ඇගයීම.
- නව නිපයුම් දීර්ඝ කාලීනව ප්‍රතිඵලදායක වන අයුරින් ගොඩනැගීමට පෙළඹවීම.

**ගුණාත්මක යෙදවුම් :**

- www.khanacademy.org
- www.britannica.com/place/ancient-Egypt

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය සඳහා උපදෙස් :**

පහත සඳහන් විෂය කරුණු පදනම් කර ගනිමින් පාඩම සැලසුම් කර ගන්න.

**8.4 ඊජිප්තු ශිෂ්ටාචාරය**

**හැඳින්වීම**

ලෝකයේ දිගම ගංගාව වන නයිල් ගංගාව (කි.මී. 6650 (සැතපුම් 4130) කේන්ද්‍රකොට ගොඩනැගුණු ශිෂ්ටාචාරය නයිල් නිම්න ශිෂ්ටාචාරය ලෙස හැඳින් වේ. මෙම ශිෂ්ටාචාරයට අයත් ප්‍රදේශය අතීතයේ මිසරය යනුවෙන් ද හැඳින්වීය. මෙම ශිෂ්ටාචාරය යුග හා රාජධානි ලෙස බෙදී තිබිණ.

භූ භෞතික පිහිටීම අනුව උතුරෙන් මධ්‍යධරණී මුහුදෙන් ද නැගෙනහිරින් රතු මුහුදෙන් ද, බටහිරින් කාන්තාර ප්‍රදේශවලින් ද, ස්වභාවික ව ආරක්ෂාව ලැබිණ. ජූනි සිට ඔක්තෝම්බර් දක්වා කාලය තුළ ලැබෙන වර්ෂාව හේතු කොට නයිල් නදිය පිටාර ගලයි. මේ නිසා ගංගාව දෙපස භූමි ප්‍රදේශය සරුසාර වීම හේතුකොට කෘෂිකාර්මික කටයුතුවලට සුදුසු පරිසරයක් නිර්මාණය වීම, පැරණි ඊජිප්තු ජනයා වැඩි වශයෙන් මෙම ප්‍රදේශවල ජනාවාස පිහිටුවා ගැනීමට බලපෑ කරුණකි.

කාන්තාර බහුල භූගෝලීය පරිසරයක් තුළ වියළි දේශගුණික තත්ත්වයක් යටතේ වුව ද ඊජිප්තුවේ දියුණු ශිෂ්ටාචාරයක් ගොඩනගා ගැනීමට හේතු වූයේ නයිල් නදිය යි. මෙය වඩාත් ප්‍රකට වන්නේ හෙරඩෝටස් ක්‍රි.පූ. 450 දී පමණ ඊජිප්තුවේ සංචාරය කරමින් ලැබූ අද්දැකීම් පදනම්කොට සම්පාදිත ග්‍රන්ථයෙනි. ඔහු තම ග්‍රන්ථයෙහි ඊජිප්තුව පිළිබඳව විස්තර කරනු ලැබුවේ මිසරය යනු නයිල් නදියෙන් ලද තෑග්ගක් යනුවෙනි. ඊජිප්තු ශිෂ්ටාචාරය ද මෙසපොතේමියාවට සමකාලීනව වර්ධනය වී ඇත. ඊජිප්තු ශිෂ්ටාචාරය ඉහළ ඊජිප්තු හා පහළ ඊජිප්තු යනුවෙන් කොටස් දෙකකින් යුක්ත වේ.

**ආරම්භය හා ව්‍යාප්තිය**

ක්‍රි. පූ 3100 දී පමණ ඊජිප්තු ශිෂ්ටාචාරයට අයත් ලිඛිත සාධක හමුවීමෙන් එහි ඓතිහාසික යුගය ආරම්භ වේ. මේ සමග ම ඊජිප්තුවේ රාජ වංශ යුගය ද ආරම්භ වූ නමුත් ක්‍රි.පූ. 5200 දී පමණ කෘෂිකර්මාන්තය පිළිබඳ සාධක හමුවීමෙන් එම අවධිය පූර්ව රාජ වංශ අවධිය ලෙස හැඳින්වේ. හෙරඩෝටස්, මනෙතෝ, ඩයොඩරස් හා ස්ට්‍රාබෝ ඊජිප්තු ශිෂ්ටාචාරය පිළිබඳ වැදගත් ඓතිහාසික තොරතුරු අනාවරණය කර ඇත.

වසර 3000 ක් පමණ පැවති ඊජිප්තුවේ ඓතිහාසික යුගය (ක්‍රි.පූ 3100න් ආරම්භ වන) යුග තුනකට බෙදා දැක්විය හැකිය.

**ඊජිප්තු ශිෂ්ටාචාරය**

**ඓතිහාසික යුගය**
**ක්‍රි.පූ.3100**

**පිරමීඩ අවධිය (පුරාතන යුගය)** | **වැඩවසම් අවධිය (මධ්‍යතන යුගය)** | **අධිරාජ්‍ය අවධිය (නූතන යුගය)**

**පිරමීඩ අවධිය (පුරාතන යුගය)**

- (ක්‍රි.පූ 3100 සිට ක්‍රි.පූ 2218 දක්වා) පළමුවන රාජවංශයේ සිට හයවන රාජවංශය දක්වා කාලය මෙම අවධියට අයත් වේ.
- ඊජිප්තුවේ එක්සත් පාලනයක් ඇති කළේ මෙනස් රජු යැයි සඳහන් වේ.
- මෙනස් රජු විසින් ඉහළ හා පහළ ඊජිප්තුව පහසුවෙන් පාලනය කිරීම සඳහා මෙම්පීස් නගරය අගනගරය බවට පත් කර ගත් බව ද සඳහන් වේ.
- ක්‍රි.පූ 2686 සිට 2181 දක්වා වූ තෙවන රාජවංශ අවධිය නිර්මාණාත්මක ක්ෂේත්‍රයේ තීරණාත්මක දෑ සනිටුහන් කළ අවධියක් වේ.
- 1898 දී හියරකන්පොලිස්වලින් හමු වූ නාමර් ඵලකය (ඉහළ හා පහළ ඊජිප්තුව සංකේතවත් කෙරේ.)

**මධ්‍යතන යුගය** (ක්‍රි.පූ 2055 සිට 1650)

- එකොළොස්වන රාජවංශයේ සිට පහළොස්වන රාජවංශය දක්වා වූ වසර 400ක් පමණ කාලය මේ යුගයට අයත් වේ.
- රාජධානි අවධියේ පාලනය කළ රජුන් පාරාවෝ නමින් හඳුන්වා ඇත.


**නව රාජධානි යුගය (අධිරාජ්‍ය යුගය) ක්‍රි.පූ 1550 - 1077**

- ආමෝසේ පාරාවෝ මෙම අවධියේ ප්‍රථම පාරාවෝවරයා විය.

**කැපී පෙනෙන පාරාවෝවරු**



ඡායාරූපය 8.4.1 අක්හෙනටන්



ඡායාරූපය 8.4.2 නෙෆ්ටිටී



ඡායාරූපය 8.4.3 තුතන්කාමන්

(ක්‍රි.පූ 1232 - 1223)

**පරිහානි යුගය** (ක්‍රි.පූ 664 ක්‍රි.පූ 332)

- ක්‍රි.පූ 332 දී ඊජිප්තුව ඇලෙක්සැන්ඩර්ට යටත් විය.
- ඇලෙක්සැන්ඩර්ට පසු ඊජිප්තුවේ පාලනය ටොලමිවරුන්ට අයත් විය.
- ටොලමිවරුන්ගේ භාර්යාවන්ගෙන් එක් තැනැත්තියක වූ හත්වන ක්ලියෝපැට්රාගේ අවධිය කැපී පෙනේ.
- ඇය ක්‍රි.පූ 51 සිට ක්‍රි.පූ 30 දක්වා ඊජිප්තුවේ සිංහාසනය දැරීය.
- ක්‍රි.පූ 30 දී රෝමයේ ඔක්ටේවියන් ඊජිප්තුව ආක්‍රමණය කිරීමත් සමග ක්ලියෝපැට්රා සියදිවි නසා ගැනීම
- අනතුරුව ඊජිප්තුව රෝම අධිරාජ්‍යයේ කොටසක් බවට පත් වීම.



පාලන තන්ත්‍රය

- ඊජිප්තුවේ පාලකයා පාරාවෝ යනුවෙන් හැඳින්වීම
- රජු දේවත්වයෙන් සැලකීම.
- (රජු මිහිපිට සිටින දෙවියකු බව) සූර්ය දේව වන්දනයත් සමග පාරාවෝ රජුන් සූර්ය දෙවියාගේ පුත්‍රයෙකු ලෙස සැලකීම.

රජු

- රටේ ඉඩම් හා සියලු සම්පත්වල නීත්‍යානුකූල හිමිකරුවා බව
- හමුදාවේ අණදෙන්නා බව
- සතුරන්ගෙන් රට ආරක්ෂා කිරීම, ජනතාවගේ හා ආගමේ අභිවෘද්ධියට කටයුතු කිරීම

පාරාවෝට පාලනය සඳහා සහයවීමට නිලධාරී මණ්ඩලයක් පැවතීම

- දේශපාලන කටයුතුවල බලවත් පුද්ගලයා වූයේ විසීර් නම් අමාත්‍යවරයා ය.
- ආගමික අංශයේ ප්‍රබල ස්ථානය පූජකවරයාට හිමි වීම.
- මධ්‍ය පාලනය හා ප්‍රාදේශීය පාලනය වශයෙන් කොටස් දෙකකින් සමන්විත වීම.
- ප්‍රාදේශීය පාලනය නොම්ස් යනුවෙන් හැඳින් වේ.

**ආර්ථික තත්ත්වය**

- කෘෂිකර්මාන්තය ප්‍රධාන ආර්ථික ක්ෂේත්‍රය වීම.
- කෘෂිකාර්මික කටයුතු සඳහා වාරි මාර්ග ක්‍රම භාවිත කිරීම.
- තිරිඟු, ඉරිඟු බහුල ව වගා කිරීම.
- බාර්ලි, පළතුරු (කොමඩු) එළවළු, ලීක්ස්, සලාද කොළ, ළූනු වගා කිරීම්

**සත්ත්ව පාලනය**

- ගවයන්, එළුවන්, ඌරන්, බැටළුවන් මස් ලබා ගැනීම සඳහා ඇති කිරීම
- ඔටුවන් භාණ්ඩ ප්‍රවාහන කටයුතුවලට යොදා ගැනීම
- කෘෂිකාර්මික කටයුතු සඳහා ගවයා යොදා ගැනීම

  උදාහරණ: සී සෑම



**8.4.5 සී සෑම**

**වෙළෙඳාම**

- අතිරික්ත නිෂ්පාදනය වෙළෙඳාම් කිරීම.
- වෙළෙඳ කටයුතු සඳහා කිරුම් මිනුම් ක්‍රම භාවිත කිරීම
- මැටි බඳුන්, ධාන්‍ය, පැපිරස්, ලිනන් ආදිය අපනයනය කිරීම
- දැව, රිදී, තඹ, අශ්වයන්, ගවයන් ආනයනය කිරීම
- භාණ්ඩ හුවමාරුව පැවතීම
- මෙසපොතේමියාව, ඇෆ්ගනිස්ථානය සමග වෙළෙඳ සබඳතා පැවැත්වීම

**බදු ක්‍රම**

- බදු එකතු කිරීම ප්‍රධාන ආදායම් මාර්ගය වීම
- නිෂ්පාදනයෙන් කොටසක් බදු වශයෙන් රජයට ගෙවිය යුතු වීම
- බදු, ධාන්‍ය වශයෙන් ගෙවිය යුතු වීම.
- ධාන්‍ය බදු වශයෙන් ගෙවිය යුතු වීම.

**සමාජ තත්ත්වය**

**පුරාණ ඊජිප්තුවේ සමාජ ධූරාවලිය**




- ඊජිප්තුවේ වහල්ලුන්ගේ තත්ත්වය පහළ ම තත්ත්වයක විය.

**ආගමික ඇදහිලි හා විශ්වාස**

- දේව වන්දනාව ප්‍රධාන ස්ථානය ගැනීම
- සතුන්, සර්පයන් හා ස්වභාවික වස්තු ඇදහිලිවලට සම්බන්ධ කොට ගැනීම
- ආමෙන් ප්‍රධාන දෙවියා බවට පත් වීම
- විවිධ ක්ෂේත්‍රවලට අදාළ ව දෙවිවරුන් රාශියක් සිටීම.
  (උදාහරණ : යුද්ධය, ලෙඩරෝග, සශ්‍රීකත්වය, වගා කටයුතු)
- සූර්ය දෙවියා ප්‍රධාන දෙවියා වීම.




ඡායාරූපය 8.4.7 කානැක් දේවස්ථානය

- දෙවියන් උදෙසා දේවස්ථාන හා ප්‍රතිමා නෙළීම රාජ්‍ය කටයුත්තක් ලෙස පැවතීම
- මරණින් මතු ආත්මය පිළිබඳ දැඩි විශ්වාසයක් ඊජිප්තු වැසියන් අතර පැවතීම
- මියගිය අයගේ ආත්මය පිළිබඳව කරනු ලබන විනිශ්චය මත ආත්මයට අමරණීය බව හෝ අයහපත සිදුවන බව විශ්වාස කිරීම



ඡායාරූපය 8.4.8

- මේ නිසා මිය ගිය පුද්ගලයන්ගේ මෘත ශරීර කල් තබා ගැනීමේ ක්‍රම අනුගමනය කිරීම.
- මමියක් ලෙස සකස් කිරීම.
- මියගිය පුද්ගලයාගේ ආත්මය පිළිබඳ විශ්වාසය මත ඔහු හෝ ඇය පරිහරණය කරන ලද භාණ්ඩ සොහොන් ගැබ්වල තැන්පත් කිරීම චාරිත්‍රයක් ලෙස පැවතීම




ඡායාරූපය 8.4.9 තුතන් කාමන්ගේ සොහොන්ගැබ

**කලාව හා සාහිත්‍ය**

- ඊජිප්තු වැසියන් අක්ෂර ලිවීම ආරම්භ කළේ ක්‍රි. පූ 3000 පමණ සිට ය.
- මුල දී ඔවුන්ගේ අක්ෂර ලෙස රූපාක්ෂර භාවිත විය.
- 1799 දී සොයාගනු ලැබූ රොසිටා පාෂාණයන් පැරණි ඊජිප්තුවේ ලේඛන කලාව පිළිබඳ වැදගත් තොරතුරු රැසක් අනාවරණය කර ගත හැකි විය.



ඡායාරූපය 8.4.10 ඊජිප්තු රූපාක්ෂර



**රොසිටා පාෂාණය**

*මෙය අක්ෂර ශෛලීන් තුනකට අනුව ලේඛනගත කර ඇත. ශිලා පුවරුවෙන් ඉහළ කොටස පැරණි රූපාක්ෂරවලින් ද මැද කොටස ඩිමොටික් අක්ෂර හා පහළ කොටස පැරණි ග්‍රීක අක්ෂරවලින් සමන්විත වේ.*

ඡායාරූපය 8.4.11

- ලේඛන කටයුතු සඳහා පාෂාණ මෙන් ම පැපිරස් නම් වූ පත්‍ර විශේෂයක් හා මැටි භාණ්ඩ ද උපයෝගී කර ගෙන ඇත.
- ක්‍රි.පූ 2500ට තරම් පැරණි පැපිරස් පත්‍ර හමු වී ඇත.



ඡායාරූපය 8.4.12 පැපිරස් පත්‍රවල ලියන ලද ලේඛන

- ඊජිප්තුවට අයත් සාහිත්‍යමය ලේඛන මැටි පුවරු, දේවස්ථානවල බිත්ති, ශිලා ලිපි, පැපිරස් පත්‍ර, සොහොන් ගැබ් හා මිනී පෙට්ටිවල ලියා ඇත.
- මෙම ලේඛනවල චරිතාපදාන කවි, ආගමික අංශයට අදාළ තොරතුරු හා විවිධ සිතුවම්, මරණින් මතු ජීවිතය ආදිය පිළිබඳ සඳහන් වේ.

  උදාහරණ - වෙස්කාර් පැපිරසය
- (හතරවන රාජවංශයට අයත් කුෆු පාරාවෝ විසින් තම පුතුන්ට ප්‍රකාශ කරන ලද කථා ලෙස රචනා කර ඇත.)
- වෛද්‍ය ග්‍රන්ථයක්වන එබස් පැපිරසය.
- ලේඛනවල රාජනාමාවලි හා පාලන කාල පුරාවෘත්ත හා විශ්වාස, නීති ක්‍රම පිළිබඳව ද ඇතුළත් වීම.

**කලා කෘති**

**ප්‍රතිමා**

- ප්‍රතිමා නෙළීම ඊජිප්තුවේ කැපී පෙනෙන නිර්මාණය යි. දෙවන රැම්සිස් රජුට අයත් අබු සිම්බල් දේවස්ථානයේ සිංහාසනාරූඪව සිටින රජු හා බිසව ගේ ප්‍රතිමා ඊජිප්තු කලා කරුවාගේ දක්ෂතා ව පිළිබිඹු කරයි.



ඡායාරූපය 8.4.13 අබුසිම්බල් දේවස්ථානය ඉදිරිපස රජු හා බිසව නිරූපිත ප්‍රතිමා

- ප්‍රතිමා නෙළීම සඳහා ගල්, මැටි හා ලී භාවිත කිරීම
- ප්‍රතිමා වර්ණ ගැන්වීම සඳහා විවිධ වර්ණ භාවිත කර ඇති බව (රතු, කහ, නිල්, කොළ, කළු, සුදු)
- මැටි භාජනවල ඇති කැටයම් නිර්මාණ ඔවුන්ගේ කලා කෞශල්‍යය තවදුරටත් විදහා දැක්වීම.
- සොහොන්, දේවස්ථාන, මැටි බඳුන් හා පැපිරස් පත්‍රවල විවිධ තේමා පාදක කරගනිමින් චිත්‍ර ඇඳ තිබීම.



ඡායාරූපය 8.4.14 ඊජිප්තු කෞතුකාගාරයේ තැන්පත් කර ඇති මැටි භාණ්ඩ



ඡායාරූපය 8.4.15 පැපිරස් පත්‍රවල අඳින ලද චිත්‍ර

**විද්‍යාව හා තාක්ෂණය**

පැරණි ලෝකයේ ඊජිප්තුවාසීන් විද්‍යාව හා තාක්ෂණික වශයෙන් ඉතා දියුණු තත්ත්වයක සිටි පිරිසක් බව

| | | |
|---|---|---|
| උදාහරණ | පිරමීඩ නිර්මාණය | දේවස්ථාන ඉදි කිරීම |
| | වෛද්‍ය විද්‍යාව | මමී සැකසීම |
| | නාවික තාක්ෂණය | |
| | වාරිමාර්ග | |

- ශල්‍ය වෛද්‍ය විද්‍යාවේ දියුණුව (හිස, උදරය, ඇස් හා දන්ත වෛද්‍යවරු සිටීම)
- වෛද්‍ය වෘත්තිය සඳහා ශිෂ්‍යයන් පුහුණු කිරීමට ආයතන හා වෛද්‍ය විද්‍යාල පැවතීම
- සිරුරු හා තුවාල පිළිබඳ ප්‍රායෝගික ව අධ්‍යයනය කිරීම
- ශල්‍ය වෛද්‍ය උපකරණ රැසක් සොයාගෙන තිබීම

**ඊජිප්තු ශිෂ්ටාචාරයෙන් පසුකාලීන ලෝකයට උරුම වූ දායාද**

- පැරණිතම දින දර්ශනය සැකසීම
- සූර්යයාගේ ගමන් විලාසය අනුව මෙය සකස් කර ඇත.

1. වසරකට දින 365ක් ලෙස දින දර්ශනය සැකසීම
2. දිනකට පැය 24ක් වෙන් කිරීම
3. වසරකට මාස 12ක් බව තීරණය කිරීම

**වෛද්‍ය විද්‍යා**

- දන්ත වෛද්‍ය, කායික වෛද්‍ය, ශල්‍ය වෛද්‍ය විද්‍යාවේ දියුණුව
- මල සිරුරු කල් තබා ගැනීම සඳහා මමීකරණය කිරීම

- ගණිතය හා ජ්‍යාමිතිය පිළිබඳ දැනුම
- කිරුම් මිනුම්, බදු එකතු කිරීම, අස්වැන්න ගණනය කිරීම හා ජ්‍යාමිතික වශයෙන් වාස්තු විද්‍යාත්මක නිර්මාණ, (පිරමීඩ උදාහරණ ලෙස දැක්විය හැකි ය.)
- වාරි තාක්ෂණය
- අක්ෂර කලාව
- නාවික තාක්ෂණය

  **උදාහරණ -** පැපිරස් පත්‍රවලින් සකසන ලද නාවික යාත්‍රා

ඉහත සඳහන් කරුණු ආවරණය වන පරිදි සුදුසු ක්‍රියාකාරකමක යොදවන්න.

» මෙය කේවල ක්‍රියාකාරකමක් ලෙස යොදා ගන්න.
» නයිල් ශිෂ්ටාචාරය පාඩම ඇසුරින් කෙටි ප්‍රශ්න ඇතුළත් පොත් පිංචක් සැකසීමට උපදෙස් දෙන්න.
» ප්‍රශ්න සඳහා පිළිතුර ද එකතු කිරීමට සිසුන්ට දන්වන්න.
» මේ සඳහා දින තුනක කාලයක් ලබා දෙන්න.
» නියමිත දිනයේ දී සිසුන් සකස් කළ පොත් එකතු කර ඇගයීම කරන්න.
» වඩාත් නිවැරැදි හා නිර්මාණශීලී ප්‍රශ්න පොත් පිළිබඳ උපස්තම්භනය කරන්න.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

- නයිල් නිම්න ශිෂ්ටාචාරය පිළිබඳ තොරතුරු විස්තර කරයි.
- නයිල් ශිෂ්ටාචාරය ඇසුරින් ප්‍රශ්න පොතක් සකස් කරයි.
- නිර්මාණාත්මක බවින් යුතු ප්‍රශ්න සකසයි.
- පාඩම සම්පූර්ණ ආවරණය කරමින් ප්‍රශ්න සකසයි.
- නියමිත දිනට ක්‍රියාකාරකම භාර දෙයි.

**නිපුණතා මට්ටම** : 8.5 හොවැංහෝ ශිෂ්ටාචාරයේ ආරම්භය හා විකාශනය විස්තර කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 03

**ඉගෙනුම් පල** :

- හොවැංහෝ ශිෂ්ටාචාරයේ ආරම්භය විස්තර කරයි
- හොවැංහෝ ශිෂ්ටාචාරයේ වර්ධනීය අවස්ථාවන් හඳුනා ගනී.
- හොවැංහෝ ශිෂ්ටාචාරයෙන් ලෝකයට උරුම වූ දායාද හා වටිනාකම් අගය කරයි.
- හොවැංහෝ ශිෂ්ටාචාරයේ පිහිටීම සිතියමක ලකුණු කොට නම් කරයි.

**ආකල්ප හා වටිනාකම්** :

- පැරණි මුතුන් මිත්තන්ගේ නිර්මාණාත්මක හැකියාවන් වර්තමානයට ප්‍රයෝජනවත් වන ආකාරයට ඇගයීම.
- නව නිපයුම් දීර්ඝ කාලීන ප්‍රතිඵලදායක වන අයුරින් ගොඩනැගීමට පෙළඹීම.

**ගුණාත්මක යෙදවුම්** :

- www.timemaps.com/civilizations/ancient-china
- www.ancient.eu/china
- ඇමුණුම් 01 සිතියම ඇමුණුම 02

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය සඳහා උපදෙස් :**

පහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම සැලසුම් කරන්න.

**8.5 හොවැංහෝ ශිෂ්ටාචාරය**

**හැඳින්වීම**

ලෝකයේ නැගෙනහිරින් පිහිටි චීනය පැසිෆික් සාගරයට මුහුණ ලා පිහිටා ඇත. හොවැංහෝ හෙවත් කහ ගංගාවෙන් නිරන්තර ජලගැලීම්වලට නතු වෙමින් සශ්‍රීක භූමිභාගයකට උරුමකම් කියන චීනය අභ්‍යන්තරික වශයෙන් භූගෝලීය විවිධත්වයෙන් යුතු රටකි. කාන්තාර හා වියළි දුෂ්කර කඳුවලින් යුක්තය. හිමාලය කඳුවැටිය හා ඉන්දියන් සාගරය නිසා චීනය ස්වාභාවිකව ආරක්ෂා වී පැවතිණ. මෙම භූ භෞතික පරිසරය තුළ චීනය බාහිර ලෝකයේ බලපෑම්වලින් තොරව හුදකලා ව සුවිශේෂී අනන්‍යතාවන්ගෙන් සමන්විත ශිෂ්ටාචාරයකට උරුමකම් කියා ඇත.

ක්‍රි.පූ 8000ත් 6000ත් අතර කාලයේ චීනයේ උතුරු කොටසේ කහ ගංගාව ආශ්‍රිත ප්‍රදේශයේත් යැන්ග්සි ගංගා නිම්නයේ ගොවිතැන් කටයුතු ආරම්භ කර ඇත. කුරක්කන් හා වී ප්‍රධාන බෝග වගාවන් වූ අතර ගංගා ආශ්‍රිත පෝෂක ප්‍රදේශය කෘෂිකර්මාන්තයේ දියුණුවට ප්‍රබල බලපෑමක් සිදු කර ඇත.

ක්‍රි.පූ 6000 පමණ වන විට චීනයේ ස්ථිර ජනාවාස පිහිටුවා ගනිමින් ගම්මාන ගොඩනැගී තිබිණ. ඒ සමග ම වී ගෘහාශ්‍රිතකරණය කිරීම හේතුකොටගෙන කෘෂිකර්මාන්තයේ සුවිශාල පරිවර්තනයක් සිදු විය. කහ ගංගාව ආශ්‍රිතව කෘෂිකාර්මික දියුණුවත් සමග විවිධ සංස්කෘතීන් ගේ වර්ධනය වීම ද දැක ගත හැකිය.

ක්‍රි.පූ 2500 - 1900ත් අතර කාලයේ චීනයේ පැරණිතම අක්ෂර පිළිබඳ සාධක හමු වී ඇති අතර ක්‍රි.පූ 2000 පමණ වන විට චීන ශිෂ්ටාචාරය ආරම්භ වී ඇත.

චීන ශිෂ්ටාචාරය ගොඩනැගීමට පෙර වර්ධනය වූ යන්ග්ෂාවෝ සංස්කෘතිය, ඩාවෙන්කෞ සංස්කෘතිය සහ ඩක්සි සංස්කෘතිය හා ලොන්ග්ෂාන් සංස්කෘතිය චීන ශිෂ්ටාචාරය ගොඩනැගීමට අවශ්‍ය පදනම සකස් කරනු ලැබීය.

- හොවැංහෝ ශිෂ්ටාචාරයේ පාලනය

හොවැංහෝ හෙවත් චීන ශිෂ්ටාචාරය රජ පෙළපත් කිහිපයක් යටතේ පාලනය විය.

- ෂියා රජ පෙළපත (ක්‍රි.පූ 2000 - 1500)
- ෂාන්ග් රජ පෙළපත (ක්‍රි.පූ 1500 - 1045)
- බටහිර සොහෞ රජ පෙළපත (ක්‍රි.පූ 1045 - 711)
- ක්වීන් රජ පෙළපත (ක්‍රි.පූ 221 - 207)
- හන් රජ පෙළපත (ක්‍රි.පූ 206 - 220)

**ආර්ථික තත්ත්වය**

- ආර්ථිකය කෘෂිකර්මාන්තය මත පදනම් කර ගැනීම.
- කුරක්කන් හා වී ප්‍රධාන භෝග වගාවන් වීම.
- තිරිඟු, සෝයා බෝංචි, මල්බෙරි වගා කිරීම
- හන් රාජ සමයේ කෘෂිකර්මාන්තය දියුණු කිරීමට පියවර ගැනීම



ඡායාරූපය 8.5.1 කෘෂි උපකරණ චෞ රාජ යුගයට අයත් යකඩ දෑකැත්තක්

**කර්මාන්ත**

- විවිධ කර්මාන්ත ආශ්‍රිත පුහුණු ශිල්පීන් සිටි බව
- ලෝකඩ වැඩ
- මැටි භාණ්ඩ නිෂ්පාදනය
- කරත්ත නිෂ්පාදනය
- යුධ කටයුතු සඳහා අවි ආයුධ නිෂ්පාදනය

- ක්‍රි.පූ 120 දී පමණ හන් පාලකයන් ප්‍රධාන කර්මාන්ත ජනසතු කිරීමට ක්‍රියා කිරීම
- ආර්ථික කටයුතු භාර අමාත්‍යාංශය අමාත්‍යවරයෙකු යටතේ ක්‍රියාත්මක වීම
- යකඩ, ලුණු හා මධ්‍යසාර නිෂ්පාදනය හා අලෙවිය අමාත්‍යාංශයට භාර වගකීම් වීම.
- කාසි මුද්‍රණය ද අමාත්‍යවරයෙකු යටතේ ක්‍රියාත්මක වීම



ඡායාරූපය 8.5.2
ෂන්ග් රාජවංශයට අයත් ලෝකඩ වයින් බඳුනක්
ක්‍රි.පූ. 13 වන සියවස



ඡායාරූපය 8.5.3
ක්‍රි.පූ. 2 වන සියවසේ හන් රාජවංශයට අයත් දැව කොපුවක් සහිත යකඩ කඩුවක් දැනට ලන්ඩන් බ්‍රිතාන්‍ය කෞතුකාගාරයේ තැන්පත් කර ඇත.

**වෙළෙඳාම**

චීන මැටි බඳුන් (පෝසිලේන්)



**ඡායාරූපය 8.5.4**

**ක්වීන් රාජවංශයට අයත් ඊතල**



**ඡායාරූපය 8.5.5**

**හන් රාජවංශයට අයත් පෝසිලේන් බෝල් එකක්**

**ආගමික ඇදහිලි හා විශ්වාස**

- කොන්ෆියුසියස් දහම

✻ චීනයේ ආගමික දර්ශනය විමුක්තිවාදයෙන් බැහැරට ගොස් සමාජයට විමුක්තිය ළඟා කරන්නේ කෙසේ ද යන්න විස්තර කරයි. මිනිසා හා සමාජය අතර සබඳතා ව, සමාජය ගොඩනැගීමේ දී පවුල නමැති ඒකකයට හිමිවන වැදගත්කම තහවුරු කරයි.

- තාඕ දහම
- බුදු දහම
- දේව සංකල්පය
- ආත්මය පිළිබඳ විශ්වාසය

- මිය ගිය පුද්ගලයන් ජීවමාන අයගේ සුභසිද්ධියට ක්‍රියා කරනවා ය යන විශ්වාසය නිසා මියගිය අයට පුද පූජා පැවැත් වීම. ඒ සඳහා විවිධ අභිචාර ක්‍රම පැවතීම.
- මළවුන් පිදීම රාජ්‍ය මට්ටමින් පවා සිදු කිරීම
- මේ සඳහා විවිධ යාතු කර්ම පැවැත් වීම, ඒ සඳහා ලෝකඩ භාජන භාවිතය
- මියගිය අය වෙනුවෙන් ඔවුන්ගේ සොහොන්වල විවිධ භාණ්ඩ තැන්පත් කිරීම
- කෘෂි කාර්මික දියුණුව, වර්ෂාව ලබා ගැනීම, දඩයම් සාර්ථක කර ගැනීම ආදිය සඳහා යාතු කර්ම සිදු කිරීම.
- යාතු කර්ම සඳහා මිනිසුන් හා සතුන් බිලි පූජාවන් ලෙස කැප කිරීම.

**විද්‍යාව හා තාක්ෂණය**

චීන ජාතිකයන් ලෝකයට උරුම කර දුන් විද්‍යාත්මක සොයා ගැනීම් කිහිපයකි.

» කඩදාසි
» මාලිමා යන්ත්‍රය - හන් රාජ වංශය
» වෙඩි බෙහෙත්
» මුද්‍රණ ශිල්පය



ඡායාරූපය 8.5.6

**8.3.6 ෂන්ග් රාජවංශයට අයත් මාලිමා යන්ත්‍රය දිශාව පෙන්නුම් කිරීම සඳහා හැන්ද භ්‍රමණය වේ.**

- කෘෂිකාර්මික නිෂ්පාදන වැඩි කිරීම සඳහා විවිධ උපකරණ නිපදවීම.
උදාහරණ ක්‍රි.පූ 86 දී වී පැල කිරීමේ යන්ත්‍රයක් හඳුන්වා දීම.

- විවිධ නිර්මාණ

චීන මහා ප්‍රාකාරය

*මෙය චීනයේ උතුරු දේශසීමාව ආරක්ෂා කිරීම සඳහා ඉදි කර ඇත. ක්‍රි. පූ 700 දී පමණ ඉදි කිරීම් ආරම්භ කළ නමුත් විවිධ කාලවල දී වැඩි දියුණු විය. මේ සඳහා ගල්, ගඩොල්, මැටි හා දැව භාවිත කර ඇත. සේද මාවත හරහා සිදු වූ වෙළෙඳ කටයුතුවල දී බදු අය කිරීම, වෙළෙඳාමේ දී සිදුවන ආගමන හා විගමන කටයුතු පාලනය කිරීමත් ආරක්ෂා කටයුතු වලට අමතරව මෙමගින් ඉටු වූ සේවාවන් විය.*



ඡායාරූපය 8.5.7

**පෝසිලේන් භාණ්ඩ**

- ඔප දමන ලද මැටි භාණ්ඩ
- පෝසිලේන් භාණ්ඩ නිෂ්පාදනය මුලින් ම ආරම්භ වන්නේ හන් රාජවංශ අවධියේ ය.
- මෙම භාණ්ඩ සඳහා කිරි මැටි (කෙසොලින්) තිරිවානා ආදිය අමුද්‍රව්‍ය ලෙස භාවිත කර ඇත.
- මෙම භාණ්ඩ පිළිස්සීම සඳහා යොදා ගත් උඳුන් හන් රාජ වංශ අවධියෙන් සොයා ගෙන ඇත.

සේද රෙදි

- සේද රෙදි නිෂ්පාදනය සම්බන්ධයෙන් චීනයෙන් පැරණිතම සාධක හමුවන්නේ ක්‍රි.පූ 4000 දී පමණය.
- පට පණු කෝෂවලින් ලබා ගන්නා සේද නූල් කැටීමට සකස් කරන ලද ස්ථාන පිළිබඳව සාධක හමු වී ඇත.
- රාජකීය සොහොන්වලින් චීනයේ නිෂ්පාදනය කරන ලද සේද රෙදි හමු වී ඇත.
- චීනයේ සේද රෙදි නිෂ්පාදනය හා බාහිර ලෝකයට ව්‍යාප්ත වූයේ සේද මාවත නම් වූ වෙළෙඳ මාර්ග ඔස්සේ ය.
- සේද රෙදි නිෂ්පාදන තාක්ෂණය පළමුවෙන් ම ලබා ගත් රටවල් වූයේ කොරියාව හා ජපානය යි. ඊට පසුව ඉන්දියාව ද සේද රෙදි නිෂ්පාදන තාක්ෂණය පිළිබඳව දැනුවත් වී ඇත.



ඡායාරූපය 8.5.8

**හුනාන් පළාතට අයත් මුවන්ග්දූයි ප්‍රදේශයේ අංක 01 දරන සොහොනෙන් සොයාගන්නා ලද ක්‍රි.පූ. 2වන සියවසට අයත් සේද රෙදි කැබැල්ලක්**

අක්ෂර භාවිතය

- අක්ෂර ලිවීම හා ලේඛන කටයුතු සඳහා සත්ත්ව ඇටකටු , කැස්බෑ ලෙලි, උණ බම්බු, කඩදාසි භාවිත කර ඇත.
- කඩදාසි නිෂ්පාදනය හා මුද්‍රණ ශිල්පය හේතුකොට ලේඛන කලාව වේගයෙන් දියුණුවට පත් වීම.
- මුද්‍රිත කඩදාසි ලේඛන ක්‍රි.ව. නමවන සියවස දක්වා දිව යයි.



**ඡායාරූපය 8.5.9**
**කැස්බෑ ලෙල්ලක ලියන ලද අක්ෂර**
**(ෂැන්ග් රාජවංශයට අයත්)**

ඉහත විෂය ක්‍රියාකාරකම කරුණු ඇසුරින් හොවැංහෝ ශිෂ්ටාචාරය පිළිබඳ තොරතුරු ඇතුළත් හැකුළුම්පතක් නිර්මාණය කිරීමට සිසුන් යොමු කරන්න. ඒ සඳහා ඇමුණුම අංක 2.3,4,5 යොදා ගන්න.


- මෙය කණ්ඩායම් ක්‍රියාකාරකමක් ලෙස යොදා ගන්න.
- ඇමුණුම 2හි හැකුළුම් පත සැකසීම පිළිබඳ උපදෙස් අනුව ක්‍රියාකාරකම වෙත සිසුන් යොමු කරන්න.
- පන්තියේ සිසුන්, කණ්ඩායම් සඳහා ප්‍රමාණවත් නොවේ නම් එක් කණ්ඩායමකට ක්‍රියාකාරකම් කීපයක් ලබා දෙන්න.

**ඇගයීම හා තක්සේරුව සඳහා උපදෙස් :**

**පහත සඳහන් කරුණු ඇසුරින් ඇගයීම හා තක්සේරුකරණය සිදු කරන්න.**

- හොවැංහෝ ශිෂ්ටාචාරය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.
- හොවැංහෝ ශිෂ්ටාචාරයේ වැසියන්ගේ සේවාවන් අගය කරයි.
- හොවැංහෝ ශිෂ්ටාචාරය පිළිබඳ තොරතුරු ඇතුළත් හැකුළුම්පතක් සකසයි.
- කණ්ඩායම තුළ සහ සහයෝගයෙන් කටයුතු කරයි.
- හැකුළුම් පත නිර්මාණශීලී ව සකස් කරයි.

ඇමුණුම අංක 02



ඇමුණුම අංක 03

- A3 හෝ ඒ හා සමාන කඩදාසියක් ගෙන එය ඇමුණුම 3 රූපයේ පරිදි පැති 6ක් එන පරිදි නමා හැකුළුම් පතක් සකස් කර ගන්න.
- සිසු කණ්ඩායම් නිර්මාණ එම හැකුළුම් පතේ අදාළ පිටුවල අලවන්න.

ඇමුණුම අංක 04

කණ්ඩායම අංක 01

- හොවැංහෝ ශිෂ්ටාචාරයේ පාලනය යටතේ කරුණු ගොනු කරන්න.
- එම කරුණු A4 කොළයක් දෙකට නවා (කොළ භාගයක) තනි පැත්තක පමණක් ලියන්න.
- හැකි නම් අදාළ චිත්‍ර හෝ පිංතූර යොදා නිර්මාණය අලංකාර කරන්න.
- සකසා ගත් තීරුව හැකුළුම්පතේ දෙවන පිටුවේ අලවන්න.

කණ්ඩායම 02

- හොවැංහෝ ශිෂ්ටාචාරයේ ආගමික තත්ත්වය යටතේ කරුණු ගොනු කරන්න.
- එම කරුණු A4 කොළයක් දෙකට නවා (කොළ භාගයක) තනි පැත්තක පමණක් ලියන්න.
- හැකි නම් අදාළ චිත්‍ර හෝ පින්තූර යොදා නිර්මාණය අලංකාර කරන්න.
- සකසා ගත් තීරුව හැකුළුම් පතේ පස්වන පිටුවේ අලවන්න.

කණ්ඩායම 03

- හොවැංහෝ ශිෂ්ටාචාරයෙන් උරුම වූ දායාද යටතේ කරුණු ගොනු කරන්න.
- එම කරුණු A4 කොළයක් දෙකට නවා (කොළ භාගයක) තනි පැත්තක පමණක් ලියන්න.
- හැකි නම් අදාළ චිත්‍ර හෝ පින්තූර යොදා නිර්මාණය අලංකාර කරන්න.
- සකසා ගත් තීරුව හැකුළුම් පතේ පස්වන පිටුවේ අලවන්න.

කණ්ඩායම 04

- හොවැංහෝ ශිෂ්ටාචාරයේ ආර්ථිකයේ වැදගත් අංග යටතේ කරුණු ගොනු කරන්න.
- එම කරුණු A4 කොළයක් දෙකට නවා (කොළ භාගයක) තනි පැත්තක පමණක් ලියන්න.
- හැකි නම් අදාළ චිත්‍ර හෝ පින්තූර යොදා නිර්මාණය අලංකාර කරන්න.
- සකසා ගත් තීරුව හැකුළුම් පතේ පස්වන පිටුවේ අලවන්න.

**නිපුණතා මට්ටම** : 8.6 ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ ආරම්භය හා විකාශනය විස්තර කරන්න.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 03

**ඉගෙනුම් පල** :

- ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ ආරම්භය පිළිබඳ විස්තර කරයි.
- ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ වර්ධනීය අවස්ථාවන් හඳුනා ගනියි.
- ඉන්දු නිම්න ශිෂ්ටාචාරයෙන් ලෝකයට උරුම වූ දායාද හා වටිනාකම් අගය යි.
- ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ පිහිටීම සිතියමක ලකුණු කොට නම් කරයි.

**ආකල්ප හා වටිනාකම්** :

- පැරණි මුතුන් මිත්තන්ගේ නිර්මාණාත්මක හැකියාවන් වර්තමානයට ප්‍රයෝජනවත්වන ආකාරයට ඇගයීම
- නව නිපැයුම් දීර්ඝ කාලීන ප්‍රතිඵලදායක වන අයුරින් ගොඩනගා ගැනීමට පෙළඹවීම

**ගුණාත්මක යෙදවුම්** :

- www.harappa.com
- www.britannica.com/topic/civilizatation

- ඇමුණුම 1 සිතියම
- ඇමුණුම 02 රූප සටහන්

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය සඳහා උපදෙස් :**
පහත සඳහන් විෂය කරුණු ඇසුරෙන් පාඩම සැලසුම් කර ගන්න.

**8.6 ඉන්දු නිම්න ශිෂ්ටාචාරය**

**හැඳින්වීම**

නවත ම පුරාවිද්‍යාත්මක සාධක අනුව ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ ශිෂ්ටාචාරික ලක්ෂණයන්ගේ දියුණු ම අවධිය ක්‍රි.පූ. 3000 සිට 1800 දක්වා බව පිළිගෙන ඇත. නමුත් ක්‍රි.පූ. 7000 සිට ශිෂ්ටාචාරයේ මුල් අවස්ථා පිළිබඳ සාධක අනාවරණය කර ගෙන ඇත. ක්‍රි.පූ 1800 දී පමණ සිට ශිෂ්ටාචාරයේ පරිහානිය ආරම්භ වීමත්, 1650 දී පමණ බිඳ වැටීමත් සිදු විය.

වර්ග සැතපුම් විසිලක්ෂයක් පමණ විශාල භූමි ප්‍රදේශයක ව්‍යාප්ත වී ඇති මෙම ශිෂ්ටාචාරය හරප්පා ශිෂ්ටාචාරය යනුවෙන් ද හැඳින්වේ. බටහිර දිග ඉන්දියාවේ සප්ත සින්ධු ප්‍රදේශය කේන්ද්‍ර කර ගනිමින් ගොඩනැගුණු හරප්පා ශිෂ්ටාචාරය පිළිබඳ සලකුණු මුල් වරට සොයා ගනු ලැබුවේ ක්‍රි.ව. 1826 දී චාල්ස් මාසන් විසිනි. බ්‍රිතාන්‍යයන් ඉන්දියාවේ ලාහෝර් සිට කරච්චිය දක්වා වූ දුම්රිය මාර්ගය ඉදි කිරීමේ දී මෙයට අයත් නටබුන් සොයාගෙන ඇත.

බ්‍රිතාන්‍ය ජාතික ඇලෙක්සැන්ඩර් කනින්හැම් මහතා මෙම ශිෂ්ටාචාරය පිළිබඳව ප්‍රථමවරට පුරාවිද්‍යාත්මක පර්යේෂණ ආරම්භ කරන ලදී. ක්‍රි.ව. 1921 විධිමත් පුරාවිද්‍යාත්මක පර්යේෂණ සිදු කළ දයාරාම් ශානි මහතා විසින් හරප්පා නගරයත්, 1922 ආර්.ඩී බැනර්ජි විසින් මොහෙන්දජාරෝ නගරයත් සොයා ගන්නා ලදී. පසුව මෙය මොහෙන්දජාරෝ හරප්පා ශිෂ්ටාචාරය යනුවෙන් ද හැඳින්වීය.

මේ වන විටත් හරප්පාවේ අක්ෂර කියවා ගත නොහැකි නිසා මෙම ශිෂ්ටාචාරය පූර්ව ඓතිහාසික යුගයට අයත් වේ.

**ආරම්භය හා ව්‍යාප්තිය**

හරප්පා ශිෂ්ටාචාරයේ ආරම්භය පිළිබඳව ප්‍රධාන මතවාද දෙකක් පවතී

1. දේශීය ජන කණ්ඩායමක් විසින් ආරම්භ කරන ලද බව
   මෙම මතය දරන්නන් ලෙස ෆෙයාර් සර්විස්, ගිලීන් ඩැනියෙන් යන අයගේ මතය විය.

2. විදේශීය ජන කණ්ඩායම් විසින් ආරම්භ කරන ලද බව මෝටිමර් වීලර්, වින්සන්ට් ස්මිත් යන අයගේ මතය විය.

නමුත් 2016 දී වසන්ත් සින්දේ මහතා විසින් සිදු කළ නවතම පුරාවිද්‍යා පර්යේෂණ මගින් හරප්පාව මෙන් තුන් ගුණයකින් විශාල රඛිගාර් නගරය සොයා ගන්නා ලදී. ඒ අනුව හරප්පාවේ ප්‍රධාන ම නගරය රඛිගාර් බව වර්තමාන පිළිගැනීම ය. මේ අනුව මෙම ශිෂ්ටාචාරය ස්වාධීනව ගොඩනැගුණු ශිෂ්ටාචාරයක් බවට අනාවරණය වී ඇත.

උතුරින් හිමාලය පාමුල රූපාර් දක්වාත්, දකුණින් මහාරාෂ්ට්‍රගේ දයිමාබාද් දක්වාත්, නැගෙනහිරින් ගංගා නදියේ අලම්ගීර්පුරි හා බටහිරින් සුක්තජෙන්දෝර් දක්වාත් ව්‍යාප්ත වී ඇත.

- **නගර නිර්මාණය හා වාස්තු විද්‍යාත්මක ලක්ෂණ**

    - හරප්පා, මොහෙන්ජොදාරෝ හා රබිගාර් හි නගර නිර්මාණය සමාන අංග ලක්ෂණයන්ගෙන් යුක්ත වේ.

    - අඩි 10 – 30 පමණ තෙක් පළලින් යුතු ඍජු ප්‍රධාන මාර්ග හා සම්බන්ධ වූ පටු මාර්ග පද්ධතියක් ගොඩනැගී තිබිණ.



ඡායාරූපය රූපය 8.6.1 ප්‍රධාන වීදි



ඡායාරූපය 8.6.2 පටු වීදි

    - ඉදි කිරීම් සඳහා පිළිස්සූ ගඩොල් භාවිත කර ඇත.

    - නගරයේ මහාමාර්ග පද්ධතියට සමාන්තර ව විහිදෙන කාණු පද්ධතියක් පැවතීම.

    - නගර නිර්මාණයට අමතරව වාස්තු විද්‍යාත්මක ඉදි කිරීම් රැසක් පිළිබඳ නටබුන් රාශියක් දැකිය හැකි වීම

- නිවාස
- ධාන්‍යාගාර
- ඇතුළු නගර
- මොහෙන්ජොදාරෝවේ නාන තටාකය
- ආලෝක කුලුනු
- සනීපාරක්ෂක කටයුතු

✳ ඉන්දු නිම්නයේ ඉදි කිරීම් සඳහා භාවිත කරන ලද පිළිස්සූ ගඩොල්, අනෙකුත් ශිෂ්ටාචාරවලින් හමු වූ ගඩොල්වලට වඩා ශක්තිමත් ම ගඩොල් බවට තහවුරු වී ඇත.



ඡායාරූපය 8.6.3 පිළිස්සූ ගඩොල්

නිවාස

- ඉන්දු නිම්න වැසියන් සනීපාරක්ෂාව පිළිබඳව වැඩි අවධානයක් යොමු කර තිබීම.
- නගර තුළ මෙන් ම නිවාසවල සනීපාරක්ෂාව සඳහා විවිධ ක්‍රම අනුගමනය කර තිබීම. උදාහරණ - සැලසුම් සහගත ලෙස ඉදි කරන ලද කාණු පද්ධති නිවාස සඳහා වෙන් වූ වැසිකිළි හා අපවිත්‍ර ජලය, නිවාසවල මල අපවහනය සඳහා කළ නල පද්ධති සවි කර තිබීම.
- මොහෙන්ජොදාරෝ නගරයෙන් හමු වී ඇති සාධක අනුව සුඛෝපභෝගී ජීවිත ගත කළ පිරිස, වාසය කළ නිවාස හමු වී ඇත. ඒවා සෞඛ්‍ය සම්පන්නව, මැද මිදුල් සහිත ව උස් බිත්තිවලින් සමන්විත ව පැවතීම.
- ඇතැම් නිවාස තට්ටු දෙක තුනකින් යුක්ත වී ඇති අතර ඇතැම් නිවාසවලට අයත් පඩි පේළි අදටත් දැක ගත හැකි ය.
- මහල් නිවාසවලට අමතරව කම්කරු නිවාස පේළි ද දක්නට ලැබේ.



ඡායාරූපය 8.6.6 මහල් නිවාස



රූපය 8.6.7
හරප්පාවෙන් හමු වූ කම්කරු
නිවාසවල පාදම්

ධාන්‍යාගාර

- හරප්පාවෙන් හමු වී ඇති ධාන්‍යාගාරය අඩි 45 x 15 ප්‍රමාණයෙන් යුක්ත වේ.
- මේ අසල ඇඹරුම් ගල් හා වංගෙඩි පැවති බවට සාධක හමු වී ඇත.
- තිරිඟු, බාර්ලි, දහයියාපොතු ආදිය පිළිබඳ අවශේෂ හමු වී ඇත.

ඇතුළු නගර

- ප්‍රධාන නගර පරිපාලන මධ්‍යස්ථාන ලෙස පැවති අතර ඒවා විශාල වේදිකා මත ඉදි කර ඇත.
- සින්දු නදියේ ජල ගැලීම්වලට මුහුණ දීම සඳහා වේදිකා හා අඩි 30කින් පමණ උස ප්‍රාකාරවලින් ආරක්ෂා කොට ඉදි කර ඇත.
- රාත්‍රී කාලයේ නගරය ආලෝක කිරීම සඳහා ආලෝක කුලුනු ඉදි කර ඇත.

මහා නාන තටාකය

අඩි 180 x 108 ප්‍රමාණයෙන් යුත් ස්නානාගාරය අපිරිසිදු ජලය පිට කිරීමට හා පිරිසිදු ජලය පොකුණට ගෙන ඒමට ඉදි කළ කාණු පද්ධතියකින් ද සමන්විත වේ.





ඡායාරූපය 8.6.4 අපවිත්‍ර ජලය බැහැර කිරීම සඳහා ඉදි කරන ලද කාණු




ඡායාරූපය 8.6.5 දොලවීර්වලින් හමු වූ නිවාසවල මල අපවහනය සඳහා සවි කරන ලද නලය

**ආර්ථික තත්ත්වය**

හරප්පාවේ ආර්ථිකය ප්‍රධාන අංශ හතරක් යටතේ ක්‍රියාත්මක විය.

1. කෘෂිකර්මාන්තය
2. සත්ත්ව පාලනය
3. වෙළෙඳාම
4. කර්මාන්ත

ධාන්‍යාගාර පිළිබඳ නටබුන්වලින් හරප්පාවේ විශාල වශයෙන් භෝග වගා කටයුතු සිදු වී ඇති බව.

තිරිගු, බාර්ලි, වගාවන්ට අමතරව කපු වගාව, කෙසෙල්, දොඩම් වැනි පළතුරු වගා හා ඉඳි ගස් වගා කර තිබීම.

- සත්ත්ව පාලනය ද කෘෂි කාර්මික කටයුතු හා සම්බන්ධ වූ අතර ප්‍රවාහන කටයුතුවලට ද යොදා ගෙන ඇත.

  (උදාහරණ සෙල්ලම් මැටි කරත්තය)
- ගවයා ප්‍රධාන වූ අතර ඌරන්, කුකුළන් හා එළුවන් මස් සඳහා ඇති කර ඇත.



ඡායාරූපය 8.6.9

**වෙළෙඳාම**

හරප්පා ශිෂ්ටාචාරයේ වෙළෙඳාම ප්‍රධාන අංශ දෙකක් යටතේ ක්‍රියාත්මක විය.

1. බාහිර වෙළෙඳාම
2. අභ්‍යන්තර වෙළෙඳාම

බාහිර වෙළෙඳාම ගොඩබිම හා මුහුදු මාර්ග ඔස්සේ සිදු වූ අතර අභ්‍යයන්තර වෙළෙඳාම ගැල් මගින් සිදු වී ඇත.

- වෙළඳ කටයුතු සඳහා විවිධ කිරුම් මිනුම් ක්‍රම භාවිත කර තිබීම. (තරාදි හා පඩි)
- මෙසපොතේමියාව, පර්සියන් ගල්ෆ් කලාපයේ රටවල් වන බහරේන්, ඉරානය හරහා අන්තර්ජාතික වෙළෙඳාම සිදු වී ඇත.
- ලෝතාල් හා සුක්තජෙන්දෝර් ප්‍රධාන වරායන් ලෙස පැවතීම



ඡායාරූපය 8.6.10 තරාදි පඩි



ඡායාරූපය 8.6.11 ලෝතාල් වරාය

**කර්මාන්ත**

හරප්පා ශිෂ්ටාචාරයේ ආර්ථිකයේ තවත් වැදගත් ක්ෂේත්‍රයක් වූයේ කර්මාන්ත ක්ෂේත්‍රය යි. නවත ම පර්යේෂණ අනුව රබිගාර්, කර්මාන්ත හා නිෂ්පාදන ක්‍රියාවලියේ ප්‍රධාන මධ්‍යස්ථානය බවට පත් වී ඇත.



ඡායාරූපය 8.6.12
**ලෝහ පිඟානක්**

- පේෂ කර්මාන්තය
- ලෝහ කර්මාන්තය
- කුඹල් කර්මාන්තය
- ධීවර කර්මාන්තය

ජනතාවගේ පරිභෝජනය සඳහා අවශ්‍ය භාණ්ඩ නිෂ්පාදනය කිරීම නිසා විවිධ අංශවලින් යුතු කර්මාන්ත පැවතීම



ඡායාරූපය 8.6.13
**ලෝහ පිහි**

**සමාජ තත්වය**

- මාතෘ මූලික සමාජයක් පැවතීම
- සමාජය තුළ විවිධ ස්ථර පැවතීම

  - ආගමික පන්තිය
  - පාලක පන්තිය
  - සාමාන්‍ය ජනතාව
  - කම්කරු පන්තිය
  - වෙළෙන්දන්
  - ඉංජිනේරුවන්
  - විවිධ වෘත්තීන්ට අයත් පිරිස් සිටි බව
  - ස්ත්‍රී, පුරුෂ දෙපක්ෂය ම ආභරණ පැළඳීම
  - විනෝදාස්වාදය සඳහා විවිධ ක්‍රීඩා, නැටුම්, ගැයුම්, මල්ලවපොර වැනි දෑ පැවති බව



ඡායාරූපය 8.6.14 ආභරණ

**පාලන කටයුතු**

- ප්‍රබල පූජක පන්තියක් සිටි බව සහ එම පිරිස් විසින් පාලන කටයුතු මෙහෙය වන්නට ඇති බව.
- ප්‍රභූ පාලනයක් හා නාගරික පාලන ක්‍රමයක් පැවති බව.

**ආගමික ඇදහිලි හා විශ්වාස**

- ජගන්මාතා වන්දනය
- වෘක්ෂ වන්දනය
- ජලය පිදීම පැවති බව



ඡායාරූපය 8.6.15 මව් දෙවඟන (ටෙරාකොටා මූර්තියකි)

- වසර 2000කට අධික ජගන් මාතාවගේ ටෙරාකොටා මූර්ති හමු වී ඇත.
- සෑම නිවසක ම ජගන්මාතා වන්දනය සිදු කර ඇත.
- ඇය සශ්‍රීකත්වය, සෞභාග්‍ය සංකේතවත් කර ඇත.

- විවිධ ඉරියව්වලින් යුතු ජගන්මාතා මූර්ති හමු වී ඇත.
- ඇසතු, සියඹලා හා නුග ගස දේවත්වයෙන් වන්දනාමාන කර ඇත.
- ජලය පිදීම හරප්පා වාසීන්ගේ ආගමික කටයුත්තක් ලෙස පැවත ඇත.

**කලාව**



ඡායාරූපය 8.6.16

- විවිධ ආභරණ
- ක්‍රීඩා භාණ්ඩ, විවිධ සත්ත්ව රූප

- මෙහෙන්ජොදාරෝවෙහි හමු වූ පුරුෂ උඩුකය දැක්වෙන ප්‍රතිමාව හා නලඟන රූපය



ඡායාරූපය 8.6.17



ඡායාරූපය 8.6.18

- මෙම නිර්මාණ සඳහා ගල්, මැටි, ලෝහ ආදි අමුද්‍රව්‍ය භාවිත කිරීම.

**ඉහත විෂය කරුණු ආවරණය වන සේ සිසුන්ට තොරතුරු රැස් කර ගැනීමට උපදෙස් දී රචනා තරගයක් පවත්වන්න.**

- මෙය කේවල ක්‍රියාකාරකමක් ලෙස සිදු කරන්න.
- ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ තොරතුරු ඇසුරින් රචනාවක් ලිවීමට සිසුන් යොමු කරන්න.
- රචනය ලිවීමට සතියක කාලයක් ලබා දෙන්න.
- රචනාව ලිවීම ස්වාධීන ව සිදු කරන ලෙස උපදෙස් ලබා දෙන්න.
- රචනා අතරින් වඩාත් නිර්මාණශීලී හා සාර්ථක ම රචනා තෝරා ඒවා සෙසු අයට අධ්‍යයනය සඳහා යොමු කරන්න.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

- ඉන්දු නිම්න ශිෂ්ටාචාරය පිළිබඳ තොරතුරු විස්තර කරයි.
- ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ විශිෂ්ටත්වය අගයයි.
- ශිෂ්ටාචාරයේ පෞඪත්වය මතුවන පරිදි රචනාව ගොඩ නගයි
- නිවැරැදි ව තොරතුරු ඉදිරිපත් කරයි.
- ස්වාධීන ව රචනාව ලියයි.
- වඩාත් නිර්මාණශීලී ව රචනාව ගොඩනගයි.